# සං ඥා ප න ය. PREFACE.

## සූ ර්‍ය ශ ත ක ය.

මෙය ක්‍රි. ව. 600 දී පමණ ඉන්දියාවේ විසූ මයූර නම් පණ්ඩිතයා විසින්, තමණ්ට වැළඳි කුෂ්ඨරෝගයෙන් සුවලබනු පිණිස සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාට ස්තුතිවශයෙන් රචනා කරණලද සංස්කෘත භාෂාමය විශිෂ්ට කාව්‍යයකි. මෙතෙම හිඋඑන් ට්ෂිඅං න් නැති ප්‍රසිඩ චීන මහණුන්වහන්සේ ඉන්දියාවේ සංචාරණයකළ කාලයෙහි (එනම් ක්‍රි. ව. 629 සිට 645 දක්වා කාලයෙහි) රාජ්‍යයකළ ශ්‍රීහර්‍ෂ රජු දවස විසූ 'හර්‍ෂචරිත', 'කාදම්බරී,' 'චණ්ඩිකාශතක' ආදි ග්‍රන්ථ රචනාකළ බාණ නම් පණ්ඩිතයාගේ මාමා (ස්ත්‍රීගේ පියා) විය.

101 වෙනි ශ්ලෝකයෙන් මේ ග්‍රන්ථය හැදෑරීමෙන් ලැබියහැකි ඵලද, ඊලඟ ශ්ලෝකයෙන් රශ්මිස්තෝත්‍ර ආදි වශයෙන් ග්‍රන්ථවිභාගයද කියනලද්දුහ.

මීට කරණලද සිංහල සන්නයේ කර්තෘ ආදිය අවසාන වාක්‍යයෙන් ප්‍රකාශිතයි. එතුමා ශක වර්‍ෂ 1200 දී පමණ ලක්දිව වැඩවිසූයේය. විමුක්තිසඞ්ග්‍රහවාවසානයෙහි සඳහන්වූ "තර්කව්‍යාකරණ ඡන්දෝනිඝණ්ටුවේ ජ්‍යෝතිෂය යනාදි බාහිර ශාස්ත්‍රයෙහි හා සූත්‍රාභිධර්‍මවිනය සඞ්ඛ්‍යාත පිටකත්‍රය ධර්‍මපාරාවාර පාරප්‍රාප්ත විල්ගම්මූල මහා ස්ථවිර යන්සේ" නම් මුන්වහන්සේ බැව් පෙණේ.

හින්දුආගමේ ප්‍රකාර සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා නම් කාශ්‍යප අදිති යන දෙදෙනාගේ පුත්‍රයාවේ. ඔහුගේ රථාචාර්‍ය්‍යතෙම වරුණ නම් වේ. ඔහුගේ රථයෙහි අශ්වයෝ සත් දෙනෙක් යොදනු ලැබෙත්. සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාට සියලුදේම පෙණේ, මනුෂ්‍යයන්ගේ වැඩ අවැඩ නිතර පරීක්ෂාකරයි. එතෙම සූර්‍ය්‍යවංශයේ මුල් රජවූ වෛවස්වත මනුගේ පියාවේ.

A. M. G.

# සූර්‍ය්‍ය ශතකය.

**නමස්තස්සෙම භගවතො'හ්‍රතො සම්මාසම්බුද්ධාය.**

---

නත්වාර්කබන්ධුමාදිත්‍යශතකං නිජභාෂයා
විවෘණෝමි මයූරෙකෘතම් පාඨශොධනපූර්වකම්.

අර්කබන්ධුං, සූර්‍ය්‍යවංශොද්භූත හෙයින් අර්කබන්ධුනම්වූ සර්වඥයන්වහන්සේ; නත්වා, කායාදි මාරත්‍රයෙන් සකසා වැඳ; මයූරෙකෘතම්, මයූරනම් මහාකවිහු විසින් විරචිතවූ; ආදිත්‍යශතකං, සූර්‍ය්‍යස්තොත්‍රශතකය; පාඨශොධනපූර්වකම්, අව්‍යුත්පන්න ලෙඛකයන්ගේ ප්‍රමාදයෙන් ජනිත විරුද්ධපාඨයන් ශුද්ධ කිරීම් පූර්වකොට; නිජභාෂයා, ස්වකීයවූ සිංහලදෙශ භාෂායෙන්; විවෘණෝමි, අර්ථවිවරණය කෙරෙම්.

---

(1) ජම්භාරාතීභකුම්භොද්භවමිව දධතඃ සාන්ද්‍රසින්දූරරෙණුං
රක්තාඃ සික්තාඉවෞඝෛරුදයගිරිතටීධාතුධාරාද්‍රවස්‍ය,
ආයාන්ත්‍යා තුල්‍යකාලං කමලවනරුචෙවාරුණාවොවිභූත්‍යෛ
භූයාසුර්භාසයන්තො භුවනමභිනවා භානවො භානවීයාඃ.

භානවීයාඃ භානවො වොවිභූත්‍යෛ භූයාසුඃ, යනු මෙහි ක්‍රියාකාරක සදසම්බන්ධයි. භානවීයාඃ භානවඃ, හිරුගේරශ්මිහු; වඃ, තොපට; විභූත්‍යෛ, සම්පත්තිය පිණිස; භූයාසුඃ, වෙත්වා; කෙබඳුවූ සූර්‍ය්‍ය රශ්මිහුද යත්; ජම්භාරාති, ජම්භනම් අසුරයාට ශත්‍රු හෙයින් ජම්භාරාතිනම්වූ ඉන්ද්‍රයාට වාහනවූ; ඉභ, හස්තිහුගේ හෙවත් ඓරාවණයාගේ; කුම්භොද්භවම්, මස්තකයෙන් උද්භවය ඇති හෙවත් කුම්භස්ථලයෙන් පහළවූ; සාන්ද්‍ර, ඝනවූ; සින්දූරරෙණුං, සිනිපිට්ටරජස්; දධතඉව, දරන්නවුන්වැනිවූ; උදයගිරි, උදයාඛ්‍යවූ පූර්වපර්වතයාගේ; තටී, උන්නතප්‍රදෙශයෙහි; ධාතු, ගෛරිකමනඃශිලාදිධාතූන්ගේ හෙවත් ශෛලාවයවයන්ගේ; ධාරාද්‍රවස්‍ය, ධාරාරූපවූ ද්‍රවයාගේ; සඞ්ඝෛඃ, ඝනවහැසුනාවූ; ඔඝෛඃ, ප්‍රවාහයෙන්; රක්තාඉව, රඳනලද්දවුන් වැනිවූ; තුල්‍යකාලං, තමාගේ උද්භවයහාසමකාලවම; ආයාන්ත්‍යා, එන්නාවූ; කමලවනරුචා, පද්මෂණ්ඩයන්ගේ කාන්තිය කරණකොටගෙණ; අරුණාඉව, රත්පැහැඇතියවුන් වැනිවූ; භුවනම්, ජගත්‍රය; භාසයන්තඃ, බබුලුවන්නාවූ හෙවත් ඒකාලොකකරන්නාවූ; භානවීයාඃ, සූර්‍ය්‍යදෙවපුත්‍රයා සම්බන්ධිවූ; අභිනවාඃ, අලුත්වූ; භානවඃ, රශ්මිහු හෙවත් බාලාර්ක කිරණයෝ; වඃ, තොපට; විභූත්‍යෛ, ත්‍රිවර්ගසම්පත්තිය පිණිස; භූයාසුඃ, වෙත්වා හෙවත් පැමිණෙත්වා.

(2) භක්තිප්‍රහ්වාය දාතුං මුකුලපුටකුටීකොටරක්‍රොඩලීනාං
ලක්ෂ්මීමාක්‍රෂ්ටුකාමා ඉව කමලවනොද්ඝාටනං කුර්වතෙ යෙ,
කාලාකාරාන්ධකාරානනපතිතජගත්සාධ්වසධ්වංසකල්‍යාඃ
කල්‍යාණං වඃ ක්‍රියාසුඃ කිසලයරුචයස්තෙ කරා භාස්කරස්‍ය.

භක්තිප්‍රහ්වාය, සෙවනය පිණිස අවනතවූ සත්වයාට; දාතුං, දෙන්ට; මුකුලපුට, පද්මකුඩ්මලත මැති; කුටීකොටරක්‍රොඩ, කුටිකාකුහරාභ්‍යන්තරයෙහි; ලීනාං, ඇලීඋන්නාවූ; ලක්ෂ්මීම්, ශ්‍රීකාන්තාව;

ආක්‍රෂ්ටුකාමාඃඉව, ආකර්ෂණය කරණු කැමැත්තාවුන්මෙන්; යෙ, යම් රශ්මිකෙණෙක්; කමලවනොද්ඝාටනං, පද්මවනවිකාශය හෙවත් පියුම්වන මිණිද්දිරීය; කුර්‍වතෙ, කෙරෙද්ද; කාලාකාරාන්ධකාර, කෘෂ්ණකාරවූ අන්ධකාරයාගේ; ආනන, මුඛයෙහි; පතිත, හුනුවාවූ; ජගත්, ලොකයාගේ; සාධ්වසධ්වංස, භයනැසීමෙහි; කල්‍යාඃ, දක්‍ෂවූ; කිසලයරුචයඃ, අභිනවපල්ලවයට බඳුවූ කාන්තිඇති; භාස්කරස්‍ය, ප්‍රභාකරයාගේ; තෙකරාඃ, ඒ රශ්මිහු නොහොත් හස්තයෝ; වඃ, තොපට; කල්‍යාණං, යහපතක්; ක්‍රියාසුඃ, කෙරෙත්වා

(3) ගර්භෙෂ්වම්භොරුහාණං ශිඛරිෂුච ශිතාග්‍රෙෂු තුල්‍යං පතන්තඃ
ප්‍රාරම්භෙ වාසරස්‍ය ව්‍යුපරතිසමයෙ චෛකරූපාස්තථෛව,
නිෂ්පර්‍ය්‍යායං ප්‍රවෘත්තාස් ත්‍රිභුවනභවනප්‍රාඞ්ගණෙ පාන්තු යුෂ්මා
නූෂ්මාණං සන්තතාධ්වශ්‍රමජමිව භෘශං බිභ්‍රතොබ්‍රධ්නපාදාඃ

අම්භොරුහාණාං, පද්මයන්ගේ; ගර්භෙෂු, අභ්‍යන්තරයෙහිද; ශිතාග්‍රෙෂු, තීක්‍ෂණවූ ශෘඞ්ගඇති; ශිඛරිෂුච, පර්‍වතයෙහිද; තුල්‍යං, සමව; පතන්තඃ, හෙන්නාවූ; තථෛව, එපරිද්දෙන්ම; වාසරස්‍ය, දිනයාගේ; ප්‍රාරම්භෙ, ආරම්භයෙහිද හෙවත් උදයකාලයෙහිද; ව්‍යුපරතිසමයෙ, අවසානකාලයෙහිද හෙවත් සන්ධ්‍යාකාලයෙහිද; එකරූපාඃ, එකාකාරවූ; ත්‍රිභුවනභවනප්‍රාඞ්ගණෙ, තුන්ලෝගෙමිදුලෙහි; නිෂ්පර්‍ය්‍යායං ප්‍රවෘත්තාඃ, අවිද්‍යමාන ක්‍රමව පැවතුම් ඇත්තාවූ හෙවත් පිළිවෙළක් නැතිව ඇවිදිනාවූ; සන්තතාධ්වශ්‍රමජම්ඉව, අවිච්ඡින්නවූ මාර්ගශ්‍රමයෙන් ජනිතවූවාක් වැනිවූ; ඌෂ්මාණං, උෂ්ණත්වය; භෘශං, අත්‍යර්ථයෙන්; බිභ්‍රතඃ, දරන්නාවූ; බ්‍රධ්නපාදාඃ, සූර්‍ය්‍යාගේ රශ්මිහුද්‍යොහෝ නොහොත් පාදයෝ; යුෂ්මාන්, තොප; පාන්තු, රක්‍ෂාකෙරෙත්වා (සෙස්සන්ගේ පාදයෝ තිලිගුත්තණඇති මොලොක් බිම යම්සේ අනායාසයෙන් පතිතවෙද්ද එපරිද්දෙන් අකුරු පහණ ඇති බිම යේහෙන් නොපවතිද්ද එලෙස නොව සූර්‍ය්‍යපාදයෝකලී පියුම්ගැබෙහිත් තියුණු ශිඛරඇති පර්‍වතයෙහිත් එකාකාරයෙන් පවතිති තවද ගමන් යන පථිකයාගේ පාදයෝ උදෑසන්වේලේ යම්සේද සවස්වේලේ එපරිද්දෙන් නොවෙද්ද එලෙස නොව සූර්‍ය්‍යපාදයෝවූකලී උදයකාලයෙහිත් සන්ධ්‍යාකාලයෙහිත් එකාකාරව පවතිති තවද සෙස්සවුන්ගේ පාදයෝ භවනාඞ්ගණභූමියෙහි ක්‍රමයෙන් වරින්වර පවතිද්ද එලෙස නොව සූර්‍ය්‍යපාදයෝවනාහි ත්‍රිභුවන භවනාඞ්ගණයෙහි ක්‍රම විභාගයක් නැතිව පවත්නාහුය යනුභාවයි

(4) ප්‍රභ්‍රශ්‍යත්‍යුත්තරීයත්විෂි තමසි සමුද්වීක්‍ෂ්‍ය වීතාවෘතීන් ප්‍රාග්
ජන්තූංස්තන්තූන්‍යථා යානතනු විතනුතෙ තිග්මරොචිර්මරීචීන්,
තෙ සාන්ද්‍රීභූය සද්‍යඃ ක්‍රමවිශද දශාශාදශාලී විශාලං
ශශ්වත් සම්පාදයන්තොʼම්බරමමලමලං මඞ්ගලංවො දිශන්තු

තිග්මරොචිඃ, තීක්‍ෂ්ණාංශු ඇති සූර්‍ය්‍යතෙම; ප්‍රාක්, පළමුකොට; උත්තරීයත්විෂි, උතුරු සළුවට බඳුවූ ශොභාඇති; නොහොත් උත්තරීයත්විෂි, උත්තරදිශායෙහිවූ දීප්තිඇති; තමසි, අන්ධකාරය; ප්‍රභ්‍රශ්‍යති, ගිලිහෙනකල්හි හෙවත් නැසෙනකල්හි; වීතාවෘතීන්, විගතාවරණ ඇති හෙවත් පහවූ පොරෝණය ඇති; ජන්තූන්, ලොකවාසී සත්ත්වයන්; සමුද්වීක්‍ෂ්‍ය, බලා; තන්තූන් යථා, වස්ත්‍රයක් වියනුකැමති පෙහෙරෙකු දිග්ගස්න හු රැසක්මෙන්; යාන්මරීචීන්, යම්රශ්මිකෙනෙකුන්; අතනු, ඝනකොට; විතනුතෙ, පතුරුවාද; සද්‍යඃ, එකෙණෙහිම; සාන්ද්‍රීභූය, අවිරලව හෙවත් ඝනව; ක්‍රම, අනුක්‍රමයෙන් හෙවත් පිළිවෙළින්; විශද, නිර්මලවූ; දශාශා, දසදික්නමැති; දශාලී, දශාපන්ති්න් හෙවත් දෑවළුපෙළින්; විශාලං, විස්තීර්ණවූ හෙවත් පුළුල්වූ; අම්බරම්, ආකාශයද්‍යොහෝ නොහොත් වස්ත්‍රය; අලං, අත්‍යර්ථයෙන්; ශශ්වත්, එකාවන්ව; අමලං, නිර්මලකොට; සම්පාදයන්තඃ, නිෂ්පාදනයකරන්නාවූ; තෙ (මරීචයඃ), ඒ ආදිත්‍යකිරණයෝ; වඃ, තොපට; මඞ්ගලං, අභිවෘද්ධියක්; දිශන්තු, දෙත්වා උත්තරීයද්විෂි යන්නෙහි දෙවැනි අර්ථපක්‍ෂයෙන් හැමකල්හිම හිරු සිටි දිගට උතුරුදිග අන්ධකාරය දීප්තිමත්වනබව හැගවූහු

(5) න්‍යක්කුර්වන්නොෂධීශෙ මුෂිතරුචි ශුචෙවෞෂධීඃ ප්‍රොෂිතාභා
භාස්වද්ග්‍රාවොද්ගතෙන ප්‍රථමමිව කෘතාභ්‍යුද්ගතිඃ පාවකෙන,
පක්ෂච්ඡෙදව්‍රණාසෘක්ස්‍රුතඉව දෘෂදො දර්ශයන් ප්‍රාතරද්‍රෙ
රාතාම්‍රස්තීව්‍රභානො රනභිමතනුද ස්තාද් ගභස්ත්‍යුද්ගමො වඃ

ඔෂධීශෙ, ඔෂධීන්ට නායකවූ චන්ද්‍රයා; මුෂිතරුචි, සිරුරැසින් පැහැරගත්නාලද ශොභා ඇතිවූ කල්හි හෙවත් විගතච්ඡායාඇතිකල්හි; ශුචාඉව, ශොකයෙන්මෙන්; ප්‍රොෂිතාභාඃ, විගතවූකාන්ති හෙවත් නෂ්ටවූ ශොභාඇති; ඔෂධීඃ, ඔෂධිතාරකාවන් නොහොත් ඖෂධවෘක්ෂයන්; න්‍යක්කුර්වන්, යටත් කරන්නාවූ; භාස්වද්ග්‍රාව, සූර්‍ය්‍යකාන්තපාෂාණයෙන්; උද්ගතෙන, නැඟගාවූ; පාවකෙන, වන්හීහු විසින්; ප්‍රථමම්, පළමුකොට; කෘතාභ්‍යුද්ගතිඃඉව, කරණලද පෙරගමන් ඇත්තක්හු වැනිවූ; ප්‍රාතරද්‍රෙඃ, උදය පර්වතයාගේ; පක්ෂච්ඡෙදව්‍රණ, ඉන්ද්‍රවජ්‍රයෙන් පක්ෂපත්‍ර සිඳීමෙන්වූ ව්‍රණයන්ගේ; අසෘක්, රුධිරය; ස්‍රුතඃ; වහනයකරන්නාවූ; දෘෂදඃ, පාෂාණයන්; දර්ශයන්නිව, දක්වන්නක්හුවැනිවූ; ආතාම්‍රඃ, හාත්පසින් රත් පැහැ ඇත්තාවූ; තීව්‍රභානොඃ, චණ්ඩකිරණයාගේ; ගභස්ත්‍යුද්ගමඃ, කිරණොද්ගමයතෙම; වඃ, තොපගේ; අනභිමතනුදෙ, අනිෂ්ටනාශය පිණිස; ස්තාත්, වේවා.

(6) ශීර්ණඝ්‍රාණාඞ්ඝ්‍රිපාණීන් ව්‍රණිභි රපඝනෛ ඝර්ඝරාව්‍යක්තඝොෂාන්
දීර්ඝාඝ්‍රාතා නඝෞඝෛඃ පුනරිව ඝටයත්‍යෙක උල්ලාඝයන්‍යඃ
ඝර්මාංශොස්තස්‍ය වො'න්තර්ද්විගුණ ඝනඝෘණා නිඝ්න නිර්විඝ්නවෘත්තෙඃ
දත්තාර්ඝාඃ සිද්ධසඞ්ඝෛ ර්විදධතු ඝෘණයඃ ශීඝ්‍රමංඝොවිඝාතම්

යඃඑකඃ, යම් අද්විතීයපුරුෂොත්තමයෙක්තෙම; ශීර්ණ, විනෂ්ටවූ; ඝ්‍රාණ, නාසිකාද; අඞ්ඝ්‍රි, පාදයන්ද; පාණීන්, හස්තයන්ද ඇත්තාවූ; ව්‍රණිභිඃ, ව්‍රණසහිතවූ; අපඝනෛඃ, අන්‍යවූ කර්ණාදි ශරීරාවයවයෙන් උපලක්ෂිතවූ; ඝර්ඝරාව්‍යක්තඝොෂාන්, ඝර්ඝරයන අස්ඵුටවූ ආතී ස්වරඇත්තාවූ, අඝෞඝෛඃ, පාපසමූහයෙන් නොහොත් දුඃඛරාශියෙන්; දීර්ඝාඝ්‍රාතාන්, අත්‍යර්ථයෙන් වළදනාලද්දාවූ සත්වයන්; උල්ලාඝයන්, ස්වස්ථකරන්නේ හෙවත් ලෙඩින් ගොඩනගන්නේ; පුනරිවඝටයති, නැවත උපදවන්නක්හුමෙන් කෙරේද; අන්තඃ, හෘදයාභ්‍යන්තරයෙහි; ද්විගුණ, දියුණුවූ; ඝන, මහත්වූ; ඝෘණා, කරුණාවෙන්; නිඝ්න, පරවශවූ; නිර්විඝ්නවෘත්තෙඃ, අන්තරායක් නැත්තාවූ පැවතුම් ඇති; තස්‍ය ඝර්මාංශොඃ, ඒ සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා සම්බන්ධිවූ; සිද්ධසඞ්ඝෛඃ, දෙවසමූහයා විසින්; දත්තාර්ඝාඃ, දෙනලද පුෂ්පතොයාදි පූජාද්‍රව්‍යයන් ඇති; ඝෘණයඃ, රශ්මීහු; වඃ, තොපගේ; අඞ්ඝොවිඝාතම්, පාපශමනය; ශීඝ්‍රම්, වහා; විදධතු, කෙරෙත්වා.

(7) බිභ්‍රාණො වාමනත්වං ප්‍රථමමථ තථෛවාංශවඃ ප්‍රාංශවො වඃ
ක්‍රාන්තාකාශාන්තරාලාස්තදනු දශදිශඃ පූරයන්තස්තතොපි,
ධ්වාන්තාදාච්ඡිද්‍ය දෙවද්විෂඉව බලිතො විශ්වමාශ්වශ්නුවානාඃ
කෘච්ඡ්‍රාණ්‍යුච්ඡ්‍රාය හෙලොපහසිතහරයො හාරිදශ්වා හරන්තු

ප්‍රථමම්, පළමුකොට; වාමනත්වං, බමිනුවය හෙවත් මිටිබව ද්‍යොහෝ නොහොත්; වාමනත්වං, වාමනාවතාර රූපය; බිභ්‍රාණාඃ, දරන්නාවූ; අථ, ඉක්බිත්තෙන්; තථෛව, එපරිද්දෙන්ම නොහොත්; තථෛව, එම වාමනරූපයෙන්ම; ප්‍රාංශවඃ, උස්වූවාහු; ක්‍රාන්ත, අක්‍රාන්තවූ හෙවත් ව්‍යාප්තවූ; ආකාශාන්තරාලාඃ, නභොමණ්ඩල ඇත්තාහු; තදනු, ඊටපසුව; දශදිශඃ, දශදිගුන්; පූරයන්තඃ, පුරන්නාවූ හෙවත් නොසිස්කරන්නාවූ; අංශවඃ, කොටස් ඇත්තාවූ; තතඃ, ඉක්බිත්තෙන්; අපි, නැවත අනිකක්දු ඇති; දෙවද්විෂඃ, දෙවශත්‍රුවූ; බලිතඃ ඉව, මහාබලි අසුරයා කෙරෙන් මෙන් නොහොත්; බලිතඃ, බලවත්වූ; ධ්වාන්තාත්, අන්ධකාරය කෙරෙන්; විශ්වම්, ජගත්‍රය; ආච්ඡිද්‍ය, පැහැරගෙණ; ආශු, ශීඝ්‍රව; අශ්නුවානාඃ, අනුභවකරන්නාවූ හෙවත් පැතිරෙන්නාවූ; උච්ඡ්‍රාය, උන්නතභාවයාගේ; හෙලා, ලීලා.

යෙන්; අපහසිත හරයඃ, අපහාසකරණලද හෙවත් අනාදරකරණලද විෂ්ණුහු ඇත්තාවූ; හාරිදශ්වාඃ, සූර්‍ය්‍යා සම්බන්ධිවූ රශ්මීහු හෙවත් දිවසකර කිරණයෝ; වඃ, තොපගේ; කෘච්ඡ්‍රාණි, දුඃඛයන්; හරන්තු, දුරුකෙරෙත්වා෴ හරිතඃ අශ්වාඃ යස්‍ය සඃ හරිදශ්වඃ සූර්‍ය්‍යඃ—හරිදශ්වස්‍ය ඉමෙ හාරිදශ්වාඃ, අශ්වාඃ කියා තද්ධිත වෘත්තියි෴ මෙහි විෂ්ණුහු විසින් වාමන රූපයෙන් බලිහුගෙන් ජගත්‍රය පැහැරගෙණ එක්කලෙක ආක්‍රමණය කරණලද; සූර්‍ය්‍යරශ්මීහුවූකලී හැමකල එලෙස ආක්‍රමණය කෙරෙත්යි යනු අපහාසකරණයි෴

(8) උද්ගාඪෙනාරුණිම්නා විදධති බහලං යෙ'රුණස්‍යාරුණත්වම්
මූර්ධොද්ධූතෞ ඛලීනක්ෂත රුධිරරුචො යෙ රථාශ්වානනෙෂු,
ශෛලානාං ශෙඛරත්වං ශ්‍රිතශිඛරිශිඛාස්තන්වතෙ යෙ දිශන්තු
ප්‍රෙඞ්ඛන්තඃ ඛෙ ඛරාංශොඃ ඛචිතදිනමුඛාස්තෙමයූඛාඃ සුඛං වඃ෴

යෙ, යම් හිරුරැස්කෙනෙක්; මූර්ධොද්ධූතෞ, ශිරඃ කම්පාකිරීමක් ඇතිකල්හි; රථාශ්වානනෙෂු, රථයෙහි යෙදූ අශ්වයන්ගේ මුඛයෙහි; ඛලීන, මුඛවලල්ලෙන් හෙවත් කඩියාලමින්වූ; ක්ෂත, වූණයෙහි; රුධිර, රක්තයට බඳුවූ; රුචඃ, ශොභාඇත්තාහු; උද්ගාඪෙන, ඝනවූ; ආරුණිම්නා, ලොහිතත්වයෙන්; අරුණස්‍ය, සූර්‍ය්‍යරථාචාර්‍ය්‍යයාගේ; බහලං, ඝනවූ; අරුණත්වම්, අරුණභාවය; විදධති, කෙරෙද්ද; ශ්‍රිත ශිඛරිශිඛාඃ, ඇසුරුකරණලද පර්වතශිඛරයන් ඇත්තාහු හෙවත් පර්වත ශිඛරවල සිටියාහු; ශෛලානාං, පර්වතයන්ගේ; ශෙඛරත්වං, ජපාපුෂ්පශෙඛර ශොභාව හෙවත් බඳුවදමලින්කළ මුදුන්මල්කඩ සුදුසු බව; තන්වතෙ, පතුරුවද්ද; ඛෙ, ආකාශයෙහි; ප්‍රෙඞ්ඛන්තඃ, බබලන්නාවූ; ඛචිතදිනමුඛාඃ, උජ්වලිතවූ දිවසාරම්භඇති හෙවත් දීප්තිමත්කරණලද උදයකාල ඇත්තාවූ; ඛරාංශොඃ, සූර්‍ය්‍යයාගේ; තෙමයූඛාඃ, ඒ කිරණයෝ; වඃ, තොපට; සුඛං, සැපයක්; දිශන්තු, දෙත්වා෴

(9) දත්තානන්දාඃ ප්‍රජානාං සමුචිත සමයාක්ලිෂ්ටසෘෂ්ටෛඃ පයොභිඃ
පූර්වාහ්ණෙ විප්‍රකීර්ණා දිශිදිශි විරමත්‍යහ්නි සංහාරභාජඃ,
දීප්තාංශොර්දීර්ඝදුඃඛප්‍රභවභවභයො දන්වදුත්තාරනාවො
ගාවො වඃ පාවනානාං පරමපරිමිතාං ප්‍රීතිමුත්පාදයන්තු෴

සමුචිතසමය, යොග්‍යකාලයෙහි හෙවත් වර්ෂාකාලයෙහි ද්‍රොහෝ නොහොත් ගොදෙහ කාලයෙහි; අක්ලිෂ්ට, අනායාසයෙන්; සෘෂ්ටෛඃ, හරණලද; පයොභිඃ, වර්ෂාජලයෙන් නොහොත් ක්ෂීරයන් කරණකොටගෙණ; ප්‍රජානාං, සත්වයන්ට; දත්තානන්දාඃ, දෙනලද ප්‍රීතිඇත්තාවූ; පූර්වාහ්ණෙ, පෙරවරුවේලෙහි; දිශිදිශි, ඒ ඒ දිශායෙහි; විප්‍රකීර්ණාඃ, විසිර පවත්නාවූ නොහොත් තණ කනපිණිස ඒ ඒ දිග විසිර ඇවිදින්නාවූ; අහ්නි, දිනය; විරමති, නවත්නාකල්හි හෙවත් සවස්වනකල්හි; සංහාර, හැකිළීම නොහොත් එකතැන්වීම; භාජඃ, සෙවිනාවූ; දීර්ඝදුඃඛ, අත්‍යන්තවූ දුඃඛයන්ට; ප්‍රභව, උත්පත්තිස්ථානවූ; භවභය, සංසාර භය නමැති; උදන්වත්, මහාසමුද්‍රයෙන්; උත්තාර, භක්තිමත් ජනයන් එතරවීමට; නාවඃ, නැව් හා සමානවූ; පාවනානාං, පවිත්‍රවස්තූන් අතුරෙන්; පරම්, උතුම්වූ; දීප්තාංශොඃ, දිලිහෙන රැස්ඇති හිරුගේ; ගාවඃ, රශ්මීහු ද්‍රොහෝ නොහොත් ගවයෝ; වඃ, තොපට; අපරිමිතාං, අනල්පවූ; ප්‍රීතිම්, සන්තොෂය; උත්පාදයන්තු, උපදවත්වා෴ මෙහි සූර්‍ය්‍යරශ්මීහු වැස්වස්වති යනු කවීන්ගේ සමයයි—මෙමකීහ කාලිදාශ මහාකවිහු රඝුවංශයෙහි, සහස්‍රගුණමුත්ස්‍රෂ්ටුමාදත්තෙහි රසාන්රවිඃයි෴

(10) බන්ධධ්වංසෛකහෙතුං ශිරසිනතිරසාබද්ධසන්ධ්‍යාඤ්ජලීනාං
ලොකානාං යෙ ප්‍රබොධං විදධති විපුලාම්භොජෂණ්ඩාශයෙව,
තෙ යුෂ්මාකං සවිත්තප්‍රතිමපෘථුතරප්‍රාර්ථනාකල්පවෘක්ෂාඃ
කල්පන්තාං නිර්විකල්පං දිනකරකිරණාඃ කෙතවඃ කල්මෂස්‍ය෴

යෙ, යම් රශ්මිකෙනෙක්; ශිරසි, මස්තකයෙහි; නතිරස, ප්‍රණාමරාගයෙන්; ආබද්ධ, හාත්පසින් බඳනාලද; සන්ධ්‍යාඤ්ජලීනාං, සන්ධ්‍යානමස්කාර පිණිසවූ කරපුටයන් ඇති; ලොකානාං, සත්වයන්

ගේද; විපුල, විස්තීර්ණවූ; අම්භොජෂණ්ඩාශයෙච, පද්මවනස්ථානයෙහිද; බන්ධ, රාත්‍රිලක්‍ෂණවූ බන්ධනයාගේ නොහොත් මුකුලයාගේ; ධ්වංස, විනාශයට; එකහෙතුඃ, අසහායකාරණවූ; ප්‍රබොධං, නිද්‍රාපගමය නොහොත් විකාශය; විදධති, කෙරෙද්ද; යුෂ්මාකං, පින්වත්වූ තොපගේ; ස්වචිත්ත, ස්වකීය චිත්තයා සම්බන්ධවූ; ප්‍රථිම, විස්තීර්ණතායෙන්; ප්‍රාථුතර, අතිශයින් බහුප්‍රකාරවූ; ප්‍රාර්ථිතා, ඉෂ්ටාශංසනාවට; කල්පවෘක්‍ෂාඃ, මනස්සඞ්කල්ප සාධකවූ කල්පවෘක්‍ෂයන් හා සදෘශවූ; තෙ දිනකරකිරණාඃ, ඒ දිවසකර කිරණයෝ; කල්මෂස්‍ය, පාපයට; කෙතවඃ, විනාශකාරණවූවාහු හෙවත් උත්පාතග්‍රහවූවාහු; නිර්විකල්පං, කල්පනාරහිතවූවහු; කල්පනානාං, නිෂ්පන්න කෙරෙත්වා.

(11) ධාරා රායො ධනායා පදි සපදි කර ලම්බභූතාඃ ප්‍රපාතෙ
තත්ත්වාලොකෛකදීපාස්ත්‍රිදිවපතිපුරඃ ප්‍රස්ථිතෙ වීථ්‍ය එව,
නිර්වාණොද්‍යොගියොගිප්‍රගමනිජතනුද්වාරි වෙත්‍රායමාණාස්
ත්‍රායන්තාං තීව්‍රභානොර්දිවසමුඛමුඛා රශ්මයඃ කල්මෂාද්වඃ

ධනායාපදි, ධනවිරහ සඞ්ඛ්‍යාත ආපදයෙහි හෙවත් දරිද්‍රවිපත්තියක් ඇතිකල්හි; රායඃ, ධනයාගේ; ධාරාඃ, වෘෂ්ටීන් වැනිවූ හෙවත් ධන වර්ෂා හා සදෘශවූ; ප්‍රපාතෙ, නරකාවාටයක් පැමිණිකල්හි; සපදි, එකෙණෙහි; කරලම්බභූතාඃ, හස්තාවලම්බවූ හෙවත් සූර්‍ය්‍යාලොකය හෙතුකොටගෙණ නරාවළෙහි පතිතනොවන සත්ත්වයන්ට අතලොඹුවැනිවූ; තත්ත්වාලොකෛකදීපාඃ, විද්‍යමාන වස්තු දර්ශනයට අසහාය ප්‍රදීපවූ; ත්‍රිදිවපතිපුරඃ ප්‍රස්ථිතෙ, ඉන්ද්‍රපුරප්‍රස්ථානයෙහිලා හෙවත් දෙවලොකයාත්‍රාවට; වීථ්‍ය එව, මාර්ගගමවූ; නිර්වාණොද්‍යොගි, මොක්‍ෂලාභයෙහි ප්‍රයත්නඇති; යොගි, යොගීපුරුෂවූ යති ජනයාගේ; ප්‍රගම, අපුනරාවෘත්ති වශයෙන් ප්‍රකෘෂ්ටගමනයට කාරණවූ; නිජතනුවාරි, ස්වකීය මූර්ත්ති නමැති වාරයෙහි හෙවත් සූර්‍ය්‍යමණ්ඩල නමැති මොක්‍ෂගමන වාරයෙහි; වෙත්‍රායමාණාඃ, වෙත්‍රලතායෂ්ටීන් මෙන් පවත්නාවූ හෙවත් වේවැල්කැට්ටු වැනිවූ; දිවසමුඛමුඛාඃ, කරණලද දිවසප්‍රාරම්භ ඇත්තාවූ; තීව්‍රභානොඃ, ප්‍රචණ්ඩකිරණයාගේ; රශ්මයඃ, කිරණයෝ; වඃ, තොප; කල්මෂාත්, පාපයෙන්; ත්‍රායන්තාං, රක්‍ෂාකෙරෙත්වා.

(12) ප්‍රාචි ප්‍රාගාචරන්ත්‍යා'නතිචිරමචලෙ චාරුචූඩාමණිත්වම්
මුඤ්චන්ත්‍යා රොචනාම්භඃ ප්‍රචුරමිව දිශාමුච්චකෛශ්චර්චනාය,
චාටූත්කෙඃ චක්‍රනාම්නාං සුචිර මචලෙලෛලොචනෛරර්ච්‍යමානාශ්
චෙෂ්ටන්තාං චින්තිතානාං මුචිතමචරමාශ්චණ්ඩරොචීරුචො වඃ

ප්‍රාචි අචලෙ, පූර්වපර්වතයෙහි හෙවත් උදයපර්වතයෙහි; ප්‍රාක්, පළමුකොට; අනතිචිරම්, ක්‍ෂණමාත්‍රයක්කල්; චාරු, දර්ශනීයවූ; චූඩාමණිත්වම්, පද්මරාගශිරොරත්නභාවය; ආචරන්ත්‍යඃ, ප්‍රකාශකරන්නාවූ; දිශාං, දිගුන්සම්බන්ධව; උච්චකෛඃ, අත්‍යර්ථයෙන් හෙවත් ප්‍රකටකොට; චර්චනාය, පහසින් ගන්වනු පිණිස; ප්‍රචුරම්, බොහෝවූ; රොචනාම්භඃ, ගොරොචනමිශ්‍රජලය; මුඤ්චන්ත්‍යඃ ඉව, හරණවුන්වැනිවූ; චක්‍රනාම්නාං, චක්‍රවාකපක්‍ෂීනයන්ගේ; චාටු, ප්‍රියකරණ විසින්; උත්කෛඃ, උත්කණ්ඨාවට පමුණුවනලද්දාවූ; අචලෛඃ, නිෂ්පන්දවූ හෙවත් ප්‍රීතියෙන් නිශ්චලවූ; ලොචනෛඃ, ඇසින්; සුචිරම්, බොහෝකල් හෙවත් අතිමාත්‍රව; අර්ච්‍යමානාඃ, පුදනුලබන්නාවූ හෙවත් දක්නාලබන්නාවූ; අචරමාඃ, පාශ්චාත්‍යනොවන්නාවූ හෙවත් උදයකාලයෙහිවූ; චණ්ඩරොචිඃ, චණ්ඩරොචිෂ්ණුහුගේ හෙවත් හිරුගේ; රුචඃ, දීප්තිහු; වඃ, තොපගේ; චින්තිතානාම්, චින්තිතාර්ථයන්ට හෙවත් චිත්තසංකල්පයන්ට; උචිතම්, සුදුසුසක්; චෙෂ්ටන්තාං, තැත්කෙරෙත්වා හෙවත් සම්පාදනය කෙරෙත්වා.

(13) එකං ජ්‍යොතිර්දෘශෞ ද්වෙ ත්‍රිජගති ගදිතාන්‍යබ්ජජාස්‍යෛශ්චතුර්භිර්
භූතානාං පඤ්චමං යාන්‍යලමෘතුෂු තථා ෂට්සු නානාවිධානි,
යුෂ්මාකං තානි සප්තත්‍රිදශමුනිනුතාන්‍යෂ්ටදිග්භාඤ්ජි භානොර්
යාන්ති ප්‍රාහ්ණෙ නවත්වං දශ දධතු ශිවං දීධිතීනාං ශතානි

යානි, යම්හිරුරැස්කෙනෙක්; ඒකංජ්‍යොතිඃ, එකමුඤුනාලොකද; දෘශ්‍යෞගෙ; දෘෂ්ටිදෙනද; ත්‍රිජගති, ත්‍රෛලොක්‍යයෙහි; චතුර්භිඃ, චතුර්විධවූ; අබ්ජජාස්‍යෛඃ, බ්‍රහ්මමුඛයෙන්; ගදිතානි, කියනලද්දාහුද; භූතානාං, පෘථිව්‍යාදි භූතයන් අතුරෙන්; පඤ්චමං, පස්වැනි තෙජස් නම්වෙද්ද; තථා, එසේම; අලම්, සම්පූර්ණව; ෂට්සුඍතුෂු, වසන්තග්‍රීෂ්මාදි ෂට්ඍතුයෙහි; නානාවිධානි, අනෙකප්‍රකාරවෙද්ද; සප්ත, මරීච්‍යාදි සප්තවිධවූ; ත්‍රිදශමුනි, දෙවර්ෂීන් විසින්; නුතානි; ස්තුතිකරණලද්දාහුද; අෂ්ටදිග්භාඤ්ජි, පූර්ව දක්ෂිණාදි අෂ්ටදිගුන් සෙව්නාහුද; ප්‍රාහෙණ, ප්‍රාතඃකාලයෙහි; නවත්වං, නවත්වයට නොහොත් අභිනවභාවයට; යාන්ති, පැමිණෙද්ද; තානොඃ, හිරුගේ; දීධිතීනාං, රශ්මීන්සම්බන්ධිවූ; තානි දශශතානි, ඒ දශශතයෝ හෝ සහස්‍රය; යුෂ්මාකං, තොපට; ශිවං, යහපතක්; දධතු (කුර්වන්තු), කෙරේත්වා

(14) ආවෘත්තිභ්‍රාන්තවිශ්වාඃ ශ්‍රමමිව දධතඃ ශොෂිණඃ ස්වොෂ්මණෙව,
ග්‍රීෂ්මෙ දාවාග්නිතප්තා ඉව රසමසකෘද්යෙ ධරිත්‍ර්‍යා ධයන්ති,
තෙ ප්‍රාවෘෂ්‍යාත්තපානාතිශයරුජ ඉවොද්වාන්තතොයා හිමර්තෞ
මාර්තණ්ඩස්‍යාප්‍රචණ්ඩාශ්චිරමශුභභිදෙ'භීෂවොවො භවන්තු

යෙ, යම් කිරණකෙනෙක්; ආවෘත්තිභ්‍රාන්තවිශ්වාඃ, කරකැවී ඇවිදිනාලද සියලුලොව ඇත්තාහුද (එහෙයින්ම); ශ්‍රමම්, ආයාසය; දධතඉව, දරන්නවුන් මෙන්; ස්වොෂ්මණා, ස්වකීය උෂ්ණයෙන්; ශොෂිණඉව, වියලෙන්නාවුන්මෙන්; ග්‍රීෂ්මෙ, ග්‍රීෂ්මකාලයෙහි; දාවාග්නි; ලැව්ගින්නෙන්; තප්තාඉව, තැවෙනලද්දවුන්මෙන්; ධරිත්‍ර්‍යාඃ, පෘථිවියගේ; රසම්, ජලය; අසකෘත්, ක්ෂණක්ෂණයෙහි; ධයන්ති, පානය කෙරෙද්ද; ආත්තපානාතිශය රුජඉව—ආත්තපානාතිශය, ලෞල්‍යපානයාගේ අතිශයින් (හෙවත් ආශාවෙන් අධිකකොට පීමෙන් ජනිතවූ); රුජඉව, අජීර්ණවෙදනා ඇත්තවුන්මෙන්; ප්‍රාවෘෂි, වර්ෂාකාලයෙහි; උද්වාන්තතොයාඃ, උද්ගාරය කරණලද (හෙවත් වමනය කරණලද) ජලයඇත්තාහුද; හිමර්තෞ, හිම ප්‍රධානවූ ඍතුයෙහි හෙවත් හෙමන්තඍතුයෙහි; අප්‍රචණ්ඩාඃ, පවුරුෂයනැත්තාහු (හෙවත් මන්දප්‍රවෘත්ති ඇත්තාහුද); මාර්තණ්ඩස්‍ය, හිරුගේ; තෙ අභීෂවඃ, ඒ රශ්මිහු; චිරම්, බොහෝකාලයක්; වඃ, තොපගේ; අශුභභිදෙ, අවැඩ නැසීම පිණිස; භවන්තු, වෙත්වා

(15) තන්වානා දිග්වධූනාං සමධිකමධුරාලොකරම්‍යාමවස්ථා
මාරූඪප්‍රෞඪිලෙශොත්කලිතකපිලිමාලඞ්කෘතිඃ කෙවලෛව,
උජ්ජෘම්භාම්භොජනෙත්‍රද්‍යුතිනි දිනමුඛෙ කිඤ්චිදුද්භිද්‍යමානා
ශ්මශ්‍රුශ්‍රෙණීව භාසාං දිශතු දශශතී ශර්ම ඝර්මත්විෂොවඃ

දිග්වධූනාං, දිග්නමැති කාන්තාවන්ගේ; සමධිකමධුරාලොක, අත්‍යර්ථයෙන්මධුරවූ ආලොකනයෙන් හෙවත් අත්‍යර්ථ මධුරවූ නිරීක්ෂණයට; රම්‍යාම්, සිත්කළුවූ; අවස්ථාම්, අවස්ථාව හෙවත් සුඛ විශිෂ්ටවූ කාලය; තන්වානා, විස්තාරයකරන්නාවූ හෙවත් පතුරුවන්නාවූ; උජ්ජෘම්භාම්භොජනෙත්‍රද්‍යුතිනි—උජ්ජෘම්භ, විකසිතවූ; අම්භොජනෙත්‍රද්‍යුතිනි, පද්මයන්ම නෙත්‍රශොභාකොටඇති; දිනමුඛෙ, දිව ආරම්භයෙහි දොහෝ නොහොත් දිනයාගේ මුඛයෙහි; කෙවලාඑව, එකම; ආරූඪප්‍රෞඪිලෙශොත්කලිතකපිලිමාලඞ්කෘතිඃ—ආරූඪ, පැමිණනලද; ප්‍රෞඪි; ප්‍රෞඪභාවයාගේ හෙවත් තරුණභාවයාගේ; ලෙශ, අල්පයකින්; උත්කලිත, හරණලද; කපිලිමා පිඞ්ජරත්වය හෙවත් රත්වන් බව ඇති; අලඞ්කෘතිඃ, අලඞ්කාරද්‍රව්‍ය භූෂණවූ; ශ්මශ්‍රුශ්‍රෙණීව, මුඛරොම පඞ්ක්තියක්මෙන් හෙවත් දැළිරෙදක්මෙන්; කිඤ්චිත්, මඳක්; උද්භිද්‍යමානා, පහලවන්නාවූ; ඝර්මත්විෂඃ, හිරුගේ; භාසාං, රශ්මීන්සම්බන්ධිවූ; දශශති, දහස; වඃ, තොපට; ශර්ම, සැපයක්; දිශතු, ප්‍රදානයකෙරේවා

(16) මෞලීන්දෞ මෛෂ මොෂීද් ද්‍යුතිමිති වෘෂභාඞ්කෙන යඃ ශඞ්කිතෙව
ප්‍රත්‍යග්‍රොද්ඝාටිතාම්භොරුහකුහරගුහාසුස්ථිතෙනෙව ධාත්‍රා,
කෘෂ්ණෙනාධ්වාන්ත කෘෂ්ණස්වතනුපරිභවත්‍රස්නුනෙව ස්තුතො'ලං
ත්‍රාණාය ස්තාත් තනීයානපි තිමිරරිපොඃ ස ත්විෂාමුද්ගමොවඃ

එෂඃ, මේ කිරණෝද්ගමයතෙම; (මෙ, මාගේ;) මෞලි, මස්තකයෙහි; ඉන්දොඃ, චන්ද්‍රයාගේ; ද්‍යුතිම්, ශෝභාව; මාමමාපීද්ඉති, පැහැරනොගත්තේ නම් යෙහෙකැයි යන මේ හෙතුයෙන්; ශඞ්කිතාඉව, ශඞ්කාඇතියක්හුවැනිවූ; වෘෂභාඞ්කෙන, වෘෂධ්වජයා විසින් හෙවත් මහදෙවියා විසින්; අලං, අත්‍යර්ථයෙන්; ස්තුතඃ, ස්තොත්‍රකරණලද්දවූ; ප්‍රත්‍යග්‍රොද්ඝාටිතාම්භෝරුහකුහරගුහාසුස්ථිතෙන—ප්‍රත්‍යග්‍ර, අභිනවව; උද්ඝාටිත, විකාශකරණලද; අම්භෝරුහ, පද්මයාගේ; කුහර, අභ්‍යන්තර නමැති; ගුහා, ගුහායෙහි; සුස්ථිතේනෙව, යෙහෙන්සිටියාක්වැනිවූ; ධාත්‍රා, මහාබ්‍රහ්මයා විසින්; අලං, අත්‍යර්ථයෙන්; ස්තුතඃ, ස්තුතිකරණලද්දවූ; ධ්වාන්ත, අන්ධකාරයමෙන්; කෘෂ්ණ, කළුවූ; ස්වතනු, ස්වකීයවූ දෙහයට; පරිභව, මැඩීමෙන් හෙවත් කළුබැවින් අන්ධකාරයයි තමාත් මර්දනයකෙරේද්‍යෙහෝයි; ත්‍රසනුනාඉව, භයගන්නාසුලු ලක්හුවැනිවූ; කෘෂ්ණෙන, විෂ්ණුහු විසින්; අලං, අත්‍යර්ථයෙන්; ස්තුතඃ, ස්තුතිකරණලද්දවූ; තනීයාංසාපි, ඉතාසූක්ෂමවූද; තිමිරරිපොඃ, අන්ධකාරශත්‍රුහුගේ හෙවත් සිරුගේ; ත්විෂාම්, රශ්මීන්ගේ; යඃඋද්ගමඃ, යම් උදාවීමෙක් ඇද්ද; සඃ, ඒතෙම; වඃ, තොපගේ; ත්‍රාණය, රක්ෂණයපිණිස; ස්තාත්, වේවා.

(17) විස්තීර්ණං ව්‍යොම දීර්ඝාඃ සපදි දශදිශොව්‍යස්තවෙලාම්භසො‘බ්ධීන්
කුර්වද්භිර්දෘශ්‍ය නානානගනගරනගා භොගපෘථ්වීඤ්ච පෘථ්වීම්,
පද්මින්‍යුච්ඡ්වාස්‍යතෙ යෛරුෂසි ජගදපි ධ්වංසයිත්වා තමිස්‍රා
මුස්‍රා විස්‍රංසයන්තු ද්‍රුතමනභිමතං තෙ සහස්‍රත්විෂොවඃ.

ව්‍යොම, ආකාශය; විස්තීර්ණංකුර්වද්භිඃ, විශාලකරන්නාවූ; සපදි, එකෙණෙහි; දශදිශඃ, දශදිගුන්; දීර්ඝාඃකුර්වද්භිඃ, දික්කරන්නාවූ; අබ්ධීන්, සප්තමහාසමුද්‍රයන්; ව්‍යස්ත, ප්‍රකාශකරණලද; වෙලාම්භසඃ, වෙලාස්වරූපවූ ජලවිකාරඇත්තවුන්; කුර්වද්භිඃ, කරන්නාවූ; පෘථ්වීං, පොළොව; දෘශ්‍ය, දක්නාලබන්නාවූ; නානා, අනෙකප්‍රකාරවූ; නග, වෘක්ෂයෝය; නගර, පුරයෝය; නග, පර්වතයෝය යන මොවුන්ගේ; ආභොග, විස්තාරයෙන්; පෘථ්වීඤ්ච, විස්තීර්ණවූවාද; කුර්වද්භිඃ, කරන්නාවූ; යෛඃ, යම් හිරුරැස්කෙණෙකුන් විසින්; තමිස්‍රාම්, රාත්‍රිය; ධ්වංසයිත්වා; විධ්වංසනයකොට; උෂසි, ප්‍රභාතකාලයෙහි; පද්මිනී, පියුම්විලද; ජගදපි, ජගත්‍රයද; උච්ඡ්වාස්‍යතෙ, නෙත්‍රප්‍රබොධකරණුලැබේද; සහස්‍රත්විෂඃ, සහස්‍රකිරණයාගේ; තෙඋස්‍රාඃ, ඒකිරණයෝ; ද්‍රුතං, ශීඝ්‍රව; වඃ, තොපගේ; අනභිමතං, පාපය හෙවත් නපුර; විස්‍රංසයන්තු, විධ්වංසනයකෙරෙත්වා.

(18) අස්තව්‍යස්තත්වශූන්‍යො නිජරුචිරනිශානශ්වරඃ කර්තුමීශො
විශ්වං වෙශ්මෙව දීපඃ ප්‍රතිහතතිමිරං යඃ ප්‍රදෙශස්ථිතො‘පි,
දික්කාලාපෙක්ෂයාසෞ ත්‍රිභුවනමටතස්තිග්මභානොර්නවාඛ්‍යාං
යාතඃ ශාතක්‍රතව්‍යාං දිශි දිශතු ශිවං සො‘ර්චිෂාමුද්ගමොවඃ.

අස්තව්‍යඃ, විෂ්ණුහුවිසින් ස්තුතිකටයුතුවූ; නොහොත්, අස්තව්‍යඃ, කිසිවක්හුවිසින් ස්තොත්‍රනොකටහැක්කාවූ; තත්වශූන්‍යඃ, නිත්‍යබැවින් සංඛ්‍යාදිතත්වපදාර්ථ රහිතවූ; නොහොත්—අස්තව්‍යස්තත්වශූන්‍යඃ—අස්ත, අස්තපර්වතයෙන්; ව්‍යස්තත්වශූන්‍යඃ, ව්‍යවහිතත්වයක්නැත්තාවූ හෙවත් උත්පාදවිනාශයක් නැත්තාවූ; නොහොත්, ප්‍රදීපපක්ෂයෙහි–අස්තව්‍යඃ, ස්තොත්‍රාර්හනොවන්නාවූ; තත්වශූන්‍යඃ, පරමාර්ථශූන්‍යවූ හෙවත් දීපයයි යන සංඥමාත්‍රයක් හෙයින් පරමාර්ථයෙන් අවිද්‍යමානවූ; නිජරුචිඃ, අවිනශ්වරවූදීප්තිඇති; අනිශානශ්වරඃ—අනිශා, නොරාත්‍රියෙහි; අනශ්වරඃ, නොනැසෙනසුලුවූ; නොහොත් ප්‍රදීපපක්ෂයෙහි—අනිජරුචිඃ, අනිත්‍යවූ රශ්මිඇති; නොහොත් අනිජරුචිඃ අනාත්මීයවූරශ්මිඇති—අනිශානශ්වරඃ, දහවල් දීප්තිනැතිහෙයින් දිවාභාගයෙහි නැසෙනසුලුවූ; වෙශ්ම, ගෘහය; ප්‍රතිහතතිමිරං කර්තුම්, එකතැන සිට නසනලද අන්ධකාරය ඇතිකරන්ට; ඊශඃ, සමර්ථවූ; දීපඉව, ප්‍රදීපයක්මෙන්; ප්‍රදෙශස්ථිතොපි, එක්ප්‍රදෙශයක සිටියේද; විශ්වං, සියලුලොව; ප්‍රතිහතතිමිරං කර්තුං, නසනලද අන්ධකාර ඇතිකරන්ට; ඊශඃ, සමර්ථවූ; ශාතක්‍රතව්‍යංදිශි, ඉන්ද්‍රදිශාවෙහිලා; නවාඛ්‍යාං, අභිනවබවට;

යාතඃ, ගියාවූ; දික්කාලාපෙක්ෂයා; දිශාකාලවිභාගයෙහි අපෙක්ෂාවෙන්; ත්‍රිභුවනම්, ත්‍රෛලොක්‍යය; අටතඃ, භ්‍රමණයකොට ඇවිදිනාවූ; තිග්මභානොඃ, තීක්ෂණරශ්මිහුගේ; අර්චිෂාම්, රශ්මීන්ගේ; යඃඅසෞ උද්ගමඃ, යම් මේ පහලවීමෙක් ඇද්ද; සඃ, එතෙම; වඃ, තොපට; ශිවං, ශොභනයක්; දිශතු, දේවා෴

(19) මාගාන්ම්ලානිං මෘණාලීමෘදුරිති දයයෙවාප්‍රවිෂ්ටො'හිලොකං
ලොකාලොකස්‍ය පාර්ශ්වෙ ප්‍රතපති න පරං යස්තදාඛ්‍යාර්ථමෙව,
ඌර්ධ්වං බ්‍රහ්මාණ්ඩඛණ්ඩ ස්ඵුටනභයපරිත්‍යක්තදෛර්ඝ්‍යොද්‍යුසීම්නි
ස්වෙච්ඡාවශ්‍යාවකාශාවධිරවතු ස වස්තාපනොරොචිරොඝඃ෴

යඃ, යම් කිරණයෙක්තෙම; මෘණාලීමෘදුඃ, නෙලුම්දළිරුසක්මෙන්කොමලවූ (සජීවගීයා); ම්ලානිං, ම්ලානභාවයට; මාගාදිති, නොපැමිණේවයි යන; දයයාඉව, කරුණායෙන්මෙන්; අහිලොකං, පාතාල ලොකයට; අප්‍රවිෂ්ටඃ, ප්‍රවිෂ්ටනූවූයේද; ලොකාලොකස්‍ය, චක්‍රවාලපර්වතයාගේ; පරංපාර්ශ්වං, අපරපාර්ශ්වය; තදාඛ්‍යාර්ථමෙව, ඒ චක්‍රවාටපර්වතයාගේ ඇතුලෙහි ආලොකයත් පිටින් ඇතිහෙයින් ලොකාලොක යයි යන අර්ථානුගතසංඥව පිණිසම; නප්‍රතපති, නොතවාද හෙවත් ආලොකනොකරේද; ඌර්ධ්වං, ඌර්ධ්වලොකයෙහි; බ්‍රහ්මාණ්ඩඛණ්ඩ, බ්‍රහ්මාණ්ඩකපාලය; ස්ඵුටනභය, භෙදවෙයි යන භයින්; පරිත්‍යක්ත, හරණලද; දෛර්ඝ්‍යඃ, දීර්ඝතාව හෙවත් ආයතබවයඇත්තේද; ද්‍යුසීම්නි, දෙවලොකසීමායෙහි; ස්වෙච්ඡා, ස්වකීයවූ අපෙක්ෂාවට; වශ්‍යාවකාශ, වශගවූ අවකාශය; අවධිඃ, මස්කාදකොට ඇත්තාවූ; තාපනඃ, තපනයාසම්බන්ධවූ; සඃ, ඒ; රොචිරොඝඃ, දීප්තිරාශියතෙම; වඃ, තොප; අවතු, රක්ෂාකෙරේවා෴

(20) අශ්‍යාමඃ කාලඑකො නභවති භුවනාන්තො'පි වීතාන්ධකාරඃ
සද්‍යඃ ප්‍රාලෙයපාදෙ න විලයමචලශ්චන්ද්‍රමාශ්චාප්‍යුපෛති,
බන්ධස්සිද්ධාඤ්ජලීනාං නහි කුමුදවනස්‍යාපි යත්‍රොජ්ජිහානෙ
තත්ප්‍රාතඃ ප්‍රෙක්ෂණීයං දිශතු දිනපතෙර්ධාම කාමාධිකංවඃ෴

යත්‍ර, යම්තෙජසෙක්; උජ්ජිහානෙ, උද්ගතවනකල්හි; අශ්‍යාමඃ, විගතරාත්‍රිඇත්තේ නොහොත් පහවූකළුපැහැඇත්තේ; එකඃකාලඃ, එකදිවාභාගකාලයම; නභවති, වන්නේනොවෙයි; අපිතු, වැලිත්; වීතාන්ධකාරඃ, විගතවූඅන්ධකාරඇති; භුවනාන්තොපි, ලොකමණ්ඩලයද; අශ්‍යාමොභවති, නිර්මලවන්නේද; සද්‍යඃ, එකෙණෙහි; ප්‍රාලෙයපාදඃ, තුෂාරයන්පාදකොට ඇති; අචලඃ, පර්වතය හෙවත් හිමාල පර්වතයම; විලයමුපෛතින, ක්ෂයවීමටයන්නේ නොවෙයි; අපිතු, වැලිත්; ප්‍රාලෙයපාදඃ, තුෂාරකිරණ යන් ඇති; චන්ද්‍රමාශ්චාපි, චන්ද්‍රද; නවිලයමුපෛති, ක්ෂයවීමටයන්නේ නොවේද; සිද්ධාඤ්ජලීනාම්, සිද්ධයන්විසින් නමස්කාර පිණිස කරණලද කරපුටයන්ගේ; බන්ධොනහි, බන්ධනපමණෙක් නොවෙයි; වැලිත්—කුමුදවනස්‍යාපි, කුමුදවනයාගේද; බන්ධඃ, සංකොචයවේද; ප්‍රාතඃ, උදයකාලයෙහි; ප්‍රෙක්ෂණීයං, දර්ශනීයවූ; දිනපතෙඃ, හිරුහුගේ; තද්ධාම, ඒතෙජස; වඃ, තොපට; කාමාධිකං, අධිකවූ අභිමතාර්ථ යක්; දිශතු, ප්‍රදානයකෙරේවා෴

(21) යත්කාන්තිං පඞ්කජානාං නහරති කුරුතෙ ප්‍රත්‍යුතාධික්‍යරම්‍යාං
නොධත්තෙ තාරකාභාං තිරයති නිතරාමාශු යන්නිත්‍යමෙව,
කර්තුං නාලං නිමෙෂං දිවසමපි පරං යත්තදෙකං ත්‍රිලොක්‍යාඃ
චක්ෂුඃ සාමාන්‍යචක්ෂුර්විසදෘශමඝවිද්ධාස්වතඃ ස්තාත් මහොවඃ෴

යත්, යම්තෙජසෙක්; පඞ්කජානාං, පද්මයන්ගේ; කාන්තිං, ශොභාව; නහරති, සාමාන්‍යචක්ෂුසින් පැහැරනොගණීද; ප්‍රත්‍යුත, වැලිදු වනාහි; ආධික්‍යරම්‍යාං, අධිකභාවයෙන් මනොඥවූ ඒ පද්මකාන් තිය; කුරුතෙ, කෙරේද; යත්, යම්තෙජසෙක්; තාරකාභාං, කනීනිකාකාන්තිය හෙවත් ටිහිනිපැහැ ය; නොධත්තෙ, නොදරාද; නිතරාම්, අත්‍යර්ථයෙන්; ආශු, වහා; තාරකාභාං, නක්ෂත්‍රාලොකය; නිත්‍ය

මෙව, අනවරතයෙන්ම; නිරයනි (නිරස් කුරුතෙ), මුවහකරේද; යත්, යම්තෙජසෙක්; නිමෙෂංකර්තුම්, සාමාන්‍යචක්‍ෂුසමෙන් නිමෙෂයකරන්ට; නාලං, සමර්‍ථනොවේද; වැලිත්—දිවසමපි, දිවාභාගය මුළුල්ලෙහිත් අනිමෙෂභාවයට; පරං, සමර්‍ථද; එහෙයින්—සාමාන්‍යචක්‍ෂුර්විසදෘශම්, ලොකයාගේ සාමාන්‍යනෙත්‍රයට භින්නස්වරූප ඇති; ත්‍රිලොක්‍යාඃ, ලොකත්‍රයට; එකචක්‍ෂුඃ, අසහායනෙත්‍රවූ; භාස්වතඃ, ආදිත්‍යයාගේ; තන්මහඃ, ඒතෙජස; වඃ, තොපගේ; අසහිත්; පාපච්ඡෙදයකරණුයේ; ස්තාත්, වේවා.

(22) ක්ෂ්මාං ක්ෂෙපීයඃ ක්ෂපාම්භඃ ශිශිරතරතලස්පර්ශතර්ෂාද්‍රුතෙව
ප්‍රාගාශාගෙතු මාශාවිරදකරසරඃ පුෂ්කරාණීව බොධම්
ප්‍රාතඃ ප්‍රොල්ලඞ්ඝ්‍යවිෂ්ණොඃ පදමපි ඝෘණයෙවාතිවෙගාද්දවීය
සුද්ගම්දෙයාත්මානා දහතුදිනපතෙර්දුර්නිමිත්තං ද්‍යුතිර්වඃ.

ප්‍රාතඃ, ප්‍රභාතකාලයෙහි; ප්‍රාක්, පළමුකොට; ක්ෂපාම්භඃ, රාත්‍රිජලයෙන් හෙවත් තුෂාරොදකයෙන්; ශිශිරතර, ඉතා සිහිල්වූ; තල, පෘථිවිතලයාගේ; ස්පර්ශතර්ෂාද්ඉව, ස්පර්ශාභිලාෂයෙන්මෙන් (හෙවත් තමා සන්තප්ත හෙයින් ශීතලස්පර්ශයෙහි ආලය ඇත්තාක්මෙන්); ක්ෂෙපීයඃ, ශීඝ්‍රතරව; ක්ෂ්මාං, පෘථිවියට; ද්‍රුතා, ගියාවූ; ආශාවිරදකර, දිග්දන්තීන්ගේ හස්තනමැති; සරඃ, තටාකයෙහිවූ; පුෂ්කරාණි, පද්මයන්දොහෝ නොහොත් අග්‍රයන්ද්වයත්; බොධම්නෙතුම්ව, පුෂ්කරයෝනම් මාවිසියා ප්‍රබොධකටයුත්තාහුයයි යන අදහසින් ප්‍රබොධය පිණිසමෙන්; ආශාඃ, දසදිගුන්කරා; ද්‍රුතා, ගියාවූ; විෂ්ණොඃ පදමපි, විෂ්ණුහුගේපදයද හෙවත් අහසද; ඝෘණයාඉව, පාදස්ථානයෙහි සිටියයුතුනොවෙයි යන ජුගුප්සායෙන් මෙන්; අතිවෙගාත්, අධිකවූ වෙගයෙන්; ප්‍රොල්ලඞ්ඝ්‍ය, ඉක්ම; දවීයසී, ඉතායුහුසුලුව; ද්‍රුතා, ගියාවූ; උද්ගම්, උඩගුව; දෙයාත්මානා, බබලන්නාවූ; දිනපතෙඃද්‍යුතිඃ, හිරුගේ කාන්තිතොම; වඃ, තොපගේ; දුර්නිමිත්තං, අනභිමතය; දහතු, හසමකෙරේවා.

(23) නො කල්පාපායවායොරදයරයදලත් ක්ෂ්මාධරස්‍යාපි ගම්‍යා
ගාඪොද්ගීර්ණොජ්වලශ්‍රී රහනි නරහිතා නොතමඃ කජ්ජලෙන
ප්‍රාප්තොත්පත්තිඃ පතඞ්ගාන්නපුනරුපගතා මොෂමුෂ්ණත්විෂොවෝ
වෘත්තිඃ සෙවාන්‍යරූපා සුඛයතු නිඛිලද්වීපදීපස්‍ය දීප්තිඃ.

අදය, අවිද්‍යමානදයාඇති හෙවත් දැඩිවූ; රය, වෙගයෙන්; දලත්, විදාරණයකරන්නාවූ; ක්ෂ්මාධරස්‍ය, හිමාලමෙරුම්න්දරාදි පර්වතයන්ඇති; කල්පාපායවායොරපි, කල්පාන්තමාරුතයාසම්බන්ධවද; නොගම්‍යා, පැමිණියනොහැක්කාවූ (හෙවත් මදසුලඟකින්ත් චලිතකළහැකි පහන්පියල්ලක්සේ නොව කල්පාන්තමාරුතයෙනුත් සෙල්වියනොහැක්කාවූ); ගාඪොද්ගීර්ණොජ්වලශ්‍රීඃ—ගාඪ, දැඩිකොට; උද්ගීර්ණ, උද්ගාරයකරණලද; උජ්වලශ්‍රීඃ, දිලිහෙන්නාවූ ශොභාඇති; අහනි, දිවාභාගයෙහි; නරහිතා, රහිතනොවන්නාවූ හෙවත් යුක්තමවන්නාවූ; තමඃකජ්ජලෙන, අන්ධකාරනමැති සිළුදල්ලෙන්; නොන රහිතා, හරණලද්දාවූ හෙවත් වියුක්තාවූ; පතඞ්ගාත්, සූර්‍ය්‍යාකෙරෙන්; ප්‍රාප්තොත්පත්තිඃ, පැමිණෙනලද උත්පත්තිඇති, පුනඃ, නැවත; පතඞ්ගාත්, සලභයාකෙරෙන්; මොෂම්, විනාශයට; නඋපගතා, නොපැමිණියාවූ; අන්‍යරූපාඑව, ප්‍රදීපවර්තිකායෙන් භින්න ස්වරූපඇත්තාවූම; වර්තිඃ, ප්‍රවෘත්තිඇති නොහොත් දීපවර්තිකාඇති; නිඛිලද්වීප, ජම්බුද්වීපාදි සමස්තද්වීපයන්ට; දීපස්‍ය, ප්‍රකාශකත්වයෙන්ප්‍රදීපභූතවූ; උෂ්ණත්විෂඃ, තීක්ෂණරශ්මිහුගේ; සාදීප්තිඃ, ඒප්‍රභාතොම; වඃ, තොප; සුඛයතු, සුවපත්කෙරේවා.

(24) නිඃශෙෂාශාවපූරප්‍රවණගුරුගුණශ්ලාඝනීයස්වරූපා
පර්‍යාප්තා නොදයාදෞ දිනගමසමයො පප්ලවෙ'ප්‍යුන්නතෙව
අත්‍යන්තං යානභිඥා ක්ෂණමපි තමසා සාකමෙකත්‍ර වස්තුං
බුඞ්ඝ්‍යොඩා රුචිර්වො රුචිරිව රුචිතස්‍යාප්තයෙ වස්තුනො'ස්තු.

යා, යම් කාන්තියක්; බ්‍රධ්නස්‍ය, සූර්‍යයාගේ; රුචිරිව, අභිලාෂයමෙන්; නිඃශෙෂාශාවපූරප්‍රවණගුරු
ගුණශ්ලාඝනීයස්වරූපා—නිඃශෙෂ, සියලු; ආශා, දිශාවන්; අවපූර, පිරීමට; ප්‍රවණ, අභිමුඛවූ; ගුරුගුණ,
මහත්ගුණයෙන්; ශ්ලාඝනීයස්වරූපා, වර්ණනීයස්වරූපඇත්තීද; නොහොත්—නිඃශෙෂාශා, සමස්තාභිලාෂ
යන්ගේ; අවපූර, පිරීමෙහි හෙවත් සම්පාදනායකිරීමෙහි; ප්‍රවණ, නතුවීමයසික්කියනලද; ගුරුගුණ, ගුරු
වූඋපකාරකධර්මයෙන්; ශ්ලාඝනීයස්වරූපා, වර්ණනාකටයුතුවූ ස්වභාවඇත්තීද; උදයාදෞ, ප්‍රාරම්භකාලාදි
යෙහිම නොහොත් අභිවෘද්ධිකාලයෙහිම; නපරිම්ලානා, උන්නතව පවත්නීනොවේද; වැලිත්—දිනගම
සමයොපපලවෙපි; දිවසභාගයාගේ නිර්ගමකාල සංඛ්‍යාතවූ විනාශකාලයෙහිද; උන්නතෛව, උසස්
වම පවත්නීද; තමසා සාකම්, අන්ධකාරයහා එක්ව නොහොත් තමොගුණයහාඑක්ව; ක්ෂණමපි, ඇසිල්ල
කුත්; එතාත්‍රවස්තුං, එතැන්හි වාසයකරන්ට; අත්‍යන්තං, අතිශයින්ම; අනභිඥා, නොදන්නීද; බ්‍රධ්න
ස්‍ය, සූර්‍යයාගේ; ඉද්ධා, සමෘද්ධවූ; එෂාරුචිඃ, මේදීප්තතොම; වඃ, තොපගේ; රුචිතාස්‍යවස්තුනඃ, අභිප්‍රෙ
තවූ පදාර්ථයාගේ; ආප්තයෙ, ප්‍රාප්තියපිණිස; අස්තු, වේවා.

(25) බිභ්‍රාණඃ ශක්තිමාශු ප්‍රශමිතබලවත්තාරකෞර්ජිත්‍යගුර්වීං
කුර්වාණො ලීලයාධඃ ශිඛිනමපි ලසච්චන්ද්‍රකාන්තාවභාසම්,
ආදධ්‍යාදන්ධකාරෙ රතිමතිශයිනීමාවහන් වීක්ෂණානාං
බාලො ලක්ෂ්මීමපාරාමපරඉව ගුහො 'හර්පතෙරාතපොවඃ.

ආශු, ශීඝ්‍රව; ප්‍රශමිත, සන්සිඳුවනලද; බලවත්තාරකා, බලවත්වූ නක්ෂත්‍රයන්ගේ; ඖර්ජිත්‍ය, මහත්ව
යෙන්; ගුර්වීං, මහත්වූ; ශක්තිම්, සාමර්ථ්‍යය; බිභ්‍රාණඃ, දරන්නාවූ; නොහොත්—ආශු, වහා; ප්‍රශමිත, සන්
සිඳුවනලද; බලවත්, ශක්තිසම්පන්නවූ; තාරකෞර්ජිත්‍ය, තාරකාඛ්‍ය අසුරයාගේ ඌර්ජස්වභාවයෙන්,
මහත්වයෙන්; ගුර්වීං, උඛතාවූ; ශක්තිම්, අඩයටිය; බිභ්‍රාණඃ, ධරන්නාවූ; අපි, නැවත; ලසච්චන්ද්‍ර, බබ
ලන්නාවූ චන්ද්‍රයාමෙන්; කාන්තාවභාසම්, මනොඥකාන්ති ඇති; ශිඛිනම්, වහ්නිනු; අධඃකුර්වාණඃ, අප්‍ර
කාශකරන්නාවූ; නොහොත්—ලසත් චන්ද්‍රකාන්තාවභාසම්, බබලනසඳැස්පිල්කලඹිශොභාඇති; ශිඛි
නම්, මයූරයා; අධඃකුර්වාණඃ, වාහනභාවයට පමුණුවන්නාවූ; අන්ධකාරෙ, අන්ධකාරය ඇතිකල්හි (හෙවත්
අන්ධකාරානුභවයක් ඇතිකල්හි); වීක්ෂණානාං, නෙත්‍රයන්ට; අතිශයිනීංරතිම්, බොහෝවූ ප්‍රීතියක්; ආව
හන්, පමුණුවන්නාවූ; නොහොත්—අන්ධකාරෙඃ, අන්ධකනම් අසුරයාට ශත්‍රුවූ පරමෙශ්වරයාගේ; වීක්ෂ
ණානාං, ත්‍රිනෙත්‍රයන්ට; අතිශයිනීංරතිම්, මහත්වූ පුත්‍රප්‍රීතිය; ආවහන්, එලවන්නාවූ; බාලඃ, අභිනවවූ
නොහොත් කුමාරවූ; අපරොගුහඉව, අනික් ෂණ්මුඛයෙකු වැනිවූ; අහර්පතෙඃ, දිනනාථයාගේ; ආතපඃ,
ආලොකයතෙම; වඃ, තොපට; අපාරාම්, අනන්තවූ; ලක්ෂ්මීම්, සම්පත්තිය; ආදධ්‍යාත් (දදතු),
දේවා.

(26) ජ්‍යොත්ස්නාංශාකර්ෂපාණ්ඩුද්‍යුතිතිමිරමසීශෙෂකල්මාෂමීෂජ්
ජෘම්භොද්භූතෙන පිඞ්ගං සරසිජරජසා සන්ධ්‍යයා ශොණශොචිඃ,
ප්‍රාතඃ ප්‍රාරම්භකාලෙ සකලමපි ජගච්චිත්‍රමුන්මීලයන්තී
කාන්තිස්තීක්ෂ්ණත්විෂො 'ක්ෂ්ණාම් මුදමුපනයතාං තූලිකෙවාතුලාංවඃ.

ප්‍රාතඃ ප්‍රාරම්භකාලෙ, උදාසන දිනමුඛකාලයෙහි; ජ්‍යොත්ස්නාංශාකර්ෂපාණ්ඩුද්‍යුති—ජ්‍යොත්ස්නාං
ශු, චන්ද්‍රප්‍රභායෙන්; ආකර්ෂට, හාත්පසින්හැඳප්‍රකාශකරණලද; පාණ්ඩුද්‍යුති, ශුභ්‍රකාන්තිඇති (හෙවත්
සඳපහන් නමැති මකුල්හා සුදුසිත්තු බිම්තරණලද්දාවූ); තිමිරමසීශෙෂ කල්මාෂම්—තිමිර, අන්ධකාර
නාමැති; මසීශෙෂ, අඤ්ජනමසීශෙෂයෙන් (හෙවත් තැනතැන ශෙෂවසිටි අඳුරු නමැති අඳුන්කළු
වෙන්); කල්මාෂම්, විචිත්‍රවර්ණවූ; ඊෂජ්ජෘම්භොද්භූතෙන—ඊෂත්, මඳක් ජෘම්භාවිකාශයෙන්; උද්භූතෙ
න, සහලවූ; සරසිජරජසා, පද්ම මකරන්දයෙන්; පිඞ්ගං, රත්වන්කරණලද; සන්ධ්‍යයා, උෂඃකාන්තියෙන්
හෙවත් අරුණුරශ්මියෙන්; ශොණශොචිඃ, රත්පැහැඇති (හෙවත් අරුණුරශ්මි නමැති ලාක්ෂාදීන් අඳ
නාලද රත්බිම් ඇති); සකලමපිජගත්, සමස්තජගත්‍රයම; චිත්‍රම්, විචිත්‍රකොට හෙවත් සිතියම්කොට;

උන්මීලයන්ති, ප්‍රසන්නකරන්නාවූ හෙවත් රඳන්නාවූ; තූලිකාඉව, චිත්‍රතූලිකාවක් වැනිවූ හෙවත් තෙල්ලක් වැනිවූ; තීක්ෂණත්විෂඃ, චණ්ඩකිරණයාගේ; කාන්තිඃ, ප්‍රභාතොමෝ; වඃ, තොපගේ; අක්ෂ්ණාම්, නෙත්‍රයන්ට; අතුල්‍යාංමුදම්, අසදෘශවූ ප්‍රීතිය; උපනයතාම්, එලවාවා හෙවත් කෙරේවා.

(27) ආයාන්ති කිං සුමෙරොඃ සරණිරරුණිතා පද්මරාගෛඃ පරාගෛ
රාහොස්විත් ස්වස්‍ය මාහාරජනවිරචිතා වෛජයන්තී රථස්‍ය,
මාඤ්ජිෂ්ඨීප්‍රෂ්ඨවාහාවලිවිධුතශිරශ්චාමරාලීනු ලොකෙ
ශ්ලාඝ්‍යාලොකිතෛවං සවිතුරඝනුදෙ ස්තාත් ප්‍රභාතප්‍රභා වඃ.

ආයාන්තී, එන්නාවූ; සුමෙරොඃ, මහාමෙරුපර්වතයාගේ; පද්මරාගෛඃ, පද්මරාග මාණික්‍යමයවූ; පරාගෛඃ, (රවිරථාශ්වයන්ගේ ඛුරාග්‍රයෙන් සූක්ෂ්මකරනලද) ධූලීන් කරණකොටගෙණ; අරුණිතා, සඤ්ජාත රක්තවර්ණ ඇත්තාවූ; සරණිඃකිම්, මාර්ගයෙක් දෝහෝ නොහොත්–ස්වස්‍ය, හිරුතමාගේ; රථස්‍ය, රථයා සම්බන්ධවූ; මහාරඤ්ජන, වණුක්මල් රත්පිළියෙන්; විරචිතා, කරණලද්දාවූ; නොහොත්–මාහාරජනවිරචිතා, ස්වර්ණයෙන් කරණලද්දාවූ; වෛජයන්තිආහොස්විත්, පතාකාවෙක්දෝහෝයි කියාද; මාඤ්ජිෂ්ඨී, මඤ්ජිෂ්ඨාරාගයෙන් රඳනාලද; ප්‍රෂ්ඨ, අග්‍රගාමීවූ හෙවත් ඉදිරියෙහි යන්නාවූ; වාහාවලි, අශ්වපඞ්ක්තියගේ; විධුත, කම්පිතවූ; ශිරශ්චාමරාලීනු, මුදුනෙහි සෙමෙරවල් පඞ්ක්තියෙක් දෝහෝයි කියාද; ශ්ලාඝ්‍ය, සැකව, ලොකෙඃ, සර්වලොකයා විසින්; එවං, මෙසේ; ආලොකිතා, නිරීක්ෂණය කරණලද්දාවූ; සවිතුඃ, ආදිත්‍යයාගේ; ප්‍රභාතප්‍රභා, ප්‍රභාතකාලයෙහිවූ කාන්තිතොමෝ; වඃ, තොපගේ; අඝනුදෙ, පාපවිනාශය පිණිස; ස්තාත්, වේවා.

(28) ධ්වාන්තධ්වංසං විධත්තෙ නතපති රුචිමාන්නාතිරූපං ව්‍යනක්ති
න්‍යක්ත්වං නීත්වාපි නක්තං නවිතරතිතරාං තාවදහ්නස්ත්විෂං යඃ,
ස ප්‍රාතර්මාවිරංසීදසකලපටිමා පූරයන් යුෂ්මදාශා
මාශාකාශාවකාශාවතරණතරුණප්‍රක්‍රමො'ර්කප්‍රකාශඃ.

යඃ, යම් ආලොකයෙක්; ප්‍රාතඃ, ප්‍රභාතකාලයෙහි; ධ්වාන්තධ්වංසංවිධත්තෙ, අන්ධකාරවිනාශය කෙරේද; නතපති, නොතවාද; රුචිමාන්, ශොභාසම්පන්නද; රූපං, චක්ෂුරින්ද්‍රියග්‍රාහ්‍යවූ රූපය; නාතිව්‍යනක්ති, අතිශයින් ප්‍රකාශනොකරේද; නක්තං, රාත්‍රිය; න්‍යක්ත්වං, නීචභාවයට; නීත්වාපි, පමුණුවාත්; අහ්නඃ ත්විෂං, දිවසශොභාව; නවිතරතිතරාං, අතිශයින් නොදේද; අසකලපටිමා, අසම්පූර්ණවූ පටුත්ව ඇති; ආශාකාශාවකාශාවතරණ තරුණප්‍රක්‍රමඃ–ආශාකාශ, දිශාකාශ දෙදෙනාගේ; අවකාශඅතුරෙහි; අවතරණ, බැසගැන්මෙහි; තරුණප්‍රක්‍රමඃ, අභිනව සාමර්ථ්‍යඇති; සඃ අර්කප්‍රකාශඃ, ඒ සූර්‍ය්‍යාලොකය තෙම; යුෂ්මදාශාම්, තොපගේ තෘෂ්ණාව; පූරයන්, පුරමින් හෙවත් සඵලකෙරෙමින්; මාවිරංසීත්, නොවලකීවා.

(29) තීව්‍රං නිර්වාණහෙතුර්‍යදපිච විපුලං යත් ප්‍රකර්ෂේණචාණු
ප්‍රත්‍යක්ෂං යත් පරොක්ෂං යදිහ යදපරං නශ්වරං ශාශ්වතඤ්ච,
යත් සර්වස්‍ය ප්‍රසිද්ධං ජගති කතිපයෙ යොගිනො යද්විදන්ති
ජ්‍යොතිස්තද්විප්‍රකාරං සවිතුරවතුවො බාහ්‍යමාභ්‍යන්තරඤ්ච.

සවිතුඃ, සූර්‍ය්‍යයාගේ; යත්, යම් තෙජසෙක්; බාහ්‍යං, පිටතද; තත්, ඒ; තීව්‍රං, තීක්ෂණය; යත්, යමෙක්; ආභ්‍යන්තරං, අභ්‍යන්තරවූ ඥානස්වරූපද; තත්, ඒ; නිර්වාණහෙතුඃ, මොක්ෂකාරණය; අපි, නැවත; යත්, යම් තෙජසෙක් බාහ්‍යද; තත්, ඒ; අතිවිපුලං, ඉතාපෘථුලය; යත්, යමෙක්; ආභ්‍යන්තරං, අභ්‍යන්තරයෙහිවූයේද; තත්, ඒ; ප්‍රකර්ෂේණ, අතිශයින්; අණුඃ, සූක්ෂ්මය; යත්, යම් තෙජසෙක්; බාහ්‍යං, බාහ්‍යද; තත්, ඒ; ප්‍රත්‍යක්ෂං, ඉන්ද්‍රිය විෂයවන්නේය; යත්, යම්තෙජසෙක්; ආභ්‍යන්තරං, අභ්‍යන්තරද;

තත්, ඒ; පරොක්‍ෂං, ඉන්ද්‍රිය විෂයාතික්‍රාන්තය; ඉහ, මේ ලෝකයෙහි; යත්, යම් තේජසෙක්; බාහ්‍යං, බාහ්‍යද; තත්, ඒ; නශ්වරං, නැසෙනසුළුය හෙවත් ක්‍ෂණිකය; යත්, යමෙක්; අපරං, අනික් ආභ්‍යන්තරද; තත්, ඒ; ශාශ්වතඤ්ච, නිත්‍යදවෙයි; යත්, යම්තේජසෙක්; බාහ්‍යං, බාහ්‍යද; තත්, ඒ; සර්වස්‍ය, සියලුලෝකයාට; ප්‍රසිද්ධං, ප්‍රසිද්ධය; යත්, යමෙක්; ආභ්‍යන්තරං, අභ්‍යන්තරද; තත්, ඒ; ජගති, සංසාරයෙහි; කතිපයෙ යොගිනඃ; යොගාවචරවූ යතිජනයෝ කීපදෙනෙක්; විදන්ති, දනිති; ඉති, මෙසේ; බාහ්‍යඤ්ච, බාහ්‍යවූද; ආභ්‍යන්තරඤ්ච, අභ්‍යන්තරවූද යන; ද්විප්‍රකාරම්, ප්‍රකාරම යක් ඇත්තාවූ; තජ්ජ්‍යොතිඃ, ඒ තේජස; වඃ, තොප; අවතු, රක්‍ෂාකෙරේවා.

( 30 )

රත්නානාං මණ්ඩනාය ප්‍රභවති නියතොද්දෙශ
ලබ්ධාවකාශං
වහ්නෙර්දාර්වාදි දග්ධුං නිජජඩිමතයා කර්තු
මානන්දමින්දොඃ,
යත්තු ත්‍රෛලොක්‍යභූෂාවිධිරඝදහනං හ්ලාදි
වෘෂ්ට්‍යාශු තවො
බාහුල්‍යොත්පාද්‍ය කාර්‍ය්‍යාධිකතරමවතාදෙක
මෙවාර්කතෙජඃ.

රත්නානාං, පද්මරාගාදිරත්නයන්ගේ; යත් තෙජඃ, යම්තේජසෙක් ඇද්ද; තත්, ඒ; නියතොද්දෙශ, භූෂණවින්‍යාසයට නියතවූ කණ්ඨප්‍රකොෂ්ඨාදි ශරීරාවයවයෙහි; ලබ්ධාවකාශං, ලබනලද අවකාශ ඇත්තේ; මණ්ඩනාය, අලඞ්කාර පිණිස; ප්‍රභවති, සමර්ථවන්නේය; වහ්නෙඃ, අග්නිහුගේ; යත්, යම් තෙජසෙක් ඇද්ද; තත්, ඒ; දාර්වාදි, කාෂ්ඨාදිය; දග්ධුං, භස්මකරන්ට; ප්‍රභවති, සමර්ථවන්නේය; ඉන්දොඃ, චන්ද්‍රයාගේ; යත්තෙජඃ, යම් දීප්තියෙක් ඇද්ද; තත්, ඒ; නිජජඩිමතයා, ස්වභාව ශීතලත්වය හෙතුකොටගෙණ; ආනන්දං කර්තුම්, සන්තොෂය උපදවන්නට; ප්‍රභවති, සමර්ථවන්නේය; යත්තු, යම් ඒ සූර්‍ය්‍යතෙජසෙක්; ත්‍රෛලොක්‍යභූෂාවිධිඃ, තුන්ලොවට අලඞ්කාර සීමාවේද; අඝදහනං, පාපදහනයකොරේද; වෘෂ්ට්‍යා, වර්ෂණය හෙතුකොටගෙණ; හ්ලාදි, සියලු ලොකයාට සෞඛ්‍ය කරද; බාහුල්‍යොත්පාද්‍යකාර්‍ය්‍යාධිකතරම්—බාහුල්‍ය, බහුලභාවයෙන්; උත්පාද්‍ය, සම්පාදනයකටයුතුවූ; කාර්‍ය්‍යාධිකතරම්, සවකීයවූ භූෂණදහනාහ්ලාදනකාර්‍ය්‍යයාගේ අතිශයවත් ආධික්‍ය ඇති; තත් එකමෙවාර්කතෙජඃ, ඒ එකම සූර්‍ය්‍යතෙජස; ආශු, ශීඝ්‍රව; වඃ, තොප; අවතාත්, රක්‍ෂාකෙරේවා.

( 31 )

මීලච්චක්‍ෂුර්විජෘම්භශ්‍රුති ජඩරසනං විඝ්නිතඝ්‍රාණ
වෘත්ති
ස්වව්‍යාපාරාක්‍ෂමත්වක් පරිමුෂිතමනඃ ශ්වාස
මාත්‍රාවශෙෂම්,
විස්‍රස්තාඞ්ගං පතිත්වා ස්වපදපහරතා
දශ්‍රියංවො'ර්කජන්මා
කාලව්‍යාලාවලීඪං ජගදගදඉවොත්ථාපයන්
ප්‍රාක්ප්‍රතාපඃ.

කාලව්‍යාල, රාත්‍රිකාල නමැති සර්පයා විසින් නොහොත්; කාලව්‍යාල, රාත්‍රි නමැතිකෘෂ්ණසර්පයා විසින්; අවලීඪම්, දෂ්ටකරණලද්දාවූ; (එහෙසින්ම) මීලච්චක්‍ෂුඃ, නිමීලිතවූ ඇස් ඇති හෙවත් පියූ ඇස් ඇති; විජෘම්භශ්‍රුති, ශබ්දග්‍රහණයෙහි අසමර්ථවූ ශ්‍රොත්‍රඇති; ජඩරසනං, ජඩප්‍රකාරවූ ජිව්හාඇති; විඝ්නිතඝ්‍රාණවෘත්ති, විඝ්නවන්වූ ඝ්‍රාණෙන්ද්‍රිය ප්‍රවෘත්තිඇති; ස්වව්‍යාපාර, සවකීයවූ ස්පර්ශොපලබ්ධි ක්‍රියායෙහි; අක්‍ෂමත්වක්, අසමර්ථවූ කායෙන්ද්‍රිය ඇති; පරිමුෂිතමනඃ, පැහැරගන්නාලද චිත්තප්‍රවෘත්ති ඇති හෙවත් චිත්තව්‍යාපාරඇති; ශ්වාසමාත්‍රාවශෙෂම්, අවශෙෂවූ ආශ්වාස ප්‍රශ්වාස පමණක් ඇති; විස්‍රස්තාඞ්ගං, ලිහිල්වගිය ශරීරාවයව ඇති; පතිත්වා, විවසව වැටී; ස්වපත්, නිද්‍රාකරන්නාවූ; ජගත්, සත්ත්වලොකයා; අගදඉව, ඖෂධවිශෙෂයක්මෙන්; උත්ථාපයන්, නගා සිටුවන්නාවූ; අර්කජන්මා, සූර්‍ය්‍ය උත්පත්තිස්ථානකොටඇති හෙවත් හිරුකෙරෙන් ජනිතවූ; ප්‍රාක්ප්‍රතාපඃ, ප්‍රභාතාලොකය හෙවත් බාලාර්ක කිරණයතෙම; වඃ, තොපගේ; අශ්‍රියම්, අලක්‍ෂ්මිය; අපහරතාත්, දුරුකෙරේවා.

( 32 )

නිඃශෙෂං නෛශමම්භඃ ප්‍රසභමපනුදන්නශ්‍රු
ලෙශානුකාරී
ස්තොකස්තොකාපනීතාරුණරුචිරචිරා
දස්තදොෂානුෂඞ්ගඃ,
දාතා දෘෂ්ටිං ප්‍රසන්නාං ත්‍රිභුවනනයනස්‍යාශු
යුෂ්මද්විරුද්ධං
වධ්‍යාද්බ්‍රධ්නස්‍ය සිද්ධාඤ්ජනවිධිරපරඃ
ප්‍රාක්තනො'ර්චිඃප්‍රචාරඃ

ත්‍රිභුවනනයනස්‍ය, ත්‍රෛලොක්‍යනෙත්‍රයා සම්බන්ධිවූ; අශ්‍රුලෙශානුකාරි, බාෂ්පජලලවයන්ට අනුක්‍රියාකරන්නාවූ හෙවත් සදෘශවන්නාවූ; නෛශං, රාත්‍රියෙහිවූ; අම්භඃ, ජලය හෙවත් තුෂාර ජලය; නිඃශෙෂම්, ශෙෂනැතිකොට; ප්‍රසභම්, බලාත්කාරයෙන්; අපනුදන්, දුරුකරන්නාවූ; ස්තොකස්තොක, මදින් මදින්; අපනීත, පහකරණලද; අරුණරුචිඃ, අරුණරශ්මි ඇති නොහොත් රත්පැහැඇති; අචිරාත්, නොබෝ කලකින්; අස්ත, හරණලද; දොෂානුෂඞ්ගඃ, රාත්‍රිසංයොගඇති නොහොත් හරණලද; දොෂානුෂඞ්ගඃ, තිමිරාදි දොෂසම්බන්ධය ඇති; ප්‍රසන්නාං දෘෂ්ටිං, ප්‍රසන්නවූ දෘෂ්ටිය; දාතා, දෙන්නාවූ; අපරඃ, අවිතීයවූ; සිද්ධාඤ්ජනවිධිඃ; දෘෂ්ටිශක්තිකර සිද්ධාඤ්ජන විධියක්වැනිවූ; බ්‍රධ්නස්‍ය, සූර්‍ය්‍යයාගේ; ප්‍රාක්තනඃ, පූර්වාහ්ණයෙහිවූ; අර්චිඃප්‍රචාරඃ, ජ්‍යොතිස්සඤ්චාරයතෙම; යුෂ්මද්විරුද්ධං, තොපගේ අනනුකූලය; ආශු, වහා; වධ්‍යාත්, නසාවා

( 33 )

භූත්වා ජම්භස්‍ය භෙත්තුඃ කකුභි පරිභවා
රම්භභූඃ ශුභ්‍රභානොර්
බිභ්‍රාණා බභ්‍රුභාවං ප්‍රසභමභිනවාම්භොජ
ජෘම්භාප්‍රගල්භා,
භූෂා භූයිෂ්ඨශොභා ත්‍රිභුවනභවනස්‍යාස්‍ය
වෛභාකරී ප්‍රාග්
විභ්‍රාන්ති භ්‍රාජමානා විභවතු විභවොද්භූතයෙ
සා විභාවඃ

(සා, යම් දීප්තියක්තොම;) ප්‍රාක්, ප්‍රභාතකාලයෙහි; ජම්භස්‍යභෙත්තුඃ, ජම්භභෙදීහුගේ හෙවත් ඉන්ද්‍රයාගේ; කකුභි, දික්හි; භූත්වා, පහළව; ශුභ්‍රභානොඃ, චන්ද්‍රයාට; පරිභවාරම්භභූඃ, තිරස්කාර ක්‍රියාවට භූමිවේද; බභ්‍රුභාවං, කපිලවණී භාවය; බිභ්‍රාණා, ධරන්නීද; ප්‍රසභම්, ලෑහෙලා; අභිනවාම්භොජ ජෘම්භාප්‍රගල්භා—අභිනව, අලුත්වූ; අම්භොජ, පද්මයන්ගේ; ජෘම්භා, විකාශයෙහි; ප්‍රගල්භා, දක්ෂවන්නීද; අස්‍යත්‍රිභුවනභවනස්‍ය, මෙත්‍රෛලොක්‍ය නමැති ගෘහයට; භූයිෂ්ඨශොභා, අතිබහුලවූ ශොභාඇති; භූෂා, අලඞ්කාරයෙක්ද; විභ්‍රාන්ති, නිස්සන්දෙහව; භ්‍රාජමානා, බබලන්නීද; වෛභාකාරී, විභාකරයා සම්බන්ධිවූ; සාවිභා, ඒ ශොභාතොම; වඃ, තොපට; විභවොද්භූතයෙ, ධනප්‍රාප්තිය පිණිස; විභවතු, විශෙෂයෙන් කාරණ වේවා

( 34 )

සංසක්තං සික්තමූලාදභිනව භුවනොද්‍යාන
කෞතුහලින්‍යා
යාමින්‍යා කන්‍යයෙවාමෘතකරකලශාවර්ජිතෙ
නාමෘතෙන,
අඛ්‍යාලොකඃ ක්‍රියාවො මුදමුදයශිරශ්චක්‍ර
වාලාලවාලා
දුද්‍යන් බාලප්‍රවාලප්‍රතිමරුචිරහඃපාදප
ප්‍රාක්ප්‍රරොහඃ

අභිනව භුවනොද්‍යාන කෞතුහලින්‍යා—අභිනව, අළුත්වූ; භුවන, ජගත්‍රය නමැති; උද්‍යාන, උයන්හි; කෞතුහලින්‍යා, උපන් කෞතුහල ඇති හෙවත් සාභිලාෂවූ; කන්‍යයාඉව, බාලස්ත්‍රියක විසින්මෙන්; යාමින්‍යා, රාත්‍රිය විසින්; අමෘතකරකලශා වර්ජිතෙන, චන්ද්‍රබිම්බ නමැති රජතඝටයෙන් වත්කරණලද; අමෘතෙන, ජලයෙන්; සංසක්තං, නිරන්තරකොට; සික්තමූලාත්, තෙමකලද මුල් ඇති; උදය, පූර්වපර්වතයාගේ; ශිරශ්චක්‍රවාල, ශිඛරමණ්ඩලනමැති; ආලවාලාත්, තොටැන්නෙන්; උද්‍යන්, පහළවන්නාවූ; බාලප්‍රවාලප්‍රතිම, අභිනව පල්ලව සදෘශවූ; රුචිඃ, ශොභාඇති; අහඃපාදප, දිවසභාගනමැති වෘක්ෂයාගේ; ප්‍රාක්ප්‍රරොහඃ, ප්‍රථමාඞ්කුරයක්වැනිවූ; අඛ්‍යාලොකඃ, සූර්‍ය්‍යාලොකයතෙම; වඃ, තොපට; මුදම්, ප්‍රීතිය; ක්‍රියාත්, කෙරේවා

( 35 )

භින්නං භාසාරුණස්‍ය ක්වචිදභිනවයා විද්‍රුමාණං
ත්විෂේව
ත්වඞ්ගන්නක්ෂත්‍රරත්නද්‍යුතිනිකරකරාලාන්තරාලං
ක්වචිච්ච,
නාන්තර්නිඃශේෂකෘෂ්ණ ශ්‍රියමුදධිමිව ධ්වාන්ත
රාශිං පිබන් සන්
දේහුර්වඃ පූර්වෝ'ප්‍යපූර්වෝ'ග්නිරිව භවදඝප්ලුෂටයේ'ර්කාවභාසඃ

විද්‍රුමාණං, ප්‍රවාලයන්ගේ; ත්විෂා, දීප්තියෙන්; ක්වචිත්, සමහරතැනෙක; භින්නං, ප්‍රභාභේදයෙන් විශේෂිතවූ සමුද්‍රයමෙන්; අභිනවයා, අළුත්වූ; අරුණස්‍යභාසා, අරුණයාගේ රශ්මියෙන්; ක්වචිත්, සමහරතැනෙක; භින්නං, විදාරණයකරණලද්දාවූ; ක්වචිත්, සමහරතැනෙක්හි; ත්වඞ්ගත්, උද්ගතවන්නාවූ; නක්ෂත්‍රරත්න, නක්ෂත්‍රනමැති රත්නයන්ගේ; ද්‍යුතිනිකර, රශ්මිසමූහයෙන්; කරාල, ගැවසීගත්තාවූ; අන්තරාලං, අතුරු ඇති; නාන්තර්නිඃශේෂ කෘෂ්ණශ්‍රියම්, ඇතුලත්හි අවිද්‍යමානවූ ශේෂනාගය විෂ්ණුය ලක්ෂ්මිය යනමෙහින් අවියුක්තවූ හෙවත් අභ්‍යන්තර ගතශේෂ කෘෂ්ණ ලක්ෂ්මීන් ඇත්තාවූ නොහොත්—නාන්තර්නිඃශේෂ කෘෂ්ණශ්‍රියම්, ඇතුලත සමස්ත කෘෂ්ණ ශොභානැත්තාවූ; උදධිම්ව, යථොක්ත කාරණයෙන් සමුද්‍රය වැනිවූ; ධ්වාන්තරාශිං, අන්ධකාරසමූහය; පිබන්, පානයකරන්නාවූ; පූර්වොපි, දිනමුඛයෙහි පහළවූ හෙයින් ප්‍රථමවූද; අපූර්වඃ, අපූර්වවූ හෙවත් විතීයවූ; ඖර්වඃ අග්නිරිව, වඩබාග්නියක් වැනිවූ; අර්කාවභාසඃ, සූර්‍යාලොකයතෙම; භවදඝප්ලුෂ්ටයෙ—භවත්, පින්වත්වූ තොපගේ; අඝප්ලුෂ්ටයෙ, පාප දහනය පිණිස, සන්, වේවා.

( 36 )

ගන්ධර්වෛර්ගද්‍ය පද්‍ය ව්‍යතිකරිතවචොහෘද්‍ය
මාතොද්‍යවාද්‍යෛ
රාද්‍යෛර්‍යසූර්‍යාලොකනාරදප්‍රභෘතිභිරභිනුතො
වෙතවෙද්‍යෛර්විභිද්‍ය,
ආසාද්‍යාපද්‍යතෙ යං පුනරපිච ජගද්යෞවනං
සද්‍යඋද්‍යන්
න්‍යුද්‍යොතොද්‍යොතිතද්‍යෞර්ද්‍යතු දිවසකෘතොසාව
වද්‍යානිවොද්‍ය

උද්‍යන්, උද්ගතවන්නාවූ; යඃ, යම් සූර්‍යාලොකයෙක්තෙම; ගන්ධර්වෛඃ, හාහා හූහූ ප්‍රභෘති දෙව ගන්ධර්වයන් විසින්; ආතොද්‍යවාද්‍යෛඃ, තතාවනද්ධ ශුෂිරඝන ලක්ෂණ චතුර්විධ තූර්‍යයන්ගේ වැයීම් කරණකොටගෙණ; ගද්‍යපද්‍ය, ගුරු ලඝු න්‍යාස විචාරයක් නැති ගද්‍යය ශ්ලොකරචනාය යන මෙයින්; ව්‍යතිකරිතවචොහෘද්‍යම්, සම්බන්ධ ඇති වචනයෙන් ප්‍රියකොට; අභිනුතඃ, ස්තුතිකරණලද්දේද; එසේම අවෙතවෙද්‍යෛඃ, අවගතඥාන ඇත්තාවූ; ආද්‍යෛඃ, පුරාතනවූ; නාරදප්‍රභෘතිමුනිභිඃ, නාරදාදි දෙවර්ෂීන් විසින්; විභිද්‍ය, විශෙෂකොට; අභිනුතඃ, ස්තුති කරණලද්දේද; යං, යම් සූර්‍යාලොකයකට; ආසාද්‍ය, පැමිණ; ජගත්, ත්‍රෛලොක්‍යය; පුනරපිච, නැවතත්; සද්‍යඃ, එකෙණෙහිම; යෞවනං, තරුණභාවයට; ආපද්‍යතෙ, පැමිණේද; උද්‍යොතිතද්‍යෞඃ, දීප්තිමත්කරණලද ආකාශ ඇති; දිවසකෘතඃ, සූර්‍යයාගේ; අසෞඋද්‍යොතඃ, මේ ආලොකයතෙම; අද්‍ය, අද; වඃ, තොපගේ; අවද්‍යානි, දෙෂයන්; ද්‍යතු, ඛණ්ඩනයකෙරේවා.

( 37 )

ආපන්නෛකශචන්ද්‍රකාන්තෙරානශ්චුතතිමිරතයා
තාන්තවාත් තාරකාණා
මෙණාඞ්කාලොකලොපාදුපහතමහසා මොෂධීනාං
ලයෙන,
ආරාදුත්ප්‍රෙක්ෂ්‍යමාණ ක්ෂණමුදයතටාන්තර්
හිතස්‍යාභිමාංශො
රාභා ප්‍රාභාතිකීවො'වතු නතු නිතරාන්තා
වදාවිර්භවන්ති

ච්‍යුතතිමිරතයා, පහවූ අන්ධකාර ඇතිබැවින්; තාරකාණාං, තාරකාවන්ගේ; තාන්තවාත්, ග්ලානි බව හෙතුකොටගෙණ; උපහතමහසාං, විනෂ්ටවූ තෙජස්ඇති; ඖෂධීනාං, ඖෂධීන්ගේ; ලයෙන, විනාශයෙන් හෙවත් අප්‍රකාශත්වයෙන්; ඒණාඞ්ක, චන්ද්‍රයාගේ; ආලොකලොපාත්, කාන්තිවිනාශය හෙතුකොටගෙණ; ආපන්නෛඃ, දුකට පැමිනියාවූ හෙවත් ශුෂ්කවූ; චන්ද්‍රකාන්තෛඃ, චන්ද්‍ර කාන්ති පාෂාණයන් විසින්; ආරාත්, දුරින්; උත්ප්‍රෙක්ෂ්‍යමාණ, නිරීක්ෂණයකරණුලබන්නාවූ; ක්ෂණම්, ඇසිල්ලක්; උදයතට, උදයගිරිමස්තකයෙන්; අන්තර්හිතස්‍ය, මුවහවූ; අභිමාංශොඃ, හිරු

ගේ; ප්‍රභාතයි, ප්‍රභාතකාලයෙහිවූ; තාවත්, ඒ තාක්; නිතරාම්, අතිශයෙන්; නතුආවිර්භවන්ති, ප්‍රකාශනොවෙම්ත්සිටි; ආභා, ප්‍රභාතොම; වඃ, තොප; අවතු, රක්‍ෂාකෙරේවා.

( 38 )

සානෞ සා නෞදයෙ නාරුණිතදලප්‍රූනයෞවන
නානාං වනානා
මාලිමාලීඃප්‍රුෂ්‍ර පරිගෘහතකුහරොපාන්තනිම්නා
නනිම්නා,
භාවෝභාවෝපශාන්තිං දිශතු දිනපතෙර්භා
සමානා සමානා
රාජීරාජීවරෙණොඃ සමසමයමුදේතීව යස්‍යාව
යස්‍යා.

රාජීවරෙණොඃ, පද්මමකරන්දයන් සම්බන්ධවූ; රාජිඃ, පඞ්ක්තිතොමෝ; යස්‍යාඃ, යම් සූර්‍ය්‍යකාන්තියකගේ; සමානා, සදෘශවූ; වයස්‍යාඉව, සඛියක මෙන්; සමසමයං, සමකාලවම හෙවත් එකවටම; උදෙති, පහළවන්නීද; ඖදයෙ, උදයපර්වතයා පිළිබඳවූ; සානෞ, තටප්‍රදෙශයෙහි; අරුණිත, හට ගත්තාවූ රත්පැහැඇති; දල, පත්‍රයන් හෙතුකොටගෙණ; ප්‍රූනඃ, නැවත; යෞවනානාං, තරුණභාවය ඇත්තාවූ; වනානාම්, වනයන්ගේ; ආලිං, පඞ්ක්තිය; නආලීඃප්‍රුෂ්‍ර, අනාස්වාදිතප්‍රුෂ්පවූ; නනිම්නා, නන්‍රුම්වයෙන් හෙවත් මදකින්; පරිගෘහත, තමාවිසින් පරිග්‍රහණයකරණලද හෙවත් වලායනලද; කුහර, භූමිවිවරාදිරන්ධ්‍රයන්ගේ; උපාන්ත, පර්‍ය්‍යන්ත සමීපයට; නිම්නා, නතුවූ; භාසමානා, දිලිසෙන්නාවූ; දිනපතෙඃ, සූර්‍ය්‍යාගේ; සාභා, ඒ කාන්තිතොම; වඃ, තොපට; අභාවොපශාන්තිං, අවිසතුන්ගේ ව්‍යසනමය හෙවත් අවැඩ නැසීම; දිශතු, ප්‍රදානයකෙරේවා.

( 39 )

උජ්ජෘම්භාම්භොරුහාණං ප්‍රභවති පයසාං යා
ශ්‍රියෙ නොෂ්ණතායෙ
ප්‍රුෂ්ණාත්‍යාලොකමාත්‍රං නතු දිශති දෘශාං
දෘශ්‍යමානා විඝාතම්,
පූර්වාද්‍රෙරෙව ප්‍රූර්වං දිවමනුච ප්‍රූනඃ පාවනී
දිඞ්මුඛානා
මෙනාංසෞනී විභා සා නුදතු නුතිපදෛ
කාස්පදම් ප්‍රාක්තනීවඃ.

යා, යම් කාන්තියක්තොම; උජ්ජෘම්භාම්භොරුහාණම්, විකසිත පද්මයන් සම්බන්ධවූ; පයසාං, ජලයන්ගේ; ශ්‍රියෙ, ශොභාව පිණිස; ප්‍රභවති, පොහොසත්වන්නීද; උෂ්ණතායෙ, උෂ්ණත්වය පිණිස; නප්‍රභවති, පොහොසත්නොවන්නීද; දෘශ්‍යමානා, සත්වයන් විසින් දක්නාලබන්නීද; දෘශාම්, බලන්නවුන්ගේ නෙත්‍රයන්ට; ආලොකමාත්‍රං, ආලොක පමණක්; ප්‍රුෂ්ණාති, පොෂණය කෙරේද; විඝාතම්, ව්‍යසනයක්; නතුප්‍රුෂ්ණාති, නොමපුෂටකෙරේද හෙවත් දුක්නොදේද; ප්‍රූර්වං, පළමුකොට; ප්‍රූර්වාද්‍රෙරෙව, උදයපර්වතයා සම්බන්ධවම; පාවනී. පවිත්‍රකරන්නීද; අනුච, පසුවත්; දිවම්, ආකාශය; පාවනී, පවිත්‍රකරන්නීද; ප්‍රූනඃ, නැවත; දිඞ්මුඛානාම්, දිශාමුඛයන් සම්බන්ධව; පාවනී, පවිත්‍රකරන්නීද; නුතිපදෛකාස්පදම්—නුතිපද, ස්තුතිසම්මතවූ පදයන්ට හෙවත් ස්තොත්‍ර වචනයන්ට; එකාස්පදම්, අසහායවූ ප්‍රතිෂ්ඨවන්නීද; ඖනී, සූර්‍ය්‍යසම්බන්ධවූ; ප්‍රාක්තනී, ප්‍රාතඃකාලයෙහිවූ; සාවිභා, ඒ කාන්තිතොම; වඃ, තොපගේ; එනාංසි, පාපයන්; නුදතු, ප්‍රහාණය කෙරේවා හෙවත් දුරුකෙරේවා.

( 40 )

වාචාං වාචස්පතෙරප්‍යචලභිදුචිතාචාර්‍ය්‍යකාණම්
ප්‍රපඤ්චෙ
වෛරිඤ්ච්‍යානාං තථොච්චාරිතරුචිරසාමාන
නානාං චතුර්ණාම්,
උච්චෛර්නාර්චාසු වාච්‍යච්‍යුතිශුචිචරිතං යස්‍ය
නොවාච්‍යං විවිච්‍ය,
ප්‍රාව්‍යං වර්චශ්වකාසච්ජරිමුපචිනුතාත් තස්‍ය
චඩාර්චිසො වඃ.

යස්‍ය, යමක්හුගේ; වාච්‍යච්‍යුති, වචනීයච්‍යුතියෙන් හෙවත් දොෂවිගමයෙන්; ශුචි, නිර්මලවූ; චාරිතං, ගුණවෘත්තිය; වාචස්පතෙඃ, වෘහස්පතීහුගේ; අචලභිදුචිතාචාර්‍ය්‍යකාණම්—අචලභිද්, ඉන්ද්‍රයාට; උචිත, යොග්‍යවූ; ආචාර්‍ය්‍යකාණම්, උපාධ්‍යායභාවයක් ඇත්තාවූ; වාචාං, වචනයන්ගේ; ප්‍රපඤ්චෙපි, විස්තාරයෙන්ද; තථා, එසේම; උච්චාරිතරුචිරසාමාම්, උච්චාරණකරණලද ස්තුතියොග්‍යවූ සාමවෙදඇති; වෛරිඤ්ච්‍යානාං, මහාබ්‍රහ්මයා සම්බන්ධවූ; චතුර්ණාමානනානාම්, චතුර්

මුඛයන් සම්බන්ධවූ; වාචාම්ප්‍යුපශෙඛරපි, වචන විස්තාරයෙන්ද; අර්චාංසු, පූජාශයකිලා; ලමෙවෙ:, අතිශයින්; විවිච්‍ය, පරීක්‍ෂාකොටද; නොචක්‍ෂං, වක්තව්‍යනොවේද කියහැකි නොවේද; තස්‍ය චණ්ඩාර්චිෂ:, ඒ චණ්ඩකිරණයාගේ; වක්‍ෂස්, දෙදීප්‍යමානවූ හෙවත් අතිශයින් දිලියෙන්නාවූ; ප්‍රාච්‍යං, පූර්වදිශාවෙහිවූ; වර්ච:, තෙජස; ව:, තොපගේ; ශ්‍රියං, සම්පත්තිය; උපචනුතාත්, වඩිනය කෙරේවා......

( 41 )

මූර්ධ්න්‍යද්‍රෙර්ධාතුරාගස් තරුෂු කිසලයො
විද්‍රුමෞඝස් සමුද්‍රෙ
දිග්මාතඞ්ගොත්තමාඞ්ගෙෂ්වභිනවනිහිතස්
සාන්ද්‍රසින්දූරරෙණු:,
සීම්නි ව්‍යොම්න: සුව හෙම්නස් සුරශිඛරි
භුවො ජායතෙ ය: ප්‍රකාශශ්
ශොණිම්නාසෞ බරාංශොරුෂසි දිශතු වො
ශර්ම ශොභෛකදෙශ:......

ය:, යම් ප්‍රකාශෛකදෙශයෙක්තෙම; ශොණිම්නා, රක්තභාවය හෙතුකොටගෙණ; උෂසි, රාත්‍රි පර්‍ය්‍යන්තයෙහි; අද්‍රෙ:, පර්වතයාගේ; මූර්ධ්නි, මස්තකයෙහි; ධාතුරාග:, ගෛරිකාදිධාතූන්ගේ රක්තභාවවූයේ, තරුෂු, වෘක්‍ෂවල්හි; කිසලය:, අභිනව පල්ලවවූයේ; සමුද්‍රෙ, සාගරයෙහි; විද්‍රුමෞඝ:, ප්‍රවාලසමූහවූයේ; දිග්මාතඞ්ග, දිග්දන්තීන්ගේ; උත්තමාඞ්ගෙෂු, කුම්භස්ථලයෙහි; අභිනවනිහිත:, අළුත දෙනලද; සාන්ද්‍රසින්දූරරෙණු:, ඝනසිනි පිට්රජස්වූයේ; ව්‍යොම්න:, ආකාශයාගේ; සුවසීම්නි, සුවර්ණවූ පර්‍ය්‍යන්තයෙහි; සුරශිඛරිභුව:, මෙරු පර්වතය උත්පත්තිස්ථානකොට ඇති; හෙම්න:, සුවර්ණයාගේ; ප්‍රකාශ:, උද්‍යොතවූයේ; ජායතෙ, සම්භාවනා කරණුලැබේද හෙවත් අදහගන්නා ලැබේද; බරාංශො:, තීක්‍ෂණාංශුහුගේ; අසෞ, මේ; ශොභෛකදෙශ:, ශොභාවයේ ඒකදෙශයතෙම; ව:, තොපට; ශර්ම, සැපයක්; දිශතු, දේවා......

( 42 )

අස්තාද්‍රීශොත්තමාඞ්ගශ්‍රිතශශිනිතම:කාලකූටෙ
නිපීතෙ
යාති ව්‍යක්තිං පුරස්තාදරුණකිසලයෙ ප්‍රත්‍යුෂ:
පාරිජාතෙ,
උද්‍යන්තත්‍යාරක්තපීතාම්බරවිශදතරෙද්වීක්‍ෂිතා
තීක්‍ෂණභාසො
ලක්‍ෂ්මීර්ලක්‍ෂ්මීරිවාස්තු ස්ඵුටකමලපුටාපාශ්‍රයා
ශ්‍රෙයසෙ ව:......

අස්තාද්‍රි, අස්තපර්වතනමැති; ඊශ, මහදෙවියාගේ; උත්තමාඞ්ගශ්‍රිත, මස්තකය ඇසිරුකළාවූ; ශශිනි, චන්ද්‍රයා; තම:කාලකූටෙ, අන්ධකාරනමැති කාලකූටවිෂය; නිපීතෙ, පානයකළකල්හි; අරුණකිසලයෙ, අරුණාභිනවපත්‍රකොටඇති; නොහොත්, අරුණකිසලයෙ, රක්තපල්ලවයන් ඇති; ප්‍රත්‍යුෂ:පාරිජාතෙ, ප්‍රභාතකාල නමැති පාරිජාත වෘක්‍ෂය; ව්‍යක්තිංයාති, ප්‍රකාශභවට යනකල්හි; උද්‍යන්ති, උත්ගතවන්නාවූ; ආරක්ත, මදක් රත්වූ; පීත, රන්වන්වූ; අම්බර, ආකාශයෙහි; විශදතර, අතිනිර්මලවූ; උද්වීක්‍ෂිතා, දක්නාලද්දාවූ; නොහොත් ආරක්ත, ඊෂදනුරාගයෙන් යුක්තවූ; පීතාම්බර, විෂ්ණුහු විසින්; විශදතර, අතිප්‍රකාශව; උද්වීක්‍ෂිතා, දක්නාලද්දාවූ; ස්ඵුටකමලපුටාපාශ්‍රයා, විකසිත පද්මපුටයන්ට ආශ්‍රයවූ; නොහොත් ස්ඵුටකමලපුටාපාශ්‍රයා, ව්‍යක්තවූ පද්මපුටය වාසස්ථානකොට ඇති; එහෙයින් ලක්‍ෂ්මීරිව, ශ්‍රීකාන්තාවහා සදෘශවූ; තීක්‍ෂණභාස:, උෂ්ණරශ්මිහුගේ; ලක්‍ෂ්මී:, ශොභාතොමෝ; ව:, තොපට; ශ්‍රෙයසෙ, අභිවෘද්ධිය පිණිස; අස්තු, වේවා......

( 43 )

නොදන්වාන් ජන්මභූමිර්න තදුදරභුවො
බාන්ධවා: කෞස්තුභාද්‍යා
යස්‍යා: පද්මං න පාණෞ නච නරකාරිපුර:ස්ථලී
වාසවෙශ්ම,
තෙජොරූපා පරෙව ත්‍රිෂු භුවනතලෙෂ්වාදධානා
ව්‍යවස්ථාං
සා ශ්‍රී: ශ්‍රෙයාංසි දිශ්‍යාදශිශිරමහසො මණ්ඩලා
ග්‍රොද්ගතා ව:......

යස්‍යා:, යම් සූර්‍ය්‍යකාන්තිශ්‍රීයකට; උදන්වාන්, සමුද්‍රයතෙම; ජන්මභූමි:න, උත්පත්තිස්ථානනො

වේද; තදුදරභුවඃ, ඒ සමුද්‍රාභ්‍යන්තරය උත්පත්ති
ස්ථානකොට ඇති; කෞස්තුභාද්‍යාඃ, කෞස්තුභාදි
මාණික්‍යයෝ; නබාන්ධවාඃ, බන්‍ධුහු නොවේද්ද;
ප්‍රාණෙණ, එම සූය්‍යීගේ ගන්ධයෙහි; පද්මං, පද්
මයතෙම; නවාසවෙශ්ම, වාසගෘහනොවේද; නර
කරිපු, වාසුදෙවයාගේ; උරඃස්ථලීව, වක්‍ෂස්තල
යද; නවාසවෙශ්ම, වාසස්ථාන නොවේද; ත්‍රිභුව
නනලෙන්‍දු, ත්‍රෛලෝක්‍ය තලයෙහි; ව්‍යවස්ථාං
ආදධානා, පිහිටීම කරන්නාවූ; තෙජෝරූපා, තෙ
ජඃස්වරූපවූ; අපරාශ්‍රීඃ ඉව, අන්‍යලක්‍ෂ්මියක්වැනිවූ;
අශිශිරමහසඃ, උෂ්ණරශ්මිහුගේ; මණ්ඩලාග්‍රොද්
ගතා, මණ්ඩලපය්‍යීන්තයෙන් උද්ගතවූ; සාශ්‍රීඃ, ඒ
ශොභාවගතාමෝ; වඃ, තොපට; ශ්‍රෙයාංසි, මඞ
ල්‍යකාරණයන්; දිශ්‍යාත්, දේවා......රශ්මිවණී
නායි......

( 44 )

රක්‍ෂත්‍වක්‍ෂූණ්ණහෙමොපලපට්ලමලං
ලාඝවාදුත්පතන්තඃ
පාතඟාඃ පඟවවඤ්ජිතපවනජවා වාජිනසෙත
ජගන්ති
යෙෂාං විත්‍යාන්‍යවිඝ්නොන්නයමපි වහතාං
මාර්ගමාඛ්‍යාති මෙරු,
වුද්‍යන්නුද්දම දීප්තිද්‍යුමණිමණි ශිලා
වෙදිකාජාතවෙදඃ......

මෙරෞ, මෙරුපර්වතමස්තකයෙහි; විත්‍යාන්‍යවි
ඝ්න, විගතවූ අන්‍යවිඝ්නඇති හෙවත් අනික්
සලකුණක් නැත්තාවූ; උන්නයමපි, උත්ක්‍ෂිප්තිකර
ණය ඇතිවද හෙවත් උස්කිරීම් ඇතිකොටද; ව
හතාං, රථොවහනයකරන්නාවූ; යෙෂාං, යම් අශ්ව
කෙනෙකුන්ට; උද්‍යන්, උද්ගතවන්නාවූ; උද්දම
දීප්තිඃ, උඬවූ දීප්තිඇති; ද්‍යුමණිමණිශිලා, සූය්‍යී
කාන්තිපාෂාණමයවූ; වෙදිකා, පරිෂ්කෘත භූමිඇ
ති; ජාතවෙදඃ, වහ්නියතෙම; මාර්ගං, ගමන
මාර්ගය; ආඛ්‍යාති, කියාද; අක්‍ෂූණ්ණ, සුණුනො
කරණලද්දවූ; හෙමොපලපටලං, සවණීශිලාසං
ඝාත ඇතිව; අලං, සම්පූණීව; ලාඝවාත්, ලඝුභා
වයෙන් හෙවත් අතිශීඝ්‍රව; උත්පතන්තඃ, උද්ගත
වන්නාවූ; පඟවවඤ්ජිතපවනජවාඃ— පඟවවඤ්ච,
පිළුයයි යන අනාදරයෙන්; ජිත, දින්නලද; ප
වනජවාඃ, වාතවෙග ඇත්තාවූ; පාතඟාඃ, සූය්‍යීපුත්‍ර
බඩවූ; තෙ වාජිනඃ, ඒ අශ්වයෝ; ජගන්ති, ත්‍රිභුව
නයන්; රක්‍ෂන්තු, පාලනය කෙරෙත්වා......

( 45 )

ප්ලුෂ්ටාඃ පෘෂ්ඨෙ'ංශුපාතෛරතිනිකටතයා
දත්තදුඃඛාතිරෙකෛ
රෙකාහාක්‍රාන්ත කෘත්ස්නත්‍රිදිවපථපෘථුශ්වාස
ශොෂාඃ ශ්‍රමෙණ,
ත්‍රිව්‍රොදන්‍යාඃ ඝ්වරන්තාමහිතවිඝතයෙ සප්තයඃ
සප්තසප්තෙ
රභ්‍යාසාකාශගඞ්ගාජලසරලගලාවාග්‍රිතාග්‍රාන
නාවඃ......

අතිනිකටතයා, ඉතා ආසන්න බැවින්; දත්ත,
දෙනලද; දුඃඛාතිරෙකෛඃ, අධිකසන්තාපඇති;
අංශුපාතෛඃ, රශ්මිපතනයෙන්; පෘෂ්ඨෙ, පිට;
ප්ලුෂ්ටාඃ, දග්ධවූ; එකාහ, එකදවසින්; ආක්‍රාන්ත,
ඉක්මයනලද; කෘත්ස්නත්‍රිදිවපථ, සමස්තාකාශ
ඇති; පෘථුශ්වාසශොෂාඃ, මහත් ශ්වාසයෙන් ශොෂ
ණය ඇත්තාවූ; ශ්‍රමෙණ, ශරීරඛෙදය හෙතු
කොටගෙණ; තීව්‍ර, තදවූ; උදන්‍යාඃ, පිපාසාඇත්
තාවූ; අභ්‍යාස, සමීපවතීවූ; ආකාශගඞ්ගාජල, අහස්
ගඟදියෙන්; සරලගල, සෘජුවූ කණ්ඨයන් හා;
අවාග්‍රිතඅග්‍රානනාඃ—අවාග්‍රිත, අවනතාග්‍රකරණලද;
අග්‍රානනාඃ, මුඛාග්‍රයන් ඇත්තාවූ; සප්තසප්
තෙඃ, සූය්‍යීගේ; සප්තයඃ, අශ්වයෝ; වඃ, තොප
ගේ; අහිතවිඝතයෙ, ශත්‍රුනාශය පිණිස; ඝ්වරන්
තාං, හුහුසුලුවෙත්වා......

( 46 )

මත්‍වාන්‍යාන් පාශ්වීතො'ශ්වාන් ස්ඵටිකතටදෘෂද්
දෘශ්‍යමානාද්‍රවන්ති
ව්‍යසෙන'හන්‍යස්තසඞ්ඛ්‍යයමිති මෘදුපද්‍
පද්මරාගොපම ලඝු
සාදෘශ්‍යාදෘශ්‍යමූතීමීරකතතදෘෂදි සාල්ෂටසූතා
සුමෙරොර්
මූඊන්‍යාවෘත්තිලබ්ධධ්‍රුවගතිරවතු බ්‍රධ්න
වාහාවලීවඃ......

ස්ඵටිකතට, ස්ඵටික මාණික්‍යතටය සම්බන්ධවූ;
දෘෂත්, පාෂාණයෙහි; දෘශ්‍යමානා, ප්‍රතිබිම්බිතව පෙ
ණෙමින්; පාශ්වීතඃ, දෙපසෙහි; අන්‍යාන්අශ්වාන්
මත්වා, අන් අශ්වයෝයයි සිතා; ද්‍රවන්ති, ධාවනය

කරන්නාවූ; අහනි, දිනයා; ව්‍යසෙන, අසඞ්ක්ෂිප්තකල්හි; පද්මරාගොපලෙෂු, පද්මරාගමාණික්‍ය ශිලාතලයෙහි; අස්තසන්ධ්‍යා, අස්තපර්වතයෙහි සන්ධ්‍යාතොමෝ; ඉයම්ති, මෝයයි. යන සන්ධ්‍යා භ්‍රාන්තියෙන්; මෘදුපද, මොලොක්වූ පාදචාර ඇති හෙවත් ලැසිගමන් ඇත්තාවූ; මරකතදෘෂදි, මරම්ණිමයවූ පර්වතයෙහි; සාදෘශ්‍යාදෘශ්‍යමූර්තීඃ, වර්ණසාදෘශ්‍යය හෙතුකොටගෙණ අදෘශ්‍යමාන මූර්තී ඇත්තාවූ; කල්පිෂ්ටසූතා, මෙසේ කිසිතැනෙක අස්ථානයෙහි දිව්මෙන්ද කිසිතැනෙක ලැසිගමනින්ද කිසිතැනෙක අදෘශ්‍යමූර්ති ඇති බැවින්ද පීඩිතවූ රථාචාර්‍යයා ඇත්තාවූ; සුමෙරොඃ, මෙරු පර්වතයාගේ; මූර්ධ්නි, මස්තකයෙහි; ආවෘත්ති, කැර කැවීමෙන්; ලබ්ධ, ලබනලද; ධ්‍රැවගතිඃ, නිත්‍ය ගති ඇත්තාවූ; බ්‍රධ්නවාහාවලී, සූර්‍යයාශ්වපඞ්ක්ති තොමෝ; වඃ, තොප; අවතු, රක්ෂාකෙරේවා.

( 47 )

හෙලාලොලං වහන්ති විෂධරදමනස්‍යාග්‍ර
ජෙනාවකෘෂ්ටා
සවර්ණාභිඛ්‍යාඃ සුදූරං ජනිතජවජයා ස්‍යන්දනස්‍ය
ස්‍යදෙන,
නිර්ව්‍යාජං භ්‍රාජමානෙ හරිතිමනි නිජෙ ස්ඵීත
ජේතසම්තශ්‍රී
රශ්‍රෙයාංස්‍යශ්වපඞ්ක්තිඃ ශමයතු යමුනෙවාපරා
තාපතීවඃ

හෙලාලොලං, අනාදරයෙන් චඤ්චලව; වහන්ති, රථොවහනයකරන්නාවූ; විෂධරදමනස්‍ය, ගරුඩයාගේ; අග්‍රජෙන, ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ අරුණයා විසින්; අවකෘෂ්ටා, ආකර්ෂණය කරණලද්දාවූ; නොහොත්, විෂධරදමනස්‍ය, කාලියදමනවූ කෘෂ්ණයාගේ; අග්‍රජෙන, ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ බලභද්‍රයා විසින්; අවකෘෂ්ටා, ආකර්ෂණය කරණලද්දාවූ; ස්‍යන්දනස්‍ය, රථයාගේ; ස්‍යදෙන, වෙගයෙන්; නොහොත්, ස්‍යන්දනස්‍ය ස්‍යදෙන, ජලප්‍රවාහයාගේ වෙගයෙන්; සවර්ණාභිඛ්‍යාඃ, ආකාශගඞ්ගාවගේ; සුදූරං, අතිශයවත්වූ දූරව; ජනිත, උපදවනලද; ජව, වෙගයාගේ; ජයා, උත්කර්ෂඇත්තාවූ; නිර්ව්‍යාජංභ්‍රාජමානෙ, ස්වභාවයෙන් බබලන්නාවූ; නිජෙ, ස්වකීයවූ; හරිතිමනි, කෘෂ්ණත්වයෙහි; ස්ඵීත, බොහෝවූ; ජේත, පෙතරුස්ම; සමිතශ්‍රීඃ, හාසශොභාකොටඇති; අපරායමුනාඉව, යථොක්ත කාරණයෙන් අනික් යමුනා ගඞ්ගාවක් හා සදෘශවූ; තාපතී, තපනයා සම්බන්ධිවූ; අශ්වපඞ්ක්තිඃ, අශ්වපරම්පරාතොමෝ; වඃ, තොපගේ; අශ්‍රෙයාංසි, අවැඩ; ශමයතු, සන්සිඳුවාවා හෙවත් නසාවා.

( 48 )

මාර්ගොපාන්තෙ සුමෙරොර්නුවති කෘතනතෞ
නාකධාම්නාං නිකායෙ
වීක්ෂ්‍ය ව්‍රීඩාවතීනාං ප්‍රතිකුහරමුඛං කින්නරීණාං
මුඛානි,
සූතෙ'සූයත්‍යපීෂජ්ජඩගතිවහතාං කන්ධරා
ග්‍රෛර්වලද්භිර්
වාහානාං ව්‍යස්‍යතාද්වඃ සමමසමහරෙර්හෙෂිතං
කල්මෂාණි

කෘතනතෞ, කරණලද නමස්කාරඇති; නාකධාම්නාංනිකායෙ, දෙවසමූහයා; නුවති, සඞ්කරණකල්හි; මාර්ගොපාන්තෙ, සූර්‍යයාගේ ගම්මාර්ග සමීපයෙහි; සුමෙරොඃ, මෙරුපර්වතයා සම්බන්ධිවූ; ප්‍රතිකුහරමුඛං, පර්වතගුහාද්වාරයක්පාසා; ව්‍රීඩාවතීනාං, ලජ්ජාඇත්තාවූ; කින්නරීණාං, අශ්වමුඛකින්නරාඞ්ගනාවන්ගේ; මුඛානි, මුඛයන්; වීක්ෂ්‍ය, බලා; සූතෙ, රථාචාර්‍යයා; අසූයත්‍යපි, ඊර්ෂ්‍යාකරද්දීත් හෙවත් නොඉවසනකල්හිද; ඊෂජ්ජඩගති, මදක් මන්දගතිව; වහාතාං, රථයඇදනාවූ; අසමහරෙඃ, සප්තාශ්වයාගේ හෙවත් සූර්‍යයා සම්බන්ධිවූ; වාහානාං, අශ්වයන්ගේ; වලද්භිඃ, අශ්වමුඛීන්ගේ මුහුණු කරකැවී බලන්නාවූ; කන්ධරාග්‍රෛඃ, ග්‍රීවාග්‍රයන්හා; සමං, එකවටවූ; හෙෂිතං, හෙසාරවයතෙම; වඃ, තොපගේ; කල්මෂාණි, පාපයන්; ව්‍යස්‍යතාත්, දුරුකෙරේවා.

( 49 )

ධුන්වන්තොනීරදාලීර්නිජරුචිහරිතාඃ පාර්ශ්ව
යොඃපක්ෂතුල්‍යාස්
තාලූත්තානෙඃ බලීනෙඃ ඛචිතමුඛරුචඃ
ශෙවභාතතා ලොහිතෙන
උඩ්ඩීයෙව ව්‍රජන්තො වියති ගතිවශාදර්කවාහාඃ
ක්‍රියාසුඃ
ක්ෂෙමං හෙමාද්‍රිහෘද්‍යද්‍රුමශිඛරශිරඃශ්‍රෙණි
ශාඛාශුකාවඃ

පාශ්වයොඃ, උභයපාශ්වයෙහි; නිජරුචිගරීතාඃ, තමන්ගේ දේහකාන්තියමෙන් නිල්පැහැඇති; පක්ෂතුල්‍යාඃ, පක්ෂපත්‍රයන්හා සදෘශවූ; නීරදාලීඃ, මෙඝපන්තීන්; ධුන්වන්තඃ, කම්පාකරන්නාවූ; තාලූතතාංශෙනඃ, වක්ත්‍රෙකදෙශයෙහි හෙවත් තාලුප්‍රදෙශයෙහි ලග්නවූ; බලිනෙඃ, කඩියාල මින්; ශෙව්‍යාතතා, වැෂෙහත්නාවූ; ලොහිතෙන, රක්තයෙන්; බච්තමුඛරුචඃ, කරණලද සුරක් තවූ මුඛශොභාඇති; වියති, ආකාශයෙහි; ගච්ඡ ශාන්, ගන විසින්; උඩ්ඩියඉව, පියාසරකොට මෙන්; ව්‍රජන්තඃ, ගනනාවූ; හෙමාද්‍රි, සවර්ණමෙරු පර්වතනාමැති; හෘද්‍ය, චිත්තප්‍රීතිකරවූ; ද්‍රුම, වෘක්ෂයා සම්බන්ධවූ; ශිඛර, ශෘඞ්ගයන්ගෙ; ශිරඃශ්‍රෙණී, අග්‍ර භාගපඞ්ක්තිනාමැති; ශාඛා, අතුපතරෙහි, ශුකාඃ, ගිරවුන්වැනි; අර්කවාහාඃ, සූය්‍ය්‍යාශ්වයෝ; වඃ, තොපට; ක්ෂෙමං, ක්ෂාන්තියක්; ක්‍රියාසුඃ, කෙරෙත්වා. අශ්වවර්ණනායි.

( 50 )

ප්‍රාතඃ ශෛලාග්‍රරඞ්ගෙ රජනිජවනිකාපාය
සංලක්ෂ්‍යලක්ෂ්මීර්
වික්ෂිප්‍යාපූර්වපුෂ්පාඤ්ජලිමුඩුනිකරං සූත්‍රධාරාය
මාණඃ,
යාමෙෂ්වෙෂකෂ්විචාහ්නඃ කෘතරුචිෂු චතුෂ්වෙව
ජාතප්‍රතිෂ්ඨා
මව්‍යාත් ප්‍රසතාවයන්වො ජගදවතමශානාටිකාං
සූය්‍ය්‍යසූතඃ.

ප්‍රාතඃ, දිවසාරම්භයෙහි; ශෛලාග්‍ර, උදයගිරි ශිඛර නාමැති; රඞ්ගෙ, රඞ්ගමණ්ඩලෙහි; රජනිජවනි කා, රාත්‍රිනාමැති තිරස්කරණිය; අපාය, පහවී මෙන්; සංලක්ෂ්‍යලක්ෂ්මීඃ, දෘශ්‍යමානවූ ශොභාඇති; අපූර්වපුෂ්පාඤ්ජලිම්, අභිනව පුෂ්පාඤ්ජලියක්බඳු; උඩුනිකරං, තාරකාසමූහය; වික්ෂිප්‍ය, විසුරුවා; කෘතරුචිෂු, කරණලද දීප්තිඇති; චතුෂු අඞ්ක ශුඉව, චතුර්විධනාටකාඞ්කයෙහිමෙන්; අහ්නඃ, දි නයාගේ; චතුෂුයාමෙෂ්වෙව; සතරයාමයෙහිම; ජාතිප්‍රතිෂ්ඨාං, සමුත්පන්නවූ ප්‍රතිෂ්ඨාඇති; ජග දවන, ජගත්‍රය පරිභ්‍රමණබ්‍යාවූ; මහානාටිකාං, මහානාටිකාව; ප්‍රස්තාවයන්, ප්‍රස්තාවනා කරන් නාවූ හෙවත් ප්‍රාරම්භකරන්නාවූ; සූත්‍රධාරායමා ණඃ, නාටකාචාය්‍යයෙකු වැනිවූ; සූය්‍ය්‍යසූතඃ, සූය්‍ය්‍ය රථාචාය්‍යතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙ රේවා.

( 51 )

ආක්‍රාන්ත්‍යා වාහ්‍යමානං පශුම්ව හරිණා
වාහකො'ග්‍රොහරිණාං
භ්‍රාම්‍යන්තං පක්ෂපාතාජ්ජගති සමරුචිඃ
සර්වකර්මෛකසාක්ෂී,
ශත්‍රුං නෙත්‍රශ්‍රුතීනාමපජයති වයොජ්‍යෙෂ්ඨ
භාවෙ සමෙ'පි
සප්‍රාම්නා ධාම්නාං නිධෙය්‍යඃ ස භවදසුහදෙ
න්‍යූනතඃ ස්තාදනූරුඃ.

යම්, යම් රථාචාය්‍යයෙක්තෙම; හරීණං, හරි ශබ්දවාච්‍යවූ බොහෝ නීලාශ්වයන්ලවා, අග්‍රඃ වා හකඃ, රථොවහනයකරන්නාවූ අග්‍රවාහකවූ; හරි ණා, සිංහයා විසින්; ආක්‍රාන්ත්‍යා, මර්දනයකිරි මෙන්; වාහ්‍යමානං, ආශ්වාදනයකරණුලබන්නා වූ; පශුම්ව, ගවයෙකුමෙන්; හරිණා, විෂ්ණුහු විසින්; ආක්‍රාන්ත්‍යා, අභිභවනයකිරීමෙන්; වාහ්‍ය මානං, උවහනයකරණුලබන්නාවූ; නෙත්‍රශ්‍රැති නාං, සර්පයන්ට; ශත්‍රුං, ශත්‍රුවූ ගරුඩයා; අපජය ති, අභිභවනයකෙරේද; සමරුචිඃ, සමානාභිලාෂ ඇත්තේ අපක්ෂපාතවූයේ; පක්ෂපාතාත්, පක්ෂප්‍ර සාරණය කිරීමෙන්-නොහොත් පක්ෂපාතාත්, පක්ෂ පාතවීමෙන්; භ්‍රාම්‍යන්තං, භ්‍රමණයකරන්නාවූ; නෙත්‍රශ්‍රැතිනාංශත්‍රුං, ගරුඩයා; අපජයති, අභි භවනයකෙරේද; වයොජ්‍යෙෂ්ඨභා'වේ තමාගේ වයසින් ජ්‍යෙෂ්ඨභාවය ඔහුගේ පක්ෂීන්ට ජ්‍යෙෂ්ඨ භාවය යන දෙදෙනාගේ; සමෙපි, සමානකල්හිද; ධාමනාංනිධෙඃ, තෙජොනිධානවූ සූය්‍ය්‍යයාගේ; සප්‍රාම්නා, බලයෙන්; නෙත්‍රශ්‍රැතීනාංශත්‍රුය, ගරු ඩයා; අපජයති, මැඩපවතීද; ජගති, ලොකයෙහි; සර්වකර්මෛකසාක්ෂී, සකල ක්‍රියාවන්ට අසහාය සාක්ෂිවූ හෙවත් ලොකයෙහි සකලකර්මයන් ප්‍රත්‍යක්ෂයෙන් දක්නාවූ; න්‍යූනනඃ, අභිනවවූ; සඃ අනූරුඃ, ඒ අරුණනම් රථාචාය්‍යතෙම; භවත්, පින්වතුන්ගේ; අසුහදෙ, පාපප්‍රහාණය පිණිස; ස්තාත්, වේවා.

වයසාංපක්ෂිනාඤ්ජ්‍යෙෂ්ඨඃ වයොජ්‍යෙෂ්ඨඃසුපර්ණඃ
වයසාගරුඩස්‍ය ජ්‍යෙෂ්ඨොවයොජ්‍යෙෂ්ඨො
ගරුඩාග්‍රජොනූරුඃ.

( 52 )

දත්තාර්ඝෛර් දූරනම්‍රෛර්වියති විනයතො වීක්ෂිතඃ
සිද්ධසාර්ථෛඃ
සානාථ්‍යං සාරථිර්වඃ ස දශශතරුචඃ සාතිරෙකං
කරොතු,
ආපීය ප්‍රාතරෙව ප්‍රතතහිමපයඃස්‍යන්දිනීරින්දුභාසො
යඃ කාෂ්ඨාදීපනො'ග්‍රෙ ජඩිතඉව භෘශං සෙවතෙ
පෘෂ්ඨතො'ර්කම්—

යඃ, යම් රථාචාර්‍යයෙක්තෙම; ප්‍රාතරෙව, උදය කාලයෙහිම; ප්‍රතත, නිරන්තරව පතළාවූ; හිම පයඃ, තුෂාර ජලය; ස්‍යන්දිනීඃ, වහනයකරන්නාවූ; ඉන්දුභාසඃ, සඳපහන; ආපීය, පානයකොට; භෘශං, අත්‍යර්ථයෙන්; ජඩිතඃඉව, ශීතපීඩිතයක්හු මෙන්; අග්‍රෙ, අභිමුඛයෙහි; කාෂ්ඨ, ඉන්ධනයන් හෙවත් දර; ආදීපනඃ, උජ්වලනයකරන්නේ— නොහොත් කාෂ්ඨාදීපනඃ, දශදිගුත් ඒකාලොක කරන්නේ; පෘෂ්ඨතඃ, පිටිපසින්; අර්කංසෙවතෙ, ඉරිදෙවියා සෙවුනේද හෙවත් අවුතපනේද; වියති, ආකාශයෙහි; දත්තාර්ඝෛඃ, දෙනලද අර්ඝඇති හෙවත් කරණලද පූජාඇති; විනයතඃ, ආදරයෙන්; දූරනම්‍රෛඃ, දුරින්ම අවනතවූ; සිද්ධසාර්ථෛඃ, සිද්ධගණයා විසින්; වීක්ෂිතඃ, දක්නාලද්දාවූ; දශශතරුචඃ, සහස්‍රරශ්මිහුගේ; සඃ සාරථිඃ, ඒ අරුණනම් රථාචාර්‍යයතෙම; වඃ, තොපට; සාතිරෙකං, අධිකභාවයෙන් යුක්තවූ; සානාථ්‍යං, සනාථභාවය හෙවත් පිහිට ඇතිබව; කරොතු, කෙරේවා—

( 53 )

මුෂ්ණන් රශ්මීන් දිනාදෞ දිනගමසමයෙ
සංහරංශ්ච ස්වතන්ත්‍ර
ස්තොත්‍රප්‍රඛ්‍යාතවීර්‍යො විරතහරිපදාක්‍රාන්ති
බද්ධාභියොගඃ,
කාලොත්කර්ෂාල්ලඝුත්වං ප්‍රසභමධිපතෞ
යොජයන් යොද්විජානාං
සෙවාප්‍රීතෙන පූෂ්ණා ස්වසමඉව කෘතස්ත්‍රා
යතාං සො'රුණොවඃ—

යඃ, යම් රථාචාර්‍යයෙක්තෙම; දිනාදෞ, දිනමුඛයෙහි හෙවත් උදාසන්හි; රශ්මීන්, රැහැන්; මුෂ්ණන්, ලිහිල්කරන්නේ; දිනගම සමයෙ, දිවසාවසානයෙහි; සංහරංශ්ච, හකුළුවන්නේද— නොහොත්, දිනාදෞ, උදාසන්හි; රශ්මීන්, කිරණයන්; මුෂ්ණන්, විහිදුවන්නේද; දිනගමසමයේ, දිනාපගමන කාලයෙහි; සංහරංශ්ච, සංක්ෂෙපකරන්නේද; ස්වතන්ත්‍රඃ, ස්වච්ඡාචාර ඇත්තේ; ස්තොත්‍රප්‍රඛ්‍යාතවීර්‍යඃ—ස්තොත්‍ර, කැහැට දණ්ඩෙන්; ප්‍රඛ්‍යාතවීර්‍යඃ, නිෂ්පන්න සාමර්ථ්‍ය ඇතියේ—නොහොත්, ස්තොත්‍ර, ස්තුතිකිරීමෙන්; ප්‍රඛ්‍යාතවීර්‍යඃ, ප්‍රසිද්ධවූ ආනුභාඇතියේ; විරත, ගමන්නැති; හරිපද, අශ්වපාදයන්; ආක්‍රාන්ති, ඉක්මපීමෙහි; බද්ධාභියොගඃ, ජාතොත්සාහ ඇත්තේ—නොහොත්, අවිරත, නිරන්තරයෙන්; හරිපද, විෂ්ණුපදයාගේ හෙවත් ආකාශයාගේ; ආක්‍රාන්ති, ඉක්මවීමෙහි; බද්ධාභියොගඃ, ජාතොත්සාහ ඇත්තේ; කාලොත්කර්ෂාත්, කාලයාගේ උත්කර්ෂයෙන් හෙවත් තමා ගරුඩයාට පූර්වකාලයෙහි ජනිතවූහෙයින්; ද්විජානාං, පක්ෂීන්ට; අධිපතෞ, නායකවූ ගරුඩයා කෙරෙහි; ප්‍රසභං, බලාත්කාරයෙන්; ලඝුත්වං, ලඝුභාවය; යොජයන්, යොදන්නේ—නොහොත්, කාලොත්කර්ෂාත්, රාත්‍රිකාලයට දිවසාඛ්‍ය කාලයාගේ උත්කර්ෂය හෙතුකොටගෙණ; ද්විජානාං, තාරකාවන්ට; අධිපතෞ, නායකවූ චන්ද්‍රයාකෙරෙහි; ප්‍රසභං, ලාභෙලා; ලඝුත්වං යොජයන්, ලඝුත්වය යොදන්නේ; සෙවාප්‍රීතෙන, පරිචර්‍යාවෙහි සතුටුවූ; පූෂ්ණා, සූර්‍යයා විසින්; ස්වසමඉවකෘතඃ, ආත්ම සදෘශ කරණලද්දක්හු මෙන් වූයේද; සඃ අරුණඃ, ඒ අරුණනම් රථාචාර්‍යයතෙම; වඃ, තොප; ත්‍රායතාං, රක්ෂාකෙරේවා—

මෙහි ස්වතන්ත්‍රස්තොත්‍ර යන්නෙහි අරුණයාගේ විශෙෂණ පක්ෂයෙහි ස්වතන්ත්‍රඃස්තොත්‍ර යන පදච්ඡෙදයෙහි විසර්ජනීයහට සකාරවෙසි—සූර්‍යවිශෙෂණ පක්ෂයෙහි ඛපීරෙශරිවා ලොපොවක්තව්‍යඃ යන්නෙන් විසර්ජනීය ලොප්ව එකමසකාරයෙක්ව තිබේ—

( 54 )

ශාතඃ ශ්‍යාමාලතායාඃ පරශුරිව තමො'රණ්‍ය
වහ්නෙරිවාර්චිඃ
ප්‍රචේ‍යවාග්‍රෙ ගෘහීතුං ග්‍රහකුමුදවනං ප්‍රාගු
දග්‍රො'ග්‍රහස්තඃ
ඓක්‍යං භින්දන්ද්‍යුභූම්‍යොරවධිරිව විධාත්‍රෙව
විශ්වප්‍රබොධං
වාහානාං වො විනෙතා ව්‍යපනයතු විපත්
නාම ධාමාධිපස්‍ය—

ශ්‍යාමාලතායාඃ, රාත්‍රි නමැති ලතාවට; ශාතඃ, තීක්ෂණවූ; පරශුරිව, පොරොවක් වැනිවූ; තමඃ, අරණ්‍යවහ්නෙඃ, අන්ධකාර නමැති වනයෙහි දවාන්නිහුගේ; අර්චිරිව, ශිඛාවක් වැනිවූ; ප්‍රාච්‍යා, පූර්වදිශාව විසින්; අග්‍රෙ, ඉදිරියෙහි හෙවත් ආදිකොට; ග්‍රහකුමුදවනං, ග්‍රහතාරකා නමැති කොරව සමූහයා; අග්‍රෙගෘහීතුං, සෙසුදිගුණ්ට පළමුකොට ඇරගන්නා පිණිස; ප්‍රාක්, පූර්වම; උද්ගෘඃ, ඔසවනලද; අග්‍රහස්තඉව, හස්තාග්‍රය වැනිවූ; ද්‍යුභූම්‍යොඃ, අහස් පොළෝ දෙදෙනාගේ; ඓක්‍යං, එකත්වය; භින්දන්, වෙන්කරන්නාවූ; අවධිරිව, සීමාවක් වැනිවූ; විශ්වප්‍රබොධං, ජගත්‍රය වාසීන්ගේ නිද්‍රාප්‍රබොධය; විධාතාඑව, කරන්නාම වූ; ධාමාධිපස්‍ය, හිරුගේ; වාහානාං විනෙතා, අශ්වවිනයනයකරන්නාවූ අරුණනම් රථාචාර්‍යතෙම; වඃ, තොපගේ; විපත්නාම, විපත්නම්දෙය හෙවත් දරිද්‍රය; ව්‍යපනයතු, දුරුකෙරේවා.

( 55 )

පෞරස්ත්‍යස්තොයදත්තෞඃ පවනඉව පතන්
පාවකස්‍යෙව ධූමො
විශ්වස්‍යාදිසර්ගඃ ප්‍රණවඉව පරං පාවනං
වෙදරාශෙඃ,
සන්ධ්‍යානෘත්තාරම්භෙ ස්වෙච්ඡාරිව මදන
රිපොර්නන්දිනාන්දීනි නාදඃ
සෞරස්‍යාග්‍රෙ සුඛංවො විතරතු විනතා
නන්දනඃ ස්‍යන්දනස්‍ය.

තොයදත්තෞඃ, වර්ෂාඍතුවට; පෞරස්ත්‍යඃ, පෙරදිග; පතන්, හෙන්නාවූ; පවනඉව, මාරුතය මෙන්ද; පාවකස්‍ය, වහ්නියට; ධූමඉව, පෙරටුව සිටියාවූ ධූමය මෙන්ද; විශ්වස්‍ය, සමස්තලොකයහට; ආදිසර්ගඉව, ප්‍රථමසෘෂ්ටි කාලයමෙන්ද; වෙදරාශෙඃ, වෙදසමූහයාට අග්‍රෙසරවූ; පරංපාවනං, අතිශයින් පවිත්‍රවූ; ප්‍රණවඉව, ඕංකාරයමෙන්ද; සන්ධ්‍යානෘත්තාරම්භෙ, සන්ධ්‍යාකාලයෙහි නෘත්‍යාරම්භ කැළැත්තාවූ; මදනරිපොඃ, මහදෙවියාට අග්‍රෙසරවූ; නන්දි, නන්දිනම් වාද්‍යකාරයාගේ; නාන්දීනිනාදඉව, මෘදඞ්ග භෙරිනාදයක්මෙන්ද; සෞරස්‍ය, සූර්‍ය්‍ය ප්‍රතිබද්ධවූ; ස්‍යන්දනස්‍ය, රථයාගේ; අග්‍රෙ, ඉදිරියෙහි සිටියාවූ; විනතානන්දනඃ, විනතාවගේ පුත්‍රවූ අරුණතෙම; වඃ, තොපට; සුඛං, සැපයක්; විතරතු, දේවා.

( 56 )

පර්‍ය්‍යාප්තං තප්තචාමීකරකටකතටෙ ශ්ලිෂ්ටශීතෙතරාංශෞ
වාසීදත් ස්‍යන්දනාශ්වානුකෘතිමරකතෙ පද්මරාගායමාණඃ,
යඃ සොත්කර්ෂාං විභූෂාං කුරුතඉව කුලක්ෂ්මාභෘදීශස්‍ය මෙරො
රෙනාංස්‍යහනාය දූරං ගමයතු ස ගුරුඃ
කාද්‍රවෙයද්විෂොවඃ.

යඃ, යම් රථාචාර්‍යයෙක්තෙම; ශ්ලිෂ්ටශීතෙතරාංශෞ, ලග්නඋෂ්ණ රශ්මීහු ඇති; ආසීදත්, හාත්පසින් ගැලෙන්නාවූ; ස්‍යන්දනාශ්වානුකෘති, රථාශ්වයන් හා සදෘශවූ; මරකතෙ, මරකත මාණික්‍ය ඇති; තප්තචාමීකර කටකතටෙ, උත්තප්තවූ සවර්ණකටකයාගේ පර්‍ය්‍යන්තයෙහි; පද්මරාගායමාණඃ, පද්මරාගමාණික්‍යයක්මෙන් වූයේ; කුලක්ෂ්මාභෘදීශස්‍ය, කුලපර්වතයන්ට රජන්වූ; මෙරොඃ, මහාමෙරු පර්වතයහට; සොත්කර්ෂාං, සාතිශයවත්වූ; භූෂාං, ආභරණයක්; පර්‍ය්‍යාප්තං, සම්පූර්ණකොට; කුරුතෙඉව, කරන්නක්හුමෙන්; කාද්‍රවෙයද්විෂඃ, ගරුඩයාට; ගුරුඃ, ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ; සඃ, ඒ අරුණතෙම; වඃ, තොපගේ; එනාංසි, පාපයන්; අහනාය, වහා; දූරං, දුරට; ගමයතු, පමුනුවාවා.

( 57 )

නීත්වාශ්වාන් සප්තකක්ෂ්‍යාඉව නියමවශං
වෙත්‍රකල්පප්‍රතොදස්
තූර්ණංධ්වාන්තස්‍ය රාශාවිතරජනඉවොත්සා
රිතෙ දූරභාජි,
පූර්වං පුෂ්ණොරථස්‍ය ක්ෂිතිභෘදධිපතීන් දර්ශ
යංස්ත්‍රායතාං වස්
ත්‍රෛලොක්‍යස්ථානදානොද්‍යත දිවසපතෙඃ
ප්‍රාක්ප්‍රතීහාර පාලඃ.

අශ්වාන්සප්ත, රථාශ්වයන් සත්දෙනා; සප්තකක්ෂ්‍යාඉව, සප්තවිධවූ අභ්‍යන්තර භවනස්ථ ජනයාමෙන්; නියමවශං, නියමවසයට නොහොත් බන්ධනවසයට; නීත්වා, පමුනුවා; වෙත්‍රකල්පප්‍රතොදඃ, වෙත්‍රයෂ්ටිය හා සදෘශ කැහැටදඬු ඇත්තේ; ධ්වාන්තස්‍යරාශෞ, අන්ධකාර සමූහය; දූරභාජි, දුරුතැන්සෙවුනාවූ; ඉතරජනෙඉව, අව

ශිඛට ජනයාමෙන්; තූෂ්ණීං, වහා; උත්සාරිතෙ, පහකලකල්හි; පූර්වං, පලමුකොට; ක්ෂිතිභෘද්ධිප ත්න්, හිමවත්මන්දර පර්වතාදි රාජයන්; දර්ශයන්, දක්වන්නාවූ; ත්‍රෛලොක්‍යාස්ථානදානොද්‍යතදිව සපතෙඃ—ත්‍රෛලොක්‍යය, ජගත්‍රය වාසීන්ට; ආස්ථා නදාන, ආස්ථානදීමෙහි හෙවත් දැකුම් දීමෙහි; උද්‍යත, ප්‍රාරම්භකරන්නාවූ; දිවසපතෙඃ, ආදිත්‍ය යාගේ; ප්‍රාක්ප්‍රතිහාරපාලඃ, පූර්වද්වාරපාලවූ; රථස්‍ය ප්‍රෂ්ඨඃ, රථාග්‍රගාමිවූ අරුණතෙම; වඃ, තොප; ත්‍රා යතාම්, රක්ෂාකෙරේවා.

( 58 )

වජ්‍රීන් ජාතං විකාශීක්ෂණකමලවනං
භාසි නො භාසි වහ්නෙ
තාතං නත්වාශ්වපාර්ශ්වාන් නය යම මහිෂං
රාක්ෂසා වීක්ෂිතාඃ ස්ථ
සප්තීන් සිඤ්ච ප්‍රචෙතඃ පවන භජ ජවං
විත්තපාවෙදිතස්ත්වං,
වන්දෙ ශර්වෙති ජල්පන් ප්‍රතිදිශමධිපාන් පාතු
පූෂ්ණෝ'ග්‍රණීර්වඃ.

වජ්‍රීන්, එම්බා වජ්‍රපාණිය; ඊක්ෂණකමල වනං, තාගේ සහස්‍රනෙත්‍ර නමැති පද්මෂණ්ඩය; වි කාශිජාතං, ප්‍රබුද්ධවූයේය; වහ්නෙ, එම්බා වහ්නි දෙවතාව; භාසි, අන්‍යදීයවූ ආලොකය ඇතිකල්හි; නොභාසි, නොබබලන්නෙහිය; යම, එම්බා යම දෙවරාජය; තාතංනත්වා, පියානන් වැඳ; අශ්ව පාර්ශ්වාන්, අශ්වයන් කෙරෙන්; මහිෂං, භාශවන විරුද්ධවූ මහිෂයානය; නය, බැහැරගෙණයා; රාක්ෂ සාඃ, එම්බා රාක්ෂසයෙනි; වීක්ෂිතාඃස්ථ, තොපි හැම දක්නාලද්දහ; ප්‍රචෙතඃ, එම්බා වරුණරාජය; සප් තීන්, ශාන්තවූ රථාශ්වයන්; සිඤ්ච, තෙම; පවන, එම්බා මාරුතය; ජවංභජ, වෙගජනයකර; විත්තප, එම්බා කුවෙරය; ත්වං, තොපි; ආවෙදිතඃ, ස්වාමීන් කුවෙරයා වදනේයි මාවිසින් දන්වන ලද්දෙහිය; ශර්ව, ඊශ්වරය; වන්දෙ, වදිමි; ඉති, මේ උක්තප්‍රකාරයෙන්; ප්‍රතිදිශමධිපාන්, දිශාවක් දිශාවක්පාසා දිග්නාථයන්ට; ජල්පන්, කියන් නාවූ; පූෂ්ණඃ, හිරුගේ; අග්‍රණීඃ, අග්‍රෙසරතෙම හෙවත් අරුණතෙම; වඃ, තොප; පාතු, රක්ෂා කෙරේවා.

( 59 )

පාශානාශාන්තපාලාදරුණ වරුණතො මාගෘහීඃ
ප්‍රග්‍රහාර්ථං
තෘෂ්ණාං කෘෂ්ණස්‍ය චක්‍රෙ ජහිහි නහි රථො
යාති මෙ නෛකචක්‍රඃ,
යොක්තුං යුග්‍යං කිමුච්චෛඃශ්‍රවසමභිලෂස්‍යෂ්ටමං
වෘත්‍රශත්‍රොස්
ත්‍යක්තාන්‍යාපෙක්ෂවිශ්වොපකෘතිරිති රවිඃ
ශාස්ති යං සො'වතාද්වඃ.

අරුණ, එම්බා අරුණය; ආශාන්තපාලාන්; දිගාන්තපාලනයකරන්නාවූ; වරුණතඃ, වරුණ යා කෙරෙන්; ප්‍රග්‍රහාර්ථං, රථරුණ පිණිස; පා ශාන්, පාශයන්; මාගෘහීඃ, නොගණු; කෘෂ්ණස්‍ය, විෂ්ණුහුගේ; චක්‍රෙ, සුදර්ශනනම් චක්‍රයෙහි; තෘෂ් ණාං, ආශාව; ජහිහි, හැරපියා; මෙ, මාගේ; රථඃ, රථයතෙම; එකචක්‍රඃ, එකචක්‍රවූයේ; නයාති, නොයන්නේ නොවෙයි හෙවත් යන්නේමය; වෘත්‍රශත්‍රොඃ, වෘත්‍රනම් රාක්ෂසයාට ශත්‍රුවූ ඉන්ද්‍රයාගේ; යුග්‍යං, වාහනයොග්‍යවූ; උච්චෛඃශ්‍ර වසං, අශ්වයා; අෂ්ටමං, අටවැනිකොට; යොක්තුං, යොදන්නට; කිම්, කුමට; අභිලෂසි, කැමතිවන් නෙහිදැයි; ඉති, මෙසේ; ත්‍යක්තාන්‍යාපෙක්ෂවිශ්වො පකෘතිඃ—ත්‍යක්ත, හරණලද; අන්‍යාපෙක්ෂ, අනික් සහායාපෙක්ෂාවකින් යුක්තවූ; විශ්වොපකෘතිඃ, ස මස්තලොකොපකාර ඇත්තාවූ; රවිඃ, සූර්යයතෙම; යං, යමක්හට; ශාස්ති, උපදෙස්කෙරේද; සඃඅරු ණඃ, ඒ අරුණනම් රථවාහීතෙම; වඃ, තොප, අවතාත්, රක්ෂාකෙරේවා.

( 60 )

නො මූර්ඡාඡින්නවාජඃ ශ්‍රමවිවශවපුර්නෛව
නාප්‍යාක්ෂමශොෂී
පාන්ථඃ පථ්‍යෙතරාණි ක්ෂපයතු භවතාං
භාස්වතො'ග්‍රෙසරඃ සඃ,
යඃ සංශ්‍රිත්‍ය ත්‍රිලොකීමටති පටුතරෛස්තාප්‍ය
මානො මයූඛෛ
රාරාදාරාමරෙඛාමිව හරිතමණිශ්‍යාමලාමශ්ව
පංක්තිම්.

පාන්ථඃ, අනවරතයෙන් මාර්ගයෙහි ගමනය කරන්නාවූ; යඃ, යම් රථවාහීයෙක්තෙම; නො මූර්ඡිත්තවාජඃ, අන්‍යපථිකයන්මෙන් ගමනමූර්

ඡායෙන් විච්ඡින්නාභිලාෂයක් නැත්තේ; ශ්‍රමවිවශවපුඃ, එසේම ගමනශ්‍රමයෙන් අවසඟවූ ශරීරද නොමඇත්තේ; නාප්‍යාස්‍යශොෂී, මුඛ ශොෂණයක්ද නැත්තේ; පටුතරෛඃ, ඉතා තීක්ෂණවූ; මයූඛෛඃ, සූර්‍ය්‍යරශ්මියෙන්; තාප්‍යමානඃ, තවනුලබන්නේ; හරිතමණිශ්‍යාමලං, මරම්ණි රැසක්මෙන් නිල්පැහැඇති; අශ්වපඞ්ක්තිං, රථාශ්ව පරම්පරාව; ආරාමරෙඛාමිව, උද්‍යානපඞ්ක්තියක් මෙන්; ආරාත්, ලඟින්; සංශ්‍රිතඃ, ඇසුරුකොට; ත්‍රිලොකිං, තුන්ලොව; අටති. යේද; භාස්වතඃ; හිරුගේ; සඃඅග්‍රෙසරඃ, ඒ පුරොගාමීතෙම හෙවත් අරුණතෙම; භවතාං, පින්වත්වූ තොපගේ; පථ්‍යෙතරානි, අපථ්‍යයන් හෙවත් අවැඩ ක්ෂපයතු, ක්ෂයකෙරේවා......

( 61 )

ශීදන්තො'න්තර්නිමජ්ජජ්ජඩඛුරමුෂලාඃ
සෛකතෙ නාකනද්‍යාඃ
ස්කන්දන්තඃ කන්දරාලීඃ කනකශිඛරිණෝ
මෙඛලාසු ස්ඛලන්තී,
දූරාද් දූර්වාස්ථලොත්කාඃ මරකතදෘෂදි ස්ථාස්නවො
යාතයාතාඃ
පූෂ්ණෝ'ශ්වාං පාරයංසෙසනසදවතු ජවනෛර්
හුඞ්කෘතෙනාග්‍රගොවඃ......

යාතයාතාඃ, හිරුගේ රථවහනධුරයට පැමිණියාවූ; අශ්වාඃ, අශ්වයෝ; යත්, යම්හෙයකින්; නාකනද්‍යාඃ, ආකාශගඞ්ගාවගේ; සෛකතෙ, පුළින තලයෙහි; අන්තර්නිමජ්ජත්, ඇතුළත නිමග්න වන්නාවූ; ජඩ, එහෙයින්ම තදවූ; ඛුරමුෂලාඃ, මුසලාකාරවූ ඛුරයන් ඇත්තාහු; ශීදන්තඃ, පසු බස්නාහු; කනකශිඛරිණඃ, ස්වර්ණමේරු පර්වතයාගේ; කන්දරාලීඃ, කඳුරැලිපෙළ; ස්කන්දන්තඃ, පනන්නාහු; මරකතදෘෂදි, මරම්ණිපහණෙහි; දූරං, දුරින්ම; දූර්වාස්ථලොත්කාඃ, නිලිගත් ඊතණ බිමෙකැයි යන උත්කණ්ඨා ඇත්තාහු; ස්ථාස්නවඃ, සිටිනාසුල්ලෝ; මෙඛලාසු, එම මෙරුපර්වතයාගේ මධ්‍යප්‍රදෙශයෙහි; ස්ඛලන්ති, ගතිවිඝාතයට පැමිනෙන්නාහුද; තත්, එහෙයින්; හුඞ්කෘතෙන, කශාභිඝාතාදි කර්කශ ප්‍රයොගයක් නැතිව හුඞ්කාර මාත්‍රයකින්; ජවනෛඃ, වෙගවත්වූ; තෛඃ, ඒ අශ්වයන් කරණකොටගෙණ; පාරයන්, ආක්‍රමණයකරවන්නාවූ; පූෂ්ණඃ, සූර්‍ය්‍යයාගේ; අග්‍රගඃ, අග්‍රෙසරවූ අරුණතෙම; වඃ, තොප; අවතු, රක්ෂා කෙරේවා...... අරුණවර්ණනාවයි.

( 62 )

පීනොරඃප්‍රෙරිතාභ්‍රෙශ්චරමඛුරපුටාග්‍රස්ථිතෛඃ
ප්‍රාතරද්‍රා
වාදීර්ඝාඞ්ගෛරුදස්තෛ හරිභිරපගතාසඞ්ග
නිඃශබ්දචක්‍රඃ,
උත්තානානූරුමූර්ධාවනතිහඨභවවිප්‍රතීපප්‍රණාමඃ
ප්‍රාහ්ණෙ ශ්‍රෙයාංසිවිධත්තාං සවිතුරවතරන්
ව්‍යොමවීථිං රථොවඃ......

පීන, සම්පූර්ණවූ; උරඃ, වක්ෂස්ථලයෙන්; ප්‍රෙරිතාභ්‍රෙඃ, පහකරණලද මෙඝපටලයන් ඇති; ප්‍රාතරද්‍රෙඃ, උදය පර්වතයෙහි; චරමඛුරපුටාග්‍රස්ථිතෛඃ, පශ්චිමපාදයෙහි ඛුරපුටාග්‍රයෙන් සිටියාවූ; ආදීර්ඝාඞ්ගෛඃ, හාත්පසින් ආයතවූ ශරීර ඇති; හරිභිඃ, නීලාශ්වයන් විසින්; උදස්තඃ, උත්ක්ෂිප්තාවූ; අපගතාසඞ්ග, පහවූ ගැටීම් ඇති හෙයින් හෙවත් කිසිතැනෙකත් ස්පර්ශවීමක් නැතිහෙයින්; නිඃශබ්දචක්‍රඃ, නිඃශබ්දවූ චක්‍රයඇති; උත්තාන, උස්වූ; අනූරුඃ, අරුණයාගේ; මූර්ධාවනති, මස්තකයනම්නකිරීමෙන්; හඨභවත්, බලාත්කාරයෙන් වන්නාවූ; විප්‍රතීපප්‍රණාමඃ, මනොඥවූ නමස්කාර ඇති; ප්‍රාහ්ණෙ, ප්‍රභාතකාලයෙහි; ව්‍යොමවීථිං, ආකාශමාර්ගයට; අවතරන්, බස්නාවූ; සවිතුඃ, ආදිත්‍යයාගේ; රථඃ, රථයතෙම; වඃ, තොපට; ශ්‍රෙයඃ, සැපයක්; විධත්තාම්, කෙරේවා......

( 63 )

ධ්වාන්තධ්වංසෛක දීක්ෂාවිධිගුරු වහතා ප්‍රාක්
සහස්‍රංකරාණාං
මයිම්නා යො ගරිම්ණඃ පදමතුලමුපානීය
තඩ්‍යස්සනෙක
සශ්‍රාන්තානාං නිතාන්තං හරිම්ව මරුතා
මුක්ෂමාණං විශෝඪුං
ස්කන්ධාත් ස්කන්ධං ව්‍රජන්වො වෘජිනවිජිතයෙ
භාස්වතඃ ස්‍යන්දනො'ස්තු......

යඃ, යම් රථයෙක්තෙම; ධ්වාන්තධ්වංසෛක දීක්ෂාවිධිගුරු, අන්ධකාර විනාශව්‍රතවිධානයට අසහාය ගුරුවූ; කරාණාංසහස්‍රං, රශ්මිසහස්‍රය; වහ

තා, උසුලන්නාවූ; අයඃස්ථිම්නා, සූයඃස්ථිවිසින්; අධ්‍යා සනෙන, පිහිටවීමෙන්; ගරිම්නඃ, ගරුභාවය සම් බන්ධවූ; අතුලංපදං, අසදෘශවූ පදවියට; උපානීයත, පමුනුවනලද්දේද; (යඃ, යම් රථයක්;) හරිං, රශ්මි නොහොත් විෂ්ණුහු; විසොඪුං, සහනයකරන්ට නොහොත් උසුලන්ට; අක්ෂමාණං, නොහැකිවන් නාවූ; නිතාන්තං, අත්‍යර්ථයෙන්; සශ්‍රාන්තාන්තං, ඛින්නවූ; මරුතාං, වාතයන්ගේ; ස්කන්ධාත්ස් කන්ධං, සඞ්ඝාතයට නොහොත් කරත්තකරට; ක්‍රාත් ව්‍රජන්නිව, අතිශීඝ්‍රව යන්නක්හුමෙන්වේද; භාස්ව තඃ, හිරුගේ; සඃස්‍යන්දනඃ, ඒ රථයතෙම; වඃ, තොපගේ; වෘජින විජිතයෙ, පාපයන්ගේ අභි භවය පිණිස; අස්තු, වේවා.

( 64 )

යොක්ත්‍රීභූතාන් යුගස්‍ය ග්‍රසිතුමිව පුරො
දන්දශූකාන් දධානො
වෙධා ව්‍යස්තාම්බුවාහාවලිවිහිත බෘහත්පක්ෂ
වික්ෂෙප ශොභඃ,
සාවිත්‍රඃ ස්‍යන්දනො'සෞ නිරතිශයරය
ප්‍රීණිතානූරුරෙනාඃ
ංස්‍යක්ෂීයො වො ගරුත්මානිව හරතු හරීච්ඡා
විධෙයප්‍රචාරඃ.

යුගස්‍ය, රථයාගේ; යොක්ත්‍රීභූතාන්, යෙදීමට උපකාරවූ; දන්දශූකාන්, සර්පයන්; ග්‍රසිතුමිව, ග්‍රාසයකරණු පිණිසමෙන්; පුරඃ, අභිමුඛයෙහි; දධානඃ, ධරන්නාවූ; වෙධාව්‍යස්ත, දෙකක්කොට විදහනලද; අම්බුවාහාවලී; මෙඝපංක්තියෙන්; විහිත, කරණලද; බෘහත්පක්ෂවික්ෂෙපශොභඃ, මහත්වූ පක්ෂප්‍රසාර ශොභාඇති; නිරතිශය, අතිශයවත්වූ; රය, වෙගයෙන්; ප්‍රීණිත, සතුටුකරවනලද; අනූරුඃ, අරුණයාඇති; හරි, අශ්වයන්ගේ නොහොත් විෂ්ණුහුගේ; ඉච්ඡාවිධෙයප්‍රචාරඃ, ඉච්ඡාවශගවූ ගමන් ඇති; ගරුත්මාන්ඉව, ගරුඩයා වැනිවූ; සාවිත්‍රඃ, සවිතෘහු සම්බන්ධවූ; අසෞස්‍යන්දනඃ; මේ රථයතෙම; වඃ, තොපගේ; එනාඃ, පාපය; ංක්ෂීයඃ, වහා; හරතු, දුරුකෙරේවා.

( 65 )

ධූධ්වස්තාග්‍රග්‍රහාණි ධ්වජපටපවනාන්දොලි
තෙන්දූනි දූරං
රාහෞ ග්‍රාසාභිලාෂාදනුසරති පුනර්දත්ත
චක්‍රව්‍යථානි,
ශ්‍රාන්තාශ්වශ්වාසහෙලා ධූතවිබුධධුනී
නිර්ඣරාම්භාංසි භද්‍රං
දෙයාසුර්වොදවීයො දිවි දිවසපතෙඃ ස්‍යන්දන
ප්‍රස්ථිතානි.

ධූධ්වස්තා, පලමුකොට විධ්වංසනයකරණලද; අග්‍රග්‍රහාණි, අභිමුඛයෙහිවූ ග්‍රහතාරකාවන් ඇති; ධ්වජපට, ධ්වජපටයෙහි; පවන, සුළඟින්; ආන්දොලිත, කම්පිතවූ; ඉන්දූනි, චන්ද්‍රයා ඇත්තාවූ; ග්‍රාසාභිලාෂාත්, ග්‍රාසයකිරීමෙහි අභිලාෂයෙන්; දූරං, දුරින්; අනුසරති, අනුවඑන්නාවූ; රාහෞ, රාහුඅසුරයා කෙරෙහි; පුනඃ, නැවත; දත්තචක්‍රව්‍යථානි, දෙනලද චක්‍රායුධ පීඩා ඇති; ශ්‍රාන්ත, ඛින්නවූ; අශ්වශ්වාස, රථාශ්වයන්ගේ ශ්වාසයෙන්; හෙලා, ලීලායෙන්; ධූත, කම්පාකරණලද; විබුධධුනී, ආකාශගඞ්ගාවගේ; නිර්ඣරාම්භාංස, ප්‍රවාහජලයඇති; දවීයොදිවි, අතිදුරවූ ආකාශයෙහි; දිවසපතෙඃ, හිරුගේ; ස්‍යන්දනප්‍රස්ථිතානි, රථගමන්හු; වඃ, තොපට; භද්‍රං, ශොභනයක්; දෙයාසුඃ, දෙත්වා.

( 66 )

උත්කීර්ණස්වර්ණරෙණුඃ ද්‍රුතඛුරදලිතාඃ පාශ්වයොඃ
ශශ්වදශ්වෛ
රශ්‍රාන්තභ්‍රාන්ත චක්‍රක්‍රමනිබිඩ මිලන්නෙ
මිනිම්නා භරෙණ,
මෙරොර්මූර්ධන්‍යසංවො විඝටයතු රථව රෙඛාවිශි
රථස්‍ය
සොවාෂෙණොදසතාම්බුරික්තප්‍රකටිත පුලිනොඩ්ඩසරා
සවර්ධුනීව.

මෙරොඃ, ස්වර්ණමේරු පර්වතයාගේ; මූර්ධ්නි, මස්තකයෙහි; අශ්වෛඃ, රථාශ්වයන් විසින්; ශශ්වත්, නිරන්තරයෙන්; පාශ්වයොඃ, උභයපාශ්වයෙහි; ද්‍රුතඛුරදලිතා, ශීඝ්‍රගතිඇති ඛුරයෙන් සුණුකරණලද්දවූ; උත්කීර්ණ, විසුරුවනලද; ස්වර්ණරෙණුඃ, ස්වර්ණරජස්ඇති; භරෙණ, බොහෝසේ; අශ්‍රාන්ත, ශ්‍රම නොකරන්නාවූ; චක්‍රක්‍රම, චක්‍ර

පරම්පරාවෙන්; නිඛිල, නිඃශෙෂව; මිලත්, යුක්තවන්නාවූ; නෙමි, නිම්වලල්ලෙන්; නිම්නා, වලවූ; සෙවාෂ්ණ, සවකීයොෂ්ණයෙන්; උද්ගත, උරගන්නාලද; අම්බු, ජලයෙන්; රික්ත, සිස්වීමෙන්; ප්‍රකටිත, එළිවූ; පුලින, වැලිතලාවෙන්; උද්ධූසර, උද්ගතවූ ධූලිඇති; සවර්ධුනීව, ආකාශගඞ්ගාව වැනිවූ; රවෙඃ, සූර්‍ය්‍යයාගේ; රථස්‍ය, රථයා සම්බන්ධිවූ; එකවීථි, එකමාර්ගයතෙම; වඃ, තොපගේ; අඝං, පාපය; විඝටයතු, තොරකෙරේවා

( 67 )

අක්ෂෙ රක්ෂාං නිබධ්‍ය ප්‍රතිසරවලයෛර් යොජයන්ත්‍යා යුගාග්‍රං
ධූස්තම්භෙ දත්තධූපාඃ ප්‍රහිතසුමනසො ගොචරෙ කූබරස්‍ය,
චර්චාංශ්චක්‍රෙ දදත්‍යා මලයජපයසා සිද්ධවධ්වස්ත්‍රිසන්ධ්‍යං
වන්දන්තෙ යං ද්‍යුමාර්ගෙ ස නුදතු දුරිතාන්‍යංශුමත්ස්‍යන්දනො වඃ

ද්‍යුමාර්ගෙ, ආකාශයෙහි; සිද්ධවධ්වඃ, සිද්ධාංගනාවෝ; ප්‍රතිසරවලයෛඃ, මාලාදාමකටකයෙන් හෙවත් කාප්පු හා වලලුයෙන්; යුගාග්‍රංයොජයන්ත්‍යඃ, තුල්‍යකාලව යොදන්නාහු හෙවත් එකවට යොදන්නාහු; අක්ෂෙ, අකුර හෙවත් රථකීල්ලෙහි; රක්ෂාංනිබධ්‍ය, රක්ෂාබන්ධනයකොට; ධූස්තම්භෙ, රථධුරනමැති ස්තම්භයෙහි; දත්තධූපාඃ, දෙනලද සුවඳදුම් ඇත්තාහු; කූබරස්‍යගොචරෙ, යුගන්ධර ප්‍රදෙශයෙහි හෙවත් කිබුල්මුව ප්‍රදෙස්හි; ප්‍රහිතසුමනසඃ, පුදනලද සුවඳමල් ඇත්තාහු; චක්‍රෙ, රථසක්හි; මලයජපයසා, චන්දනොදකයෙන්; චර්චාඃදදත්‍යඃ, පහසින්ගන්වන්නාහු; යං, යම්රථයක්; ත්‍රිසන්ධ්‍යං, තුන්වෙලේ; වන්දන්තෙ, වඳිද්ද; අංශුමත්ස්‍යන්දනඃ, ඒ සූර්‍ය්‍යරථයතෙම; වඃ, තොපගේ; දුරිතානි, පාපයන්; නුදතු, දුරුකෙරේවා

( 68 )

නන්තුං නාකාලයානාමනිශමුපයතාං පඞ්ක්තිඃ පඞ්ක්තිරෙව
ක්ෂොදෙනක්ෂත්‍රරාශෙරදයරයමිලච්චක්‍රපිෂ්ටස්‍ය ධූලිඃ,
ඝ්‍රොණාග්‍රාණෙද්හරීණාං සුරශිඛරිදරීඃ පූරයන්නෙමිනාදො
යස්‍යාව්‍යාත් තීව්‍රභානොඃ ස දිවි භුවි යථා ව්‍යක්තචිහ්නොරථොවඃ

යස්‍ය, යම් රථයකට; අනිශං, නිරන්තරයෙන්; නන්තුං, නමස්කාර පිණිස; උපයතාං, එන්නාවූ; නාකාලයානාං, දෙවියන්ගේ; පඞ්ක්තිරෙව, පිළිවෙළම; පඞ්ක්තිඃ, මාර්ගවේද; අදයරයමිලත්, සනාබ්ධවෙගයෙන් ගැටෙන්නාවූ; චක්‍ර, රථචක්‍රයෙන්; පිෂ්ටස්‍ය, අඹරණලද්දාවූ; නක්ෂත්‍රරාශෙඃ, තාරකාසමූහයාගේ; ක්ෂොදඃඑව, චූර්ණයම; ධූලිඃ, රථධූලිවේද; සුරශිඛරිදරීඃ, මෙරගිරිකඳුරු; පූරයන්, පුරන්නාවූ; හරීණාං, අශ්වයන්ගේ; ඝ්‍රොණාග්‍රාදඃ එව, ඝොෂාරධ්වනියම; නෙමිනාදඃ, චක්‍රනෙමිධ්වනිවේද; භුවියථා, පෘථිවියෙහි යන්නාවූ රථයාගේ මාර්ගධූලි චක්‍රනාද ස්වභාවය යම්සේද එපරිද්දෙන්; දිවි, ආකාශයෙහි; ව්‍යක්තචිහ්නඃ, ප්‍රකටවූ මාර්ගගත ධූලිය චක්‍රනාදය යන චිහ්නඇති; තීව්‍රභානොඃ, චණ්ඩකිරණයාගේ; සඃරථඃ, ඒ රථයතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙරේවා

( 69 )

ඒකාහෙනෛව දීර්ඝාං ත්‍රිභුවනපදවීං ලඞ්ඝයන් යො ලඝිෂ්ඨඃ
පෘෂ්ඨෙ මෙරොර්ගරීයාන් දලිතමණිදෘෂත් තවිංෂි පිංෂන් ශිරාංසි,
යඃ සර්වෙස්‍යාපරිෂ්ටා දථච පුනරධස්තාදිවස්තාද්‍රිමූර්ධ්නි
බ්‍රධ්නස්‍යාව්‍යාත් ස එවං දුරධිගමපරිස්පන්දනඃ ස්‍යන්දනො වඃ

යඃ, යම් රථයෙක්තෙම; දීර්ඝාං, දික්වූ; ත්‍රිභුවනපදවීං, ත්‍රෛලොක්‍යමාර්ගය; එකාහෙනෛව, එකදවසින්ම; ලඞ්ඝයන්, ඉක්මයන්නේ; ලඝිෂ්ඨඃ, අතිශයින් ලඝුවූයේද; මෙරොඃ, මෙරුපර්වතයාගේ; පෘෂ්ඨෙ, මත්තෙහි; දලිත, විදාරණයකරණලද; මණිදෘෂත්, රත්නමය පාෂාණයන් හෙතුකොටගෙණ; තවිංෂි, දීප්තිමත්වූ; ශිරාංසි, ශිඛරයන්; පිංෂන්, සුණුකරන්නේ; ගරීයාන්, අතිශයින් බරවේද; යඃ, යමෙකුත්; සර්වස්‍යඃ, සියල්ලට; උපරිෂ්ටාත්, මත්තෙහිවූයේද; අථචපුනඃ, නැවතවනාහි; අස්තාද්‍රිමූර්ධ්නි, අස්තපර්වත මස්තකයෙහි; අධස්තාදිව, අධඃප්‍රදෙශයෙහිමෙන් පෙණේද; එවං, උක්තප්‍රකාරයෙන්; දුරධිගමපරිස්පන්දනඃ, නොදතහැකි ගමනින් යුක්තවූ; බ්‍රධ්නස්‍ය, හිරුගේ; සඃස්‍යන්දනඃ, ඒ රථයතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙරේවා

( 70 )

නිෂ්පන්දානාං විමානාවලිවිතතදිවාං දෙව
බෘන්දාරකාණාං
බෘන්දෛරානන්දසාන්ද්‍රාද්‍යමමපි වහතාං,
වින්දතාං වන්දිතුං නො,
මන්දාකින්‍යාමමන්දඃ පුලිනභෘති මෘදුර්මන්දරෙ
මන්දිරාභෙ
මන්දාරෛරර්චිතාරං දධදරි දිනකෘත්ස්‍යන්දනඃ
ස්තාන්මුදෙ වඃ

නිෂ්පන්දනාං, නිශ්චලවූ; විමානාවලි, විමාන පංක්තියෙන්; විතත, ව්‍යාප්තවූ; දිවාං, දෙව්ලෝ ඇති නොහොත් ආකාශඇති; ආනන්ද, සන්තොෂයෙන්; සාන්ද්‍ර, ඝනවූ; උද්‍යමං, උත්සාහඇතිව; වහතාමපි, ගන්නාවූද; වන්දිතුං, නමස්කාරක රන්ට; නොවින්දතාං, ගතිශීඝ්‍රබැවින් නොලබන්නාවූ; දෙවබෘන්දාරකාණාං, ප්‍රශස්ත දෙවතාවන් සම්බන්ධිවූ; බෘන්දෛඃ, සමූහයන් විසින්; මන්දාරෛඃ, මන්දාර පුෂ්පයන් කරණකොටගෙණ; මර්චිතාරං, සරහනලද දැවිඇති; අරි, චක්‍රය; දධත්, දරන්නාවූ; පුලිනභෘති, වාලුකාතලය දරන්නාවූ; මන්දාකින්‍යාම්, දෙව ගඟාතීරයෙහි; අමන්දඃ, දක්ෂවූ හෙවත් අස්ඛලිතවූ ගමන්ඇති; මන්දිරාභෙඃ, ප්‍රාසාදාකාර ශිඛර පංක්තියෙන් යුක්තහෙයින් නුවරක් වැනිවූ; මන්දරෙ, මන්දර පර්වතයෙහි; මෘදුඃ, මොලොක්ගති ඇත්තාවූ; දිනකෘත්ස්‍යන්දනඃ, රවිරථයතෙම; වඃ, තොපට; මුදෙ, චිත්ත ප්‍රීතිය පිණිස; ස්තාත්, වේවා.

( 71 )

චක්‍රී චක්‍රාරපංක්තිං හරිරපිච හරීන් ධූර්ජටිර්
ධූර්ධ්වජාන්තං
අක්ෂං නක්ෂත්‍රනාථො'රුණමපි වරුණඃ
කූබරාග්‍රං කුබෙරඃ,
රංහඃ සංඝඃ සුරාණාං ජගදුපකෘතයෙ නිත්‍ය
යුක්තස්‍ය යස්‍ය
ස්තෞති ප්‍රීතිප්‍රසන්නො'න්වහමහිමරුචෙඃ
සො'වතාත් ස්‍යන්දනොවඃ

අන්වහං, දවසක් දවසක් පාසා; ප්‍රීතිප්‍රසන්නඃ, ප්‍රීතියෙන් ප්‍රසන්නවූ; චක්‍රී, විෂ්ණුතෙම; යස්‍ය, යම් රථයක්හුගේ; චක්‍රාරපංක්තිං, චක්‍රයෙහි දැවි පෙළ; ස්තෞති, ස්තුතිකෙරේද; හරිරපිච, ශක්‍රද; හරීන්, අශ්වයන්; ස්තෞති, ස්තුතිකෙරේද; ධූර්ජටිඃ, ඊශ්වරතෙම; ධූර්ධ්වජාන්තං, ධුරයෙහි බඳනාලද ධ්වජයාගේ පර්‍යන්තප්‍රදෙශය; ස්තෞති, ස්තුතිකෙරේද; නක්ෂත්‍රනාථඃ, චන්ද්‍රතෙම; අක්ෂං, අකුර; ස්තෞති, ස්තුතිකෙරේද; අපි, නැවත; වරුණඃ, වරුණතෙම; අරුණං, අරුණයා; ස්තෞති, ස්තුතිකෙරේද; කුබෙරඃ, වෛශ්‍රවණතෙම; කූබරාග්‍රං, යුගන්ධරාග්‍රය; ස්තෞති, ස්තුතිකෙරේද; සුරාණාංසංඝඃ, සෙසු දෙවසමූහයතෙම; රංහඃ, වෙගය; ස්තෞති, ස්තුතිකෙරේද; ජගදුපකෘතයෙ, ලොකොපකාර පිණිස; නිත්‍යයුක්තස්‍ය, නිරන්තර යුක්තවූ; අහිමරුචෙඃ, තීක්ෂ්ණ රශ්මිහුගේ; සඃස්‍යන්දනඃ, ඒ රථයතෙම; වඃ, තොප; අවතාත්, රක්ෂාකෙරේවා.

( 72 )

නෙත්‍රාහීනෙන මූලෙ විහිතපරිකරඃ සිද්ධ
සාධ්‍යෛර්මරුද්භිඃ
පාදෙපාන්තෙ ස්තුතො'ලං බලිහරිරභසාකර්ෂ
ණාබද්ධවෙගඃ,
භ්‍රාම්‍යන් ව්‍යොමාම්බුරාශාවශිශිරකිරණස්‍යන්දනඃ
සන්තතංවො
දිශ්‍යාල්ලක්ෂ්මීමතුල්‍යාමතුලිතමහිමෙවාපරො
මන්දරාද්‍රිඃ

මූලෙ, අධඃකායෙහි; හීනෙන, විකලවූ; නෙත්‍රා, සාරථිහු විසින්; විහිතපරිකරඃ, අනුරූප ප්‍රදෙශයෙහි කරණලද අක්ෂචක්‍රාදි රථොපකරණයන් ඇත්තාවූ නොහොත්—නෙත්‍රා, නායකවූ; අහිනෙන, සර්පරාජයා කරණකොටගෙණ හෙවත් වාසුකීනම් නාගරාජයා කරණකොටගෙණ; මූලෙ, අධඃප්‍රදෙශයෙහි; විහිතපරිකරඃ, කරණලද බන්ධන ඇත්තාවූ; පාද, චක්‍රයාගේ; උපාන්තෙ, සමීපයෙහි සිටියාවූ; සිද්ධසාධ්‍යෛඃ, සිද්ධය සාධ්‍යය යන දෙවවිශෙෂයන් විසින්ද; මරුත්භිඃ, දෙවියන් විසින්ද; අලං, සම්පූර්ණව; ස්තුතඃ, ස්තුතිකරණලද්දාවූ නොහොත්-පාදෙපාන්තෙ, අධඃප්‍රදෙශ සමීපයෙහි සිටියාවූ; සිද්ධසාධ්‍යෛඃ, සිද්ධය සාධ්‍යය යන දෙවවිශෙෂයන් විසින්ද; මරුත්භිඃ, දෙවියන් විසින්ද; අලං, සම්පූර්ණකොට; ස්තුතඃ, ස්තුතිකරණලද්දාවූ; බලිහරි, බලවත්වූ අශ්ව

යන්ගේ; රභසා, වෙගයෙන්; ආකෂීණ, ඇදීමෙන්; ආබඩවෙගඃ, සංජාත වෙගඇත්තාවූ නොහොත්–බලි, බලිනම් අසුරයා; හරි, ඉන්ද්‍රය යනමොවුන්; රභසා, වෙගයෙන්; ආකෂීණ, ඇදීමෙන්; ආබඩවෙගඃ, ප්‍රණීත වෙගඇත්තාවූ; ව්‍යොම, ආකාශ නමැති; අඹුරාශෞ, සමුද්‍රයෙහි; නොහොත්–ව්‍යොමාඹුරාශෞ, ආකාශය වැනිවූ ජලනිධියෙහි; භ්‍රාම්‍යන්, භ්‍රමණයකරන්නාවූ; අතුලිත මහිමා, වැලිත් මන්‍දර පර්වතයසේ නොව පමණකට නොහැකි මහිමඇති; අපරෙමන්‍දරාද්‍රිරිව, අනික් මන්‍දර පර්වතයක් වැනිවූ; අශිශිරකිරණ ස්‍යන්‍දනඃ, තීක්‍ෂණරශ්මිහුගේ රථයතෙම; වඃ, තොපට; සන්තතං, අනවරතයෙන්; අතුල්‍යාං, අසදෘශවූ; ලක්‍ෂ්මිං, ශ්‍රිය; දිශ්‍යාත්, දේව,........රථ වර්ණනායි........

( 73 )

යජ්‍ජ්‍යායො බීජමහ්නාමපහෘතතිමිරං චක්‍ෂුෂා
මඤ්ජනං යද්
වාරං යන්මුකාතිභාජාං යදඛිලභුවනජ්‍යොති
ෂාමෙකමොකඃ,
යච්‍ඡෘෂ්‍ටය්‍යමෙහානිධාතාං ධරණිරසසුධාපාන
පාත්‍රං මහද්‍යද්
දිශ්‍යාදිශස්‍ය භාසාං තදවිකලමලං මගලං
මඬලං වඃ........

යත්, යම් සූර්‍ය්‍යබිම්බයෙක්තෙම; අහනාං, දිනයන්ට; ජ්‍යායඃ, අතිශයින් ප්‍රශස්තවූ; බීජං, කාරණද; යත්, යමෙක්තෙම; චක්‍ෂුෂාං, නෙත්‍රයන්ට; අපහෘතතිමිරං, දුරුකරණලද අන්‍ධකාරඇති නොහොත් පහකරණලද තිමිරරොගඇති; අඤ්ජනං, අඤ්ජනයක් සදෘශද; යත්, යමෙක්තෙම; මුකතිභාජාං, සංසාරමොක්‍ෂය සෙවුනාවුන්ට; වාරං, උපායභූතද; යත්, යමෙක්තෙම; අඛිලභුවනජ්‍යොතිෂාං, සමස්තලොකගත ආලොකයන්ට; එකං, අද්විතීයවූ; ඔකඃ, ආශ්‍රයෙක්ද; යත්, යමෙක්තෙම; වෘෂ්ට්‍යම්භඃ, වර්‍ෂාජලයට; නිධානං,–ආදිත්‍යාජ්ජායතෙ වෘෂ්ටිඃ යනුහෙයින්–ප්‍රතිෂ්ඨාධාරවේද; යත්, යමෙක්තෙම; මහත්, අක්‍ෂුද්‍රවූ; ධරණිරසසුධා, පෘථිවිරස සංඛ්‍යාත අමෘතයට; පානපාත්‍රං, පානභාජනද; භාසාංඊශස්‍ය, තෙජොනායකයාගේ; තත්මඬලං, ඒ බිම්බයතෙම; වඃ, තොපට; අවිකලං, සම්පූර්ණවූ; මගලං, අභිප්‍රායානුකූලවූ අර්‍ථසිද්ධිය; අලං, අත්‍යර්‍ථයෙන්; දිශ්‍යාත්, ප්‍රදානයකෙරේවා........

( 74 )

වෙලාවර්‍ණ්‍ණ සින්‍ධොඃ පයඉව බම්වාධොද්
ගතාග්‍රග්‍රහොඩු
සෙනාකොද්භින්නසච්ඡින්නප්‍රසවම්ව මධො
රාස්‍යමස්‍යන්මහාංසි,
ප්‍රාතඃ පූෂ්ණොඃශුභානි ප්‍රශමයතු ශිරඃ ශෙඛරී
භූතමද්‍රෙඃ
පෞරස්ත්‍යස්‍යොද්ගභස්තිස්තිමිතතමතමඃ
බඩනං මඬලංවඃ........

සින්‍ධොඃ, සමුද්‍රයාගේ; පයඃඉව, ජලයමෙන්; වෙලාවර්‍ණ්‍ණ, වෙරළ වැඩෙන සුළුවූ නොහොත් කාලවසයෙන් වර්‍ධනයවන්නාවූ; බම්ව, ආකාශයමෙන්; අධොද්ගත, අධඃප්‍රදෙශයෙහි උද්ගතවූ; අග්‍රග්‍රහොඩු, ප්‍රධාන ග්‍රහයන් හා නක්‍ෂත්‍රයන් ඇත්තාවූ; මධොඃ වසන්තයාගේ; ආස්‍යම්ව, මුඛයමෙන්; ස්තොක, මදක්; උද්භින්න, උද්ගතවූ හෙවත් පහළවූ; සච්ඡින්නප්‍රසවං, තමාගේ උද්භවච්ඡින්නවූ අශොකාදි පුෂ්පයන් ඇති; මහාංසි, තෙජස්; අස්‍යත්, විහිදුවන්නාවූ; ස්තිමිතතම, අතිශයින් නිශ්චලවූ; තමඃ, අන්‍ධකාරය; බඩනං, විදාරණයකරන්නාවූ; උද්ගභස්තිඃ, උද්ගතවූ රශ්මිඇති; ප්‍රාතඃ, ප්‍රභාතකාලයෙහි; පෞරස්ත්‍යස්‍ය අද්‍රෙඃ, පූර්වපර්වතයාගේ; ශිරඃශෙඛරීභූතං, මස්තකාවතංසවූ හෙවත් මුදුන්මල්කඩක් වැනිවූ; පූෂ්ණඃ, ආදිත්‍යයාගේ; මඬලං, බිම්බයතෙම; වඃ, තොපගේ; අශුභානි, අවැඩ; ප්‍රශමයතු, සන්සිඳුවාවා........

( 75 )

ප්‍රත්‍යුප්තස්තප්තහෙමොජ්වලරුචිරචලඃ පද්මරාගෙණ යෙන
ජ්‍යායඃ කිඤ්ජල්කපුඤ්ජං යදලිකුලසිතෙරම්භ
රෙණ්ඩිවරස්‍ය
කාලව්‍යාලස්‍ය චිහ්නං මහිතතමමහොමූර්‍ඬ්නි
රත්නං මහද්‍යත්
දීප්තාංශොඃ ප්‍රාතරව්‍යාත් තදවිකලජගත්
මඬනං මඬලංවඃ........

තප්තහෙම, තාපිතසවර්‍ණයෙන්; උජ්වලරුචිඃ, දිප්තිමත්වූ ශොභාඇති; අචලඃ, මෙරුපර්වතය

තෙම; පද්මරාගෙණ, රත් පියුමකට බඳුවූ පැහැ
ඇති නොහොත්-පද්මරාගෙණ, පද්මරාග මා
ණික්‍යය හා සදෘශවූ; යෙන, යම් සූර්‍ය්‍යබිම්බයෙ
කින්; ප්‍රත්‍යුප්තඃ, සම්බන්ධ හෙවත් යුක්තද; යත්,
යම් සූර්‍ය්‍යබිම්බයක්තෙම; අලිකුලසිතෛඃ, භෘඞ්ග
සමූහයක්මෙන් නිල්වූ; අම්බරෙන්දීවරස්‍ය, ආකාශ
නමැති නීලොත්පලයාගේ; ජ්‍යායඃ, අතිශයින්
ප්‍රශස්තවූ; කිඤ්ජල්කපුඤ්ජං, කෙශරජාලයක්
හා සදෘශද; යත්, යම් සූර්‍ය්‍යමණ්ඩලයක්තෙම; කාල
ව්‍යාලස්‍ය, කාලනමැති භුජඞ්ගයාගේ; අහොමූර්ධ්නි,
දිවසනමැති මස්තකයෙහි; චිහ්නං, සලකුණුවූ;
මහිතතමං, අතිශයින් පූජ්‍යවූ; මහද්‍රත්නං, මහත්වූ
රත්නයක්හා සමානද; ප්‍රාතඃ, ප්‍රභාතකාලයෙහි;
දීප්තාංශොඃ, තීක්ෂ්ණරශ්මිහු සම්බන්ධිවූ; අවිකල
ජගන්මණ්ඩනං, සම්පූර්ණ ත්‍රිභුවනභූෂණවූ; තත්
මණ්ඩලම්, ඒ සූර්‍ය්‍යබිම්බයතෙම; වඃ, තොප; අව්‍යාත්,
රක්ෂාකෙරේවා.

( 76 )

ක්‍ෂත්‍රාතා තාරකාණාං පතති තනුරවශ්‍යාය
බින්දුර්‍ය්‍යථෙන්දුර්
විද්‍රාණා දෘක් සමරාරෙරුරසි මුරරිපොඃ කෞස්තුභ
ශොනාද්ගභස්තිඃ,
වහ්නෙඃ සාපහ්නවෙව ද්‍යුතිරුදයගතෙ යත්‍ර
තන්මණ්ඩලංවො
මාර්තණ්ඩියං පුනීයාද්දිවි භුවිච තමාංසීව මුෂ්ණන්
මහාංසි.

යත්‍ර, යම් සූර්‍ය්‍යමණ්ඩලයෙක්; උදයගතෙ, උදය
පර්වත ප්‍රාප්තකල්හි හෙවත් උදකල්හි; ඉන්දුඃ,
තාරකාධිපතිවූ චන්ද්‍රතෙම; තනුඃ, සූක්ෂමවූ; අව
ශ්‍යායබින්දුර්‍ය්‍යථා, තුෂාරකණිකාවක්මෙන්; පත
ති, අස්තඞ්ගතවේද; එහෙයින්-තාරකාණාං, තාර
කාවන්; ත්‍රාතා, රක්ෂාකරන්නෙක්; කඃ, කව
රෙක්ද හෙවත් තාරකාවන් රක්ෂාකරන්නෙක්
නැත්තේමද; සමරාරෙඃ, පරමෙශ්වරයාගේ; දෘක්,
තෙජස්වරූපවූ තෘතීය දෘෂ්ටිතොමෝ; විද්‍රාණා,
බැගෑබවට පැමිනේද; මුරරිපොඃ, විෂ්ණුහුගේ;
උරසි, වක්ෂඃස්ථලයෙහි; කෞස්තුභඃ, කෞස්තුභ
මාණික්‍යයතෙම; ශොනාද්ගභස්තිඃ, උද්ගතවූ දීප්ති
නැත්තේද හෙවත් ප්‍රභාරහිතවේද; වහ්නෙඃ,
වහ්නිහුගේ; ද්‍යුතිඃ, දීප්තිතොම; සාපහ්නවාඉව,
අපලාප සහිතවූවාක්මෙන්ද හෙවත් මම ගිනි
නොවෙමි සඟවා කියන්නියක්මෙන්ද; මෙසේ-
දිවි, ආකාශයෙහිද; භුවිච, පෘථිවියෙහිද; මහාංසි,
තෙජසුන්; තමාංසිව, අන්ධකාරයන්මෙන්; මුෂ්
ණන්, පැහැරගන්නාවූ; මාර්තණ්ඩියං, ආදිත්‍යයා
සම්බන්ධිවූ; තන්මණ්ඩලම්, ඒ බිම්බයතෙම; වඃ, තොප;
පුනීයාත්, පවිත්‍රකෙරේවා.

( 77 )

යත් ප්‍රාච්‍යාං ප්‍රාක් චකාස්ති ප්‍රභවතිච යතඃ
ප්‍රාච්‍යසාවුජ්ජිහානා
දිනං මධ්‍යෙ යදහ්නො භවති තනුරුචා යෙන
චොත්පාද්‍යතෙ'හඃ,
යත් පර්‍ය්‍යායෙණ ලොකානවතිච ජගතාං
ජීවිතං යච්ච තමෙ
විශ්වානුග්‍රාහි විශ්වං සෘජදපිච රවෙර්මණ්ඩලං
මුක්තයෙ'ස්තු.

යත්, යම් මණ්ඩලයක්තෙම; ප්‍රාක්, පළමුකොට;
ප්‍රාච්‍යාං, පූර්වදිශායෙහි; චකාස්තිච, දීප්තිපතුරු
වාද; උජ්ජිහානාත්, උද්ගතවන්නාවූ; යතඃ, යම්
මණ්ඩලයකින්; අසෞප්‍රාචි, මේ පූර්වදික්තොමෝ;
ප්‍රභවතිච, පහලවන්නීද; යත්, යම් මණ්ඩලක්තෙම;
අහ්නඃ, දිනයාගේ; මධ්‍යෙ, අතුරෙහි; ඉඩංභවති,
දිප්තිමත්වේද; තනුරුචා, විස්තාරිත ප්‍රභාඇති;
යෙන, යම් සූර්‍ය්‍යමණ්ඩලයක්හු විසින්; අහඃ, දිනය
තෙම; උද්පාද්‍යතෙ, ජනිතකරණුලැබේද; යත්,
යම් සූර්‍ය්‍යමණ්ඩලයක්තෙම; පර්‍ය්‍යායෙණ, ක්‍රමයෙන්;
ලොකාන්, ත්‍රිභුවනයන්; අවතිච, රක්ෂාත්කෙ
රේද; යත්, යම් මණ්ඩලයක්තෙම; ජගතාං, තුන්
ලෝවාසීන්ට; ජීවිතං, ජීවිතද; විශ්වානුග්‍රාහි,
සමස්තලොකයාට අනුග්‍රහකරණ සුලුද; අපි, නැ
වත; විශ්වං, සියල්ල; සෘජදපි, සෘෂ්ටියත් කෙ
රේද; රවෙඃ, හිරුගේ; තන්මණ්ඩල, ඒ මණ්ඩලයතෙ
ම; වඃ, තොපට; මුක්තයෙ, මොක්ෂය පිණිස හෙ
වත් දුඃඛනිවෘතිය පිණිස; අස්තු, වේවා.

( 78 )

ශුෂ්‍යන්ත්‍යූර්ධ්වාන්ධකාරා මකරවසතයො මාරවීණාං
සප්ලීතාං
යෙනොත්ක්‍ෂ්ප්තාඃස්ඵුටන්තො ඛචිති තිලතුලාං
යාන්ත්‍යගෙන්ද්‍රායුගාන්තෙ,
තච්චණ්ඩාංශොරකාණ්ඩෙ ත්‍රිභුවනදහනාශඞ්කයා
ධාම සෘච්ජ්‍රාත්
සංහෘත්‍යාලොකමාත්‍රං ප්‍රලඝු විදධතඃ ස්තාත්මුදෙ
මණ්ඩලංවඃ.

ශුගාන්තෙ, ප්‍රලයකාලයෙහි; යෙන, යම් තෙජසෙක් හෙතුකොටගෙණ; උත්තප්තාඃ, උපවලිතවූ; මකරවසතයඃ, සප්තසමුද්‍රයෝ; මාරවීණාං, මරුභූමියෙහිවූ; සථලීනාං, භූමිතලයන්; උග්‍රාන්ධකාරාඃ, උසුලන්නාවූ අන්ධකාර ඇත්තාහු; යුගාන්තෙ, වියලෙද්ද; අගෙන්ද්‍රාඃ, පර්වතරාජයෝ; ස්ඵුටන්තඃ, පිපිරෙන්නාහු; ඛටිනී, ශීඝ්‍රව; තිලතුලාංයාන්තී, තල බිජුහා සදෘශබවටයෙද්ද; අකාණ්ඩෙ, අප්‍රස්තාවෙහි; ත්‍රිභුවනදහනාශඞ්කායාං, ජගත්‍රය දග්ධවෙයි යන ආශඞ්කාවෙන්; තත්ධාම, ඒ තෙජස; තෘවිඡ්‍රාත්, දුකාසේ; සංගෘහ්‍ය, හකුළුවා; භුලඝු, අත්‍යල්පවූ; ආලොකමාත්‍රං; ආලොකමාත්‍රයක්; විදධතඃඉව, ධරන්නක්හු වැනිවූ; චණ්ඩාංශොඃ, හිරුගේ; මණ්ඩලං, බිම්බයතෙම; වඃ, තොපට; මුදෙ, සන්තොෂය පිණිස; ස්තාත්, වේවා.......

( 79 )

උද්‍යද්ද්‍යුද්‍යානවාප්‍යාං බහලතමතමඃ පඞ්කපූරං
විදාර්‍ය්‍ය
ප්‍රාග්භින්නං පත්‍රපාශෛර්ෂ්වවිරලමරුණච්ඡායයා
විස්ඵුරන්ත්‍යා,
කල්‍යාණානි ක්‍රියාවඃ කමලමිව මහන්මණ්ඩලං
චණ්ඩභානො
රන්විතං තෘප්තිහෙතොරසකෘදලිකුලාකා
රිණා රාහුණා යත්.......

යත්, යම් සූර්‍ය්‍යබිම්බයක්තෙම; උද්‍යානවාප්‍යාං, ආකාශ නමැති උපවන පුෂ්කරණියෙහි; බහලතම, අතිශයින් ඝනවූ; තමඃපඞ්කපූරං, අන්ධකාර නමැති කර්දමරාශිය; විදාර්‍ය්‍ය, භෙදකොට; උද්‍යත්, පහලවන්නාවූ; ප්‍රාක්, පූර්වයෙහි; පත්‍රපාශෛර්ෂු, වාහනාශ්වයන්ගේ සමීපයෙහිද්‍යෙහෝ නොහොත් පත්‍රයන්ගේ පර්‍ය්‍යන්තයෙහි; විස්ඵුරන්ත්‍යා, දීප්තිමත්වූ; අරුණච්ඡායයා, අරුණයාගේ කාන්තියෙන්ද්‍යෙහෝ නොහොත් රක්ත කාන්තියෙන්; අවිරලං, සාන්ද්‍රවූ; භින්නං, විශිෂ්ටවූ; අලිකුලාකාරිණා, භෘඞ්ගශ්‍රෙණියට බඳුවූ ආකාර ඇති; රාහුණා, රාහු විසින්; තෘප්තිහෙතොඃ, තෘෂ්ණාපූරණය හෙතුකොටගෙණ; අසකෘත්, නොයෙක්වර; අන්විතං, අනුවයනලද්දාවූ; මහත්කමලමිව, මහාපියුමක් හා සදෘශද; චණ්ඩභානොඃ, තීක්ෂණරශ්මිහුගේ; තන්මණ්ඩලං, ඒ බිම්බයතෙම; වඃ, තොපට; කල්‍යාණානි, අභිවෘද්ධිකාරණයන්; ක්‍රියාත්, කෙරේවා.......

( 80 )

චක්ෂුර්දක්ෂද්විෂො යන්නතු දහති පුරා පූර
යත්‍යෙව කාමං
නාප්තං ජුෂ්ටං මරුද්භිර්‍ය්‍යදිහ නියමිනාං
යානපාත්‍රං භවාබ්ධෞ,
යච්ඡාන්ත්‍ය ශශ්වද්භ්‍රමදපි ජගතාං භ්‍රාන්ති
මභ්‍රාන්ති හන්ති
බ්‍රධ්නස්‍යාව්‍යාවිරුද්ධක්‍රියමථච හිතාධායි
තන්මණ්ඩලංවඃ.......

යත්, යම් සූර්‍ය්‍යබිම්බයෙක්තෙම; දක්ෂද්විෂඃ, මහාදෙවියාගේ; චක්ෂුඃ, නෙත්‍රවූයේ; කාමං, කාමදීපයද්‍යෙහෝ නොහොත් අභිලාෂය; නතුදහති, නොදවන්නේ; පුරා, වැලි නොබෝ කලකින්; පූරයත්‍යෙව, පුරන්නේමද; යත්, යම් සූර්‍ය්‍යබිම්බයෙක්; ඉහ, මේ සත්වලොකයෙහි; නියමිනාං, ව්‍රතවර්‍ය්‍යාවෙහි හැසිරෙන්නාවුන්ටද්‍යෙහෝ නොහොත් නාවික ජනයන්ට; භවාබ්ධෞ, සංසාර සමුද්‍රයෙහි; යානපාත්‍රං, නැවක්වූයේ; මරුද්භිඃ, මාරුතයන් විසින්ද්‍යෙහෝ නොහොත් දෙවියන් විසින්, නාප්තං, නොමෙහෙයනලද්දේ; වැලි–ජුෂ්ටං, සෙවුනාලද්දේද; යත්, යම් සූර්‍ය්‍යබිම්බයෙක්තෙම; ශශ්වත්, සදාකාලයෙහි; භ්‍රමදපි, භ්‍රමණයකරන්නේද; වීතභ්‍රාන්ති, විගතභ්‍රමඇත්තේ; ජගතාං, තුන්ලෝවාසීන්ගේ; භ්‍රාන්තිං, භ්‍රාන්තිය හෙවත් සංශයඥානය; අභ්‍රාන්ති, සැකනැතිව; හන්ති, නසාද; මෙසේ–විරුද්ධක්‍රියං, විපරීතාචාර ඇත්තේ; අථච, එතකුදුළුවත්; හිතාධායි, අවශ්‍යයෙන් ලොකහිතය කරන්නේද; බ්‍රධ්නස්‍ය, සූර්‍ය්‍යාගේ; තන්මණ්ඩලං, ඒ බිම්බයතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙරේවා.......මණ්ඩල වර්ණනායි.

( 81 )

සිද්ධෛඃ සිද්ධාන්තමිශ්‍රං ශ්‍රිතවිධි විබුධෛශ්චාර
ණෛශ්චාටුගර්භං
ගීත්‍යා ගන්ධර්වමුඛ්‍යෛර්මුහුරහිපතිභිර්‍ය්‍යාතුධා
නෛර්‍ය්‍යතාත්ම,
සාසූයං සාධෙර්මුනීන්ද්‍රෛර්මුදිතමමනො
මොක්ෂිභිඃපක්ෂපාතාත්
ප්‍රාතඃ ප්‍රාරභ්‍යමාණස්තුතිරවතු රවිර්විශ්වන්ද්‍යො
දයොවඃ.......

සිද්ධෛඃ, අණිමාදිගුණොපෙත සිද්ධයන් විසින්; සිද්ධාන්තමිශ්‍රං, සංවිද් මිශ්‍රකොටද; විබුධෛඃ, දෙවියන් විසින්; ශ්‍රිතවිධි, ආශ්‍රිතවූ ස්තොත්‍රවිධි ඇතිවද; චාරණෛඃ, දිගන්තරයෙහි දෙවියන්ගේ කීර්තිපතුරුවා කුට්ටම් ගිකියන්නන් විසින්; චාටුගර්භං, ප්‍රියවචන ගර්භකොටද; ගන්ධර්වමුඛ්‍යෛඃ, ගන්ධර්වනායකයන් විසින්; ගීත්‍යා, ගායනාකිරීමෙන්ද; අහිපතිභිඃ, වාසුකිප්‍රමුඛ නාගරාජයන් විසින්; මුහුඃ, ක්ෂණක්ෂණයෙහිද; යාතුධානෛඃ, රාක්ෂසයන් විසින්; යතාත්ම, වශගකරණලද සිත්ඇතිවද; සාධ්‍යෛඃ, සාධ්‍යනම් දෙවගණයා විසින්; සාර්ඝං, පූජාසහිතවද; මුනීන්ද්‍රෛඃ, ඍෂිශ්‍රෙෂ්ඨයන් විසින්; මුදිතතමමනාඃ, අතිශයින් ප්‍රසන්නවූ සිත්ඇතිවද; මොක්ෂිභිඃ, මොක්ෂාභිලාෂ ඇත්තවුන් විසින්; පක්ෂපාතාත්, පක්ෂපාතයෙන්ද; ප්‍රාතඃ, ප්‍රභාතකාලයෙහි; ප්‍රාරභ්‍යමාණස්තුතිඃ, පටන්ගන්නාලද ස්තොත්‍ර ඇත්තාවූ; විශ්වවන්ද්‍යඃ, සමස්තලොකයා විසින් නමස්කාරකටයුතුවූ උද්ගම ඇති; රවිඃ, ආදිත්‍යතෙම; වඃ, තොප; අවතු, රක්ෂාකෙරේවා.

( 82 )

භාස්වාසන්නභාවාදධිකතරපටු තස්‍යචක්‍රවාලස්‍ය තාපාච්
ඡේදාදච්ඡින්නගච්ඡත්තුරගඛුරපුටන්‍යාසනිඃ ශඞ්කාවමෙධකාඃ,
නිඃසඞ්ගස්‍යන්දනාගභ්‍රමණනිකෂණාත් පාතුව සත්‍රිප්‍රකාරඃ
තප්තාංශුස්තත් පරීක්ෂාපරඉව පරිතඃ පර්යටන් හාටකාද්‍රිම්.

ආසන්නභාවම්, ශලිෂටභාවයෙන්; අධිකතරපටුනඃ, ඉතා තීක්ෂණවූ; භාස්වංචක්‍රවාලස්‍ය, රශ්මිමණ්ඩලයාගේ; තාපාත්, තාපනයෙන්ද; අච්ඡින්නගච්ඡත්, අච්ඡින්නව යන්නාවූ; තුරග, අශ්වයන්ගේ; ඛුරපුටන්‍යාස, ඛුරපුටනික්ෂෙපවූ; නිඃශඞ්කාවච්ඡෙදකාඃ, බියක් නැති ගල්කපන කටුයෙන්; ඡෙදාත්, කැපීමෙන්ද; නිඃසඞ්ග, පැකිලීමක් නැත්තාවූ; ස්‍යන්දනාග, රථචක්‍රයාගේ; භ්‍රමණනිකෂණාත්, භ්‍රමණයෙන් ඝර්ෂණයකිරීමෙන්; ත්‍රිප්‍රකාරං, මෙසේ තාපනච්ඡෙදන ඝර්ෂණ යන තුන් ප්‍රකාරයකින්; තත්පරීක්ෂාපරඉව, ඒ කනකපර්වතය පරීක්ෂාකිරීමෙහි තත්පරවූවාක්හුමෙන්; හාටකාද්‍රිම්, ස්වර්ණමෙරු පර්වතය; පරිතඃ, හාත්පසින්; පර්යටන්, පරිභ්‍රමණයකරන්නාවූ; තප්තාංශුඃ, ඒ සූර්යතෙම; වඃ, තොප; පාතු, රක්ෂාකෙරේවා.

( 83 )

නොච්ඡුෂ්කං නාකනද්‍යා විකසිතකනකාම්භොරුහා භ්‍රාජිතන්තු
පල්ලවිතා නෛවොපභොග්‍යා භවති භෘශතරං නන්දනොද්‍යානලක්ෂ්මීඃ,
නො ශෘඞ්ගාණි ද්‍රුතානි ද්‍රුතමමරගිරෙඃ කාලධෞතානි ධෞතා
නීධං ධාම ද්‍යුමාගෙහ මුදයති දයයා යත්‍ර සො'ව්‍යාදිනො වඃ.

යත්‍ර, යම් සූර්යයකු; ඉඩංධාම, දීප්තිමත්වූ තෙජස්; ද්‍යුමාගෙහ, දෙවපථයෙහි; දයයා, කරුණාවෙන්; මුදයති, මෘදුකරණකල්හි; විකසිත කනකාම්භොරුහා, සුපුෂ්පිතස්වර්ණපද්මයන්ඇති; නාකනද්‍යා, ස්වර්ණාදිය විසින්; නොච්ඡුෂ්කං, නොවියලන්නලද; භ්‍රාජිතන්තු, වැලිත් විශෙෂයෙන් බැබලීමවේද; නන්දනොද්‍යානලක්ෂ්මීඃ, නන්දනොද්‍යාන සම්පත්තිතොමෝ; නෛවපල්ලවා, නොමදගන්ධවූවාද; වැලිත්, භෘශතරං, අතිශයින්ම; උපභොග්‍යාභවති, දෙවියන්ගේ අනුභවයට යොග්‍යවන්නීද; අමරගිරෙඃ, මෙරුපර්වතයාගේ; කාලධෞතානි, ස්වර්ණමයවූ; ශෘඞ්ගාණි, ශිඛරයෝ; ද්‍රුතං, ශීඝ්‍රව; නොද්‍රුතානි, විලීනනොවූවාහුද හෙවත් දියව නොගියෝද; වැලිත්, ධෞතානි, දියුණුව නිර්මලකරණලද්දාහුද; සඃඉනඃ, ඒ සූර්යතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙරේවා.

( 84 )

ධ්වාන්තස්‍යෛවාන්තහෙතුර්නභවති මලිනෛකාත්මනඃ පාප්මනො'පි
ප්‍රාක්පාදොපාන්තභාජාං ජනයති නපරං පඞ්කජානාං ප්‍රබොධම්,
කර්තා නිඃශ්‍රෙයසානාමපිනු නබලු යඃ කෙවලං වාසරාණාං
සො'ව්‍යාදෙකොද්‍යමෙවඃ විහිතබහුවෘහද් විශ්වකාර්‍යො'ර්‍යමාවඃ.

යඃ, යමෙක්තෙම; බලු, එකාන්තයෙන්; ධ්වාන්තස්‍යෛව, අන්ධකාරයාගේම; අන්තහෙතුඃනභ

වති, විනාශයට කාරණ නොවෙයි; අපිතු, වැලිත්; මලිනෙකාත්මනඃ, කෘෂ්ණභාවය අසහාය සව භාවකොට ඇත්තාවූ; පාප්මනොපි, අකුශලයා ගේද විනාශයට කාරණවේද; ප්‍රාක්, පළමුකොට; පාදෝපාන්තභාජාං, පාදසමීපප්‍රදෙශය සෙවුනාවූ ජනයන්ට; ප්‍රබොධංජනයතිත, තත්වඥානය උප දවන්නේ නොවේයි; පරං, අතිකෙකුත් ඇත; ප්‍රාක්, ප්‍රභාතකාලයෙහි; පාදෝපාන්තභාජාං, රශ්මි සමූහයා සෙවුනාවූ; පඞ්කජානාමපි, පද්මයන්ගේ ද; ප්‍රබොධං, විකාශය; ජනයති, උපදවාද; කෙව ලං, හුදක්; නිඃශ්‍රෙයසානාං, නිර්වාණපදයන්ට; කර්තෘ, කර්තෘවන්නේ නොවෙයි; අපිතු, වැලිත්; වාසරාණාමපි, දිනයන්වත්; කර්තා, කර්තෘවේද; මෙසේ—එකොද්‍යමෙච්ඡා විහිතබහුවෘහත් විශ්ව කාර්‍ය්‍යඃ—එකොද්‍යමෙච්ඡා, එකම උත්සාහයෙන්වූ ඉච්ඡාවෙන්; විහිත, කරණලද; බහු, බොහෝවූ හෙවත් අනෙක සඞ්ඛ්‍යාවෙන් යුක්තවූ; වෘහත්, මහත්වූ; විශ්වකාර්‍ය්‍යඃ, සමස්තලොකකාර්‍ය්‍ය ඇත් තාවූ; සඃ අර්‍ය්‍යමා, ඒ භගවත් සූර්‍ය්‍යතෙම; වඃ, තො පඃ; අව්‍යාත්, රක්‍ෂාකෙරේවා.

( 85 )

ලොඨල්ලොෂ්ටාවිචෙෂ්ටඃ ශ්‍රිතශයනතලො
නිශ්චලීභූතදෙහඃ
සන්දෙහී ප්‍රාණිතව්‍යෙ සපදි දශදිශඃ ප්‍රෙක්‍ෂ
මාණො'න්ධකාරෙ
නිඃශ්වාසායාසනිෂ්ඨඃ පරම්පරවශො ජායතෙ
ජීවලොකඃ
ශොකෙනෙවාන්‍යලොකාභ්‍යුදයකෘතිගතෙ
යත්‍ර සො'ර්කො'වතාවඃ

යත්‍ර, යම් සූර්‍ය්‍යයක්හු; අන්‍යලොකාභ්‍යුදයකෘති ගතෙ, අපරලොකයාට අභිවෘද්ධිකරණු පිණිස ගියකල්හි; ජීවලොකඃ, සත්වලොකයතෙම; ශො කෙනෙව, ශොකයෙන්මෙන්; ශ්‍රිතශයනතලඃ, ආශ්‍රයකරණලද ශයනතල ඇත්තේ; ලොඨන්, පෙරලෙන්නේ; ලොෂ්ටාවිචෙෂ්ටඃ, කැටකැබිලිති මෙන් විගතචෙෂ්ටා ඇත්තේ; නිශ්චලීභූතදෙහඃ, නිස්පන්දවූ ගාත්‍ර ඇත්තේ; ප්‍රාණිතව්‍යෙ, ජීවත්වී මෙහි; සන්දෙහී, සංශයවත්වූයේ; සපදි, එකෙණෙ හි; දශදිශඃ, දසදිගුන්; ප්‍රෙක්‍ෂමාණඃ, බලන්නුයේ; අන්ධකාරෙ, අඳුරෙහි; නිඃශ්වාසායාසනිෂ්ඨඃ, ආශ් වාස ප්‍රශ්වාස පැවැත්මෙහි ආයාසයම නිශ්චයකොට ඇත්තේ; පරම්පරවශො ජායතෙ, අතිශයින් පර වසවේද හෙවත් තමා වශගනොවේද; සඃඅර්කඃ, ඒ ආදිත්‍යතෙම; වඃ, තොප; අවතාත්, රක්‍ෂාකෙ රේවා.

( 86 )

ක්‍රාමල්ලොලො'පි ලොකංස්තදුපකෘතිකෘතා
වාස්ථිතඃ ස්ථෛර්‍ය්‍යකොටිං
තෘෂ්ණාං දෘෂ්ටිං විජිහ්මාං විදධදපි කරොත්‍යත්
තරත්‍යන්තභද්‍රාම්,
යස්තාපස්‍යාපි හෙතුර්භවති නියමිනාමෙක
නිර්වාණදායී
භූයාත් ස ප්‍රාගවස්ථාධිකතරපරිණාමොදයො'ර්කඃ
ශ්‍රියෙවඃ

යඃ, යම් සූර්‍ය්‍යයෙක්තෙම; ලොකාන්, ත්‍රිභුවන යන්; ක්‍රාමන්, අවක්‍රමණය කරන්නේ; ලොලො පි, ශීඝ්‍රලොභවසයෙන් චඤ්චලවූයේද; තදුපකෘති කෘතෙව, ඒ ත්‍රෛලොක්‍යවාසීන්ට උපකාරකිරී මෙහි; ස්ථෛර්‍ය්‍යකොටිං, ස්ථිරත්වයාගේ උත්කර්ෂ යෙහි; ආස්ථිතඃ, පිහිටියේද; තෘෂ්ණාං, මනුෂ්‍යයන් ගේ; දෘෂ්ටිං, අවලොකනය; විජිහ්මාංවිදධදපි, කුටිලකරන්නේවේද හෙවත් නිපොපිකරන්නේ වේද; අන්තඃ, අභ්‍යන්තරයෙහිවූ; දෘෂ්ටිං, ප්‍රඥා දෘෂ්ටිය; අත්‍යන්තභද්‍රාකරොති, අතිශයින් ශොභ න කෙරේද; තාපස්‍ය, උෂ්ණසන්තාපයට; හෙතුඃ අපි, කාරණවූයේද; නියමිනාම්, යොගීපුරුෂ යන්ට; එකනිර්වාණදායී භවති, අසහායවූ නිර්වාණ ශෛත්‍යදායකවේද; ප්‍රාගවස්ථා, පූර්වකාලාවස්ථිතවූ වස්තුධර්මයට වඩා; අධිකතරපරිණාමොදයඃ, අති ශයින් අධිකවූ පරිනාමයෙන් යථොක්ත උදය ඇති; සඃඅර්කඃ, ඒ සූර්‍ය්‍යභගවත්තෙම; වඃ, තොපට; ශ්‍රියෙ, ත්‍රිවර්ගසම්පත්තිය පිණිස; භූයාත්, වේවා.

( 87 )

ව්‍යාපන්නතූර්නකාලො ව්‍යභිචරති ඵලං
නෞෂධීර්වෘෂ්ටිරිෂ්ටා
නෂ්ටාස්තෘප්‍යන්ති දෙවා නහි වහති මරුත්
නිර්මලාභානි භාති,
ආශාඃ, ශාන්තානභිඥතාන්‍යවධිමුදධයො
බිභ්‍රති ක්ෂ්මාභෘතඃ ක්ෂ්මාං
යස්මින් ත්‍රෛලොක්‍යමිත්‍යං නවලති තපති
ස්තාත් ස සූර්‍ය්‍යඃ ශ්‍රියෙවඃ

යසම්න්, යම් සූර්‍ය්‍යයක්හු; තපති සති, ආතපය පවත්වනකල්හි; කාලඃ, සංවත්සරාදි කාලය තෙම; ව්‍යාපන්නර්තුර්න, අන්‍යථාත්වයට පැමිනි සෘතූන් ඇත්තේ නොවේද ස්වභාවයෙන් පවත්නා ෂට් සෘතූන් ඇත්තේද; ඔෂධිඃ, ඵලපාකාන්තයෙහි විනශ්වරවූ කදලීධාන්‍යාදි ඖෂධීහු; ඵලංනාව්‍යභිචරති, ඵලප්‍රදානය නොවරදවාද හෙවත් ඵල ප්‍රසවය කෙරේද; වෘෂ්ටිඃ, වර්‍ෂාතොම; ඉෂ්ටා, ප්‍රියවේද; දෙවඃ, දෙවියෝ; ඉෂ්ට්‍යා, යාගයෙන්; නහිනතෘප්‍යන්ති, තෘප්තිනොවන්නාහු නොවෙද්ද හෙවත් තෘප්තියට පැමිනෙන්නාහුම වෙද්ද; මරුත්වහති, රශ්මිහෙතුඃ වායුඃජායතෙ යනු ආගම හෙයින් මාරුතය හමාද; භාන්ති, නක්ෂත්‍රයෝ; නිර්මලාභාන්ති, චන්ද්‍රමසොනක්ෂත්‍රානාඤ්ච ප්‍රභා ආදිත්‍යස්‍ය ප්‍රභාවාදෙව භවති යනු ආගම හෙයින් නිර්මල ප්‍රභාව ඇත්තාහුවෙද්ද; ආශාඃ, දිශාවෝ; ශාන්තාඃ, විගත අන්ධකාරවෙද්ද; උදධයඃ, සමුද්‍රයෝ; අවධිං, මර්‍යාදාව; න භින්දන්ති, භෙදනොකෙරෙද්ද; ක්ෂ්මාභෘතඃ, පර්‍වතයෝ ද්‍රොහෝ නොහොත් රජදරුවෝ; ක්ෂ්මාං, පෘථිවිය; බිභ්‍රති, ධරද්ද; ඉත්‍ථං, මේ ආකාරයෙන්; ත්‍රෛලොක්‍යං, ලොකත්‍රය; නචලති, චලිත නොවේද හෙවත් අන්‍යථාත්වයට නොපැමිනේද; සඃසූර්‍ය්‍යඃ, ඒ ප්‍රභාකරතෙම; වඃ, තොපට; ශ්‍රියෙ, සම්පත්තිය පිණිස; ස්තාත්, වේවා.

( 88 )

කෛලාසෙ කෘත්තිවාසා විහරති විරහත්‍රාස
දෙහොඃකාන්තඃ
ශ්‍රාන්තඃ ශෙතෙ මහාභවධිජලධි තපශ්ඡද්
මනා පද්මනාභඃ,
යොගොද්‍යොගෛකතානොගමයති සකලං
වාසරං ස්වං ස්වයම්භූර්
භූරිත්‍රෛලොක්‍යචින්තාභෘති භුවනවිභො
සත්‍ර භාස්වාන් සවො'ව්‍යාත්

භුවනවිභො, ත්‍රෛලොක්‍යනායකවූ; යත්‍ර, යම් සූර්‍ය්‍යයක්හු, භූරිත්‍රෛලොක්‍යචින්තාභෘති, බොහෝවූ ත්‍රිභුවනකාර්‍ය්‍යසමෘති ධරණකල්හි; කෘත්තිවාසාඃ, මහාදෙවතෙම; විරහත්‍රාස, වියොගභයින්; දෙහොඃකාන්තඃ, ශරීරයෙන් ධරණලද කාන්තාව ඇත්තේ; කෛලාසෙ, කෛලාස පර්‍වතයෙහි; විහරති, ක්‍රීඩාවකෙරේද හෙවත් සිත් අලවාවෙසේද; පද්මනාභඃ, විෂ්ණුතෙම; ශ්‍රාන්තඃ, අසුරවාදයෙන් ඛෙදයට පැමිනියේ; අබ්ධිජලධි, සමුද්‍රයෙහි; මහාභොගෙ, ශෙෂනම් මහානාගභොගයෙහි; තපශ්ජන්මනා, යොගනිද්‍රාව්‍යාජයෙන්; ශෙතෙ, ශයනය කෙරේද; ස්වයම්භූඃ, බ්‍රහ්මතෙම; යොගොද්‍යොග, චිත්තවෘත්තිනිරොධ ප්‍රයත්නයෙහි; එකතානඃ, එකාග්‍රවූයේ; සකලං, සියලු; ස්වංවාසරං, කල්පලක්ෂණවූ ස්වකීය බ්‍රහ්මදිනය; ගමයති, ඉක්මවාද; සඃභාස්වාන්, ඒ ආදිත්‍යතෙම; වඃ, තොප; අව්‍යාත්, රක්ෂාකෙරේවා.

( 89 )

එතද්‍යන්මණ්ඩලං ඛෙ තපති දිනකෘතස්තා
සෘචො'ර්චීංෂි යානි
ද්‍යොතන්තෙ තානි සාමාන්‍යයමපි පුරුෂො
මණ්ඩලෙ'න්තර්‍යජූංෂි,
එවං යං වෙද වේදත්‍රිතයමයමයං වෙදවෙදී
සමග්‍රො
වර්‍ගඃ ස්වර්‍ගාපවර්‍ගප්‍රකෘතිරවිකෘතිඃ සො'ස්තු
සූර්‍ය්‍යඃ ශ්‍රියෙ වඃ

දිනකෘතඃ, දිවසකරයාගේ; එතත්යන්මණ්ඩලං, යම් මේ බිම්බයෙක් තෙම; ඛෙ, ආකාශයෙහි; තපති, දිලියේද; තාඃ, ඔව්හු; සෘචඃ, සෘග්වෙදයෝය; යානිඅර්චීංෂි, යම් රශ්මිකෙනෙක්; ද්‍යොතන්තෙ, ප්‍රකාශවබබලද්ද; තානි, ඔහු; සාමානි, සාමයෝය හෙවත් ගීතිවිශෙෂයෝය; මණ්ඩලෙ, බිම්බයෙහි; අන්තඃ, සූක්ෂ්මාකාරයෙන් දෘශ්‍යමානවූ; අයමපිපුරුෂඃ, මේ පුරාණ පුරුෂද; යජූංෂි, යජුර්වේදයෝයි; එවං, මෙසේ; යං, යම් සූර්‍ය්‍යයක්හු; වෙදත්‍රිතයමයං, සෘක් සාම යජුස් සංඛ්‍යාත වෙදත්‍රය(මයයි); සමග්‍රඃ, සියලු; අයංවෙදවෙදිවර්‍ගඃ, වෙදඥවූ මේ බ්‍රාහ්මණතෙම; වෙද, දනීද; අවිකෘතිඃ, විකාර රහිතවූ; ස්වර්‍ගාපවර්‍ගප්‍රකෘතිඃ, ස්වර්‍ගාපවර්‍ග ස්වරූපවූ; සඃ සූර්‍ය්‍යඃ, ඒ දිනකරතෙම; වඃ, තොපට; ශ්‍රියෙ, සම්පත්තිය පිණිස; අස්තු, වේවා.

( 90 )

නාගෙ ශාකාප්‍රත්‍යනීකක්ෂිතිපටුමහසාං වාසවා
ග්‍රෙසරාණාං
සර්වේෂාං සාධුපාතාං ජගදිදමදිතෙරාත්මජානෙව
සමෙ'පි,
යෙනාදිත්‍යාභිධානං නිරතිශයගුණෛරාත්මනි
න්‍යස්තමස්තු
සතුත්‍යෛස්ත්‍රෛලොක්‍යවන්ද්‍යස්ත්‍රිදශමුනි
ගණෛඃසො'ංශුමාන් ශ්‍රෙයසෙවඃ

නාකෞකඃප්‍රත්‍යනීක, අසුරයන්ගේ; ක්‍ෂති, හිංසායෙහි; පටුමහසාං, දක්‍ෂවූ තේජස්ඇති; ඉදං ජගත්, මේ ත්‍රෛලෝක්‍යය; සාධුපාතාං, පක්‍ෂපාතයෙන් රක්‍ෂාකරන්නාවූ; වාසවාග්‍රසරාණාං, ශක්‍රයා පෙරදැරිකොටඇති; සර්වේෂාං, සියලු දෙවියන්ට; අදිතෙඃ, අදිතිනම් දෙවමාතෘවගේ; ආත්මජන්ම, පුත්‍රභාවය; සමෙපි, සදෘශකල්හිද; යෙන, යම් සූර්‍ය්‍යයක්හු විසින්; ආදිත්‍යාභිධානං, අදිතේරපත්‍යමාදිත්‍යඃ යන මාතෘසමානවූ ආදිත්‍යනාමය; නිරතිශයගුණෛඃ, ත්‍රිභුවනාන්ධකාර දූරීකරණාදිවූ අනන්‍ය සාධාරණ ගුණයන් හේතුකොටගෙණ; ආත්මනි, තමාකෙරෙහි; න්‍යස්තං, පිහිටුවනලද්දේද; ත්‍රෛලෝක්‍යවන්ද්‍යඃ, ජගත්‍රයවාසීන් විසින් නමස්කාරකටයුතුවූ; ත්‍රිදශමුනිගණෛඃ, දෙවර්ෂි සමූහයා විසින්; ස්තුත්‍යඃ, ස්තොත්‍රකටයුතුවූ; සඃ අංශුමාන්, ඒ ප්‍රභාකාරතෙම; වඃ, තොපට; ශ්‍රෙයසෙ, ශුභය පිණිස; අස්තු, වේවා.

( 91 )

භූමිං ධාම්නෝ'භිවෘෂ්ට්‍යා ජගති ජලමයීං
පාවනීං සංස්මෘතානා
මාග්නෙයීං දහනශක්ත්‍යා මුහුරපි යජමානාං
යථා ප්‍රාර්ථිතාර්ථෛඃ,
ලීනාමාකාශ එවාමෘතකරඝටිතාං ධ්වාන්ත
පක්‍ෂස්‍ය පර්ව
ණ්‍යෙවං සූර්‍ය්‍යෝ'ෂ්ටභේදං භවඉව භවතඃ
පාතු බිභ්‍රත් ස්වමූර්තිම්.

භවඉව, ක්‍ෂිති ජල පවන හුතාශන යජමානාකාශ සෝම සූර්‍ය්‍යාඛ්‍ය අෂ්ටමූර්තිධරවූ පරමේශ්වරයාමෙන්; ජගති, ලෝකයෙහි; ධාම්නඃ, තේජසට; භූමිං, භූමිවූ හෙවත් පෘථිවීමූර්තියද; අභිවෘෂ්ට්‍යා, ආදිත්‍යාජ්ජායතෙ වෘෂ්ටිඃ යනු හෙයින් වර්ෂණ කිරීම හෙතුකොටගෙණ; ජලමයීං, ජලමය මූර්තියද; සංස්මෘතානාං, සිහිකරන්නාවුන්; පාවනීං, පවිත්‍රකරන්නාවූද හෙවත් පවනමය මූර්තියද; දහනශක්ත්‍යා, දහනසාමර්ථ්‍යය හෙතුකොටගෙණ; ආග්නෙයීං, අග්නිමය මූර්තියද; යථාප්‍රාර්ථිතාර්ථෛඃ, යථෙප්සිතාර්ථයන් සම්පාදනයකිරීමෙන්; මුහුරපි, නැවතනැවතත්; යජමානාං, යාගකරන්නාවූ හෙවත් යජමාන මූර්තියද; ආකාශඑව, ආකාශයෙහිම; ලීනාං, ශ්ලිෂ්ටවූද හෙවත් අභෙදොපචාරයෙන් ආකාශමූර්තිවූද; ධ්වාන්තපක්‍ෂස්‍ය, කෘෂ්ණපක්‍ෂය සම්බන්ධිවූ; පර්වණි, පර්ව සන්ධියෙහි හෙවත් අමාවාස්‍යායෙහි; අමෘතකරඝටිතාං, චන්ද්‍රයාහා යුක්තවූද හෙවත් චන්ද්‍ර මූර්තියද තද්‍යොගයෙන් සූර්‍ය්‍යමූර්තිවූදයි; එවං, උක්තප්‍රකාරයෙන්; අෂ්ටභෙදං, අෂ්ටප්‍රකාරවූ; ස්වමූර්තිම්, ස්වකීයවූ මූර්තිය; බිභ්‍රත්, ධරන්නාවූ; සූර්‍ය්‍යඃ, හිරුතෙම; භවතඃ, පින්වත්වූ තොප; පාතු, රක්‍ෂාකෙරේවා.

( 92 )

ප්‍රාක්කාලොන්නිද්‍රපද්මාකරපරිමිලනාවිර්භ
වත්පාදශොභො
භක්ත්‍යා ත්‍යක්තොරුඛෙදෝද්ගතිදිවි විනතාසූ
නුනා නීයමානඃ,
සප්තාශ්වාප්තාපතන්ත්‍යත්‍යධිකමධරයන්
යො ජගන්ති ස්තුතො'ලං
දෙවෛර්දේවඃ ස පායාදපරඉව මුරාරාතිරහ්නාං
පතිර්වඃ.

යඃ, යම් දින්නාථයෙක්තෙම; අපරෙමුරාරාතිඃ ඉව, විතීයනාරායණයෙකු මෙන්; ප්‍රාක්කාල, ප්‍රභාතසමයෙහි; උන්නිද්‍ර, විකසිතවූ; පද්මාකර, පියුම් වනයෙහි; පරිමිලන, කිඤ්ජල්කයෙන්; ආවිර්භවත්, පහලවන්නාවූ; පාදශොභඃ, රශ්මිකාන්ති ඇත්තේද නොහොත්–ප්‍රාක්කාල, පූර්වකාලයෙහි; උන්නිද්‍ර, පිබිදගියාවූ; පද්මා, ලක්‍ෂ්මියගේ; කර, හස්තයෙන්; පරිමිලන, සම්බාහනය කිරීමෙන්; ආවිර්භවත්, ප්‍රකාශවන්නාවූ; පාදශොභඃ, චරණකාන්තිඇත්තේද; විනතාසූනුනා, අරුණයා විසින්; භක්ත්‍යා, ස්වාමිභක්තියෙන්; ත්‍යක්ත, හරණලද; ඌරුඛෙද, පාදශ්‍රමයාගේ; උද්ගති, උත්සවය ඇතිව හෙවත් ස්වාමිභක්තියෙන් නොසලකනලද පාදදුඃඛෝද්ගමය ඇතිව; දිවි, ආකාශයෙහි; නීයමානඃ, ගෙණයනුලබන්නේද නොහොත් විනතාසූනුනා, ගරුඩයා විසින්; භක්ත්‍යා, ආදරයෙන්; ත්‍යක්ත, හරණලද; ඌරු, මහත්වූ; ඛෙදොද්ගතිඃ, ශ්‍රමොද්ගමනය ඇතිව; දිවි, ආකාශයෙහි; නීයමානඃ, පමුනුවනුලබන්නේද; සප්තාශ්ව, අශ්වයන් සත්දෙනා කරණකොටගෙණ; ආප්ත, පැමිණෙනලදින්; අපතන්ති, පතිත නොවන්නාවූ; ජගන්ති, ත්‍රිභුවනයන්; අධිකම්, සාතිශයව; අධරයන්, අභිනවකෙරේද නොහොත්

ත්-ආප්‍ය, ත්‍රිපද වික්‍රමකාලයෙහි පාදප්‍රමාණය කරණලදින්; අපතන්තානි, පතිත නොවන්නාවූ; සප්තජගන්ති, සප්තවිධලෝකයන්; ආශු, සීඝ්‍රව; අධිකං, විශේෂයෙන්; අධරයත්, යටත්කෙරේද; දෙවෙ:; ත්‍රයස්ත්‍රිංශත් කොටි ප්‍රමාණ දෙවතාවන් විසින්; අලං, සම්පූර්ණතාව; ස්තුතඃ, ස්තොත්‍ර කරණලද්දවූ; සඃ අසකාංපතිදේවඃ, ඒ දිවසනා යක දෙවතෙම; වඃ, තොප; පායාත්, රක්‍ෂාකෙරේවා.

( 93 )

යඃ ස්‍රෂ්ටාපාං පුරස්තාදචලවරසමභ්‍යුන්නතෙ
හෙතුරෙකො
ලොකානාං යස්ත්‍රයාණාං සවිතඋපරි පරං
දුර්විලඞ්ඝ්‍යත ධාමනා,
සද්‍යඃ සිඬෙඃ ප්‍රසන්නද්‍යුතිශුභචතුරාශාමුඛස්තාඃ
විභක්තො
වෙධා වෙධා යථාවිෂ්කෘතකමලරුචිඃ
සොර්චිෂාමාකරොවඃ.

යඃ, යම් සූර්‍යයෙක්තෙම; වෙධායථා, බ්‍රහ්මයා මෙන්; අපාංස්‍රෂ්ටා, ආදිත්‍යාජ්ජායතෙ වෘෂ්ටිඃ යනු හෙයින් ජලදායකවේද; පුරස්තාත්, පූර්වදික්හි; අචලවර, පර්වතශ්‍රෙෂ්ඨයාගේ; සමභ්‍යුන්නතෙ, ප්‍රකාශයට හෙවත් උදයපර්වතයෙහි යනු ප්‍රසිඬයට; එකහෙතුඃ, අසහාය කාරණද-නොහොත් පුරස්තාත්, අපඑවසර්ජාදෞ යනු හෙයින් පූර්වකාලයෙහි; අපාං, ජලයන්, ස්‍රෂ්ටා, නිර්මාණයකෙරේද; අචලවර, මෙරුපර්වතයාගේ; සමභ්‍යුන්නතෙ, උද්භවයට; එකහෙතුඃ, අසහායකාරණද හෙවත් සෘෂ්ටිකාරණද; යඃ, යමෙක්තෙම; පරම්, අත්‍යර්ථයෙන්; දුර්විලඞ්ඝ්‍යාතධාමනා, අවිලඞ්ඝනීයවූ තෙජසින්; ත්‍රයාණාං ලොකානාං, තුන්ලෝවාසීන්ට; උපරිස්ථිතඃ, උපරිස්ථානයෙහි සිටියේද; යඃ, යමෙක්තෙම; පරම්, අතිශයින්; දුර්විලඞ්ඝ්‍යත, අනතික්‍රමණීයවූ; ධාම්නා, වාසස්ථානයෙන්; ත්‍රයාණාං ලොකානාං, ත්‍රිවිධලොකයන්ට; උපරිස්ථිතඃ, මත්තෙහි පිහිටියේද; යඃ, යමෙක්තෙම; ප්‍රසන්නද්‍යුතිශුභචතුරාශාමුඛඃ—ප්‍රසන්නද්‍යුති, ප්‍රසන්නවූ ශොභාඇති; ශුභ, එහෙයින්ම විකතාන්ධකාර ඇතිහෙයින් ශොභනවූ; චතුරාශාමුඛඃ, චතුර්දිශාමුඛයන් ඇත්තේද; නොහොත් ප්‍රසන්නද්‍යුති, නිර්මලවූ කාන්ති ඇති; ශුභ, දර්ශනීයවූ; චතුරාශාමුඛඃ, චතුර්දිශාප්‍රවෘත්ත මුඛය ඇත්තේද; යඃ, යමෙක්තෙම; වෙධාවිභක්තඃ, අභ්‍යන්තර තෙජස්වරූපවූ පුරුෂ බාහ්‍යතෙජස්වරූපවූ මඬලයයි දෙපරිද්දකින් විභාගකරණලද්දේද; නොහොත්-වෙධාවිභක්තඃ, අභ්‍යන්තරවූ ඥානස්වරූපය බාහ්‍යවූ තෙජස්වරූපය බාහ්‍යවූ තෙජස්වරූප මූර්තියයි දෙපරිද්දෙකින් විභාගකරණලද්දේද; යඃ, යමෙක්තෙම; ආවිෂ්කෘතකමලරුචිඃ, ප්‍රකාශකරණලද පද්මයන්ගේ ශොභාඇත්තේද; නොහොත්-ආවිෂ්කෘතකමලරුචිඃ, ප්‍රකාශකරණලද පද්මකාන්ති යම් බඳුවූ දෙහ ප්‍රභාඇත්තේද; සඃඅර්චිෂාමාකරඃ, ඒකිරණොත්පත්තිස්ථානවූ සූර්‍යතෙම; සද්‍යඃ, දූන්; වඃ, තොපගේ; සිඬෙඃ, නිෂ්පත්තිය පිණිස හෙවත් අභිමතාර්ථය පිණිස; ස්‍යාත්, වේවා.

( 94 )

සාද්‍රිද්‍යුර්විනාදීශා දිශති දශදිශො දර්ශයන් ප්‍රාක්
දශොයඃ
සාදෘශ්‍යං දෘශ්‍යතෙ නො සදශශතදෘශි මෛන්ද්‍රදෙශෙ
යස්‍ය දෙශෙ,
දීප්තාංශුර්වඃ ස දිශ්‍යාදශිවයුගදශාදර්ශිතවාද
ශාත්මා
ශාස්ත්‍යශ්වාන් ශම් යස්‍යාශයවිදතිශයාන් දන්දු
ශූකාසනාද්‍යඃ.

යඃ, යමෙක්තෙම; ප්‍රාක්, පළමුකොට; සාද්‍රිද්‍යුර්විනාදීශාඃ, පර්වතාකාශ පෘථිවිසමුද්‍ර සහිතවූ; දශදිශඃ, දශදිගුන්; දර්ශයන්, දක්වන්නේ; දශඃ, දෘෂ්ටිය; දිශති, දේද; සදශශතදෘශි, සහස්‍රාක්‍ෂිගා සහිතවූ; මෛන්ද්‍රදෙශෙදෙශෙ, දෙවලොක ප්‍රදෙශයෙහි; යස්‍ය, යමක්හට; සාදෘශ්‍යං, සදෘශභාවයෙක්; නොදෘශ්‍යතෙ, නොදක්නාලැබේද; අශිවයුගදශා, අකල්‍යාණවූ කල්පාන්ත සඞ්ඛ්‍යාත අවස්ථායෙහි හෙවත් යුගාන්තකාලයෙහි; දර්ශිත, දක්වනලද; වාදශාත්මා, වාදශ ප්‍රභෙදස්වරූප ඇත්තේද; යස්‍ය, යමක්හුගේ; අතිශයාන්, චපලවූ; අශ්වාන්, අශ්වයන්; ආශයවිත්, අභිප්‍රායදන්නාවූ; දන්දශූකාසනාද්‍යඃ, ගරුඬාග්‍රජවූ අරුණතෙම; ශාස්ති, හික්මවාද හෙවත් වශයෙහි පිහිටුවාද; සඃ දීප්තාංශුඃ, ඒ තීක්‍ෂණ කිරණතෙම; වඃ, තොපට; ශම්, සැපයක්; දිශ්‍යාත්, ප්‍රදානයකෙරේවා.

( 95 )

තීර්ථානි ව්‍යර්ථකානි හ්‍රදනදසරසී නිර්ඣ
රාම්භොජිනීනාං
නොදන්වන්තොනුදන්ති ප්‍රතිභයමශුභං
ශ්වභ්‍රපාතානුබන්ධි,
ආපොනාකාපගායාමපි කලුෂමුෂෙ මජ්ජතාං
නෛව යත්‍ර
ත්‍රාතුං යාතෝ'න්‍යලොකං ස දිශතු දිවශස්‍යෛක
හෙතුර්හිතං වඃ

යත්‍ර, යම් සූර්‍ය්‍යයක්හු; අන්‍යලොකං, අනික් ලොව; ත්‍රාතුං, රක්ෂාකරණු පිණිස; යාතෙ, ගිය කල්හි; හ්‍රද, ගම්භිරජලාශය හෙවත් හෙබය; නද, ක්ෂුද්‍රස්‍රොතස; සරසි, මහවිල; නිර්ඣර, ප්‍රපාත ජලය හෙවත් හැලිය; අම්භොජිනීනාං, පද්මතටාකය යන මොවුන්ගේ; තීර්ථානි, ස්පර්ශපරිෂෙකාදි පරිභොගජලය; ව්‍යර්ථකානි, නිෂ්ඵලවෙද්ද; උදන්වන්තඃ, සමුද්‍රයෝ; ප්‍රතිභයං, භයඞ්කාරවූ; ශ්වභ්‍රපාතානුබන්ධි, නරක ප්‍රපාතයන්ට අනුගත වූ; අශුභං, පාපය; නොනුදන්ති, පහනොකෙරෙද්ද; නාකාපගායාමපි, දිව්‍යගඞ්ගාවෙහි පවා; ආපඃ, ජලයෝ; මජ්ජනාං, අවගාහනයකරන්නවුන්ගේ හෙවත් ස්නානයකරන්නවුන්ගේ; කලුෂමුෂෙ, පාපප්‍රහාණය පිණිස; නෛව, නොවන්නාහුද; දිවසස්‍ය, දිනයට; එකහෙතුඃ, අසහාය කාරණවූ; සඃ, ඒ ආදිත්‍යතෙම; වඃ, තොපට; හිතං, හිතසෞඛ්‍යකාරණය; දිශතු, දේවා

( 96 )

එතත් පාතාලපඞ්කප්ලුතමිව තමසෛවෙක
මුද්ගාඪමාසී
දප්‍රඥතාප්‍රතර්ක්‍යං නිරවගති තථාලක්ෂණං
සුප්තමන්තඃ,
යාදෘක් සෘෂ්ටෙඃ පුරස්තාන්නිශිනිශි නිඛිලං
ජායතෙ තාදෘගෙව
ත්‍රෛලොක්‍යං යද්වියොගා දවතු රවිරසෞ
සර්ගතුල්‍යොදයොවඃ

යද්වියොගාත්, යම් සූර්‍ය්‍යයක්හුගේ විප්‍රවාසය හෙතුකොටගෙණ; එතත් නිඛිලං ත්‍රෛලොක්‍යං, මේ සියලු ජගත්‍රය; පාතාලපඞ්කප්ලුතමිව, රසාතලයෙහි කර්දමයෙන් ව්‍යාප්තවූවාක්මෙන්; තමසා, අන්ධකාරයන්; උද්ගාඪමිව, වෙෂ්ටනයකරණලද්දක්මෙන්; එකං ආසීත්, කෙවලවීද;-හෙවත් ප්‍රාක්සෘෂ්ටෙඃ කෙවලාත්මනඃ යනුහෙයින් ප්‍රකෘතිසවභාවවූයේ; අප්‍රඥත, ප්‍රත්‍යක්ෂනුවූයේ ඥානයට ගොචරනුවූයේ; අප්‍රතර්ක්‍යං, එක ජල බින්දුවකින් සියලු සමුද්‍රයාගේ ලාවණ්‍යය කල්පනායමෙන් තර්කයට විෂයනුවූයේ-එහෙයින්ම; නිරවගති, දැනගත නොහැකිවූයේ; තථා, එසේම; අලක්ෂණං, පරිඥනයට චිහ්නයක් නැත්තේද; සුප්තමන්තඃ, අන්තර්ගතවූ නිද්‍රාඇත්තේද; සෘෂ්ටෙඃ, සෘෂ්ටියට; පුරස්තාත්, පූර්වභාගයෙහි; යාදෘක්, යම්බඳුද; නිශිනිශි, රාත්‍රියක් රාත්‍රියක් පාසා; තාදෘගෙවජායතෙ, එබඳුමවේද; එහෙයින්-සර්ගතුල්‍යොදයඃ, සෘෂ්ටිසමානවූ උදයඇති; අසෞරවිඃ, මේ සූර්‍ය්‍යතෙම; වඃ, තොප; අවතු, රක්ෂාකෙරේවා

අසිදිදන්තමොභූතමප්‍රඥත්මලක්ෂණම්
අප්‍රතර්ක්‍යමවිඥෙයං ප්‍රසුප්තමිව සර්වතඃ

යන සමෘති ග්‍රන්ථානුසාරයෙන් කියනලදී.

( 97 )

ද්වීපෙ යො'ස්තාචලො'ස්මින් භවති බලු ස
එවාපරත්‍රොදයාද්‍රිඃ
යා යාමින්‍යුජ්ජ්වලෙන්දුද්‍යුතිරිහ දිවසො'න්‍යත්‍ර
දීප්තාතපඃ සඃ,
යවශ්‍යෞ දෙශකාලාවිති නියමයතො නොභයං
දෙශකාලා
වව්‍යාත් ස සවප්‍රභුත්වාහිතභුවනහිතො හෙතු
රහ්නාම්නොවඃ

අස්මින්ද්වීපෙ, මේ ජම්බුද්වීපයෙහි; යොස්තාචලඃ, යම් අස්තපර්වතයෙක් ඇද්ද; සඃඑව, ඒ අස්තපර්වතයම; බලු, එකාන්තයෙන්; අපරත්‍ර, අපරද්වීපයෙහි; උදයාද්‍රිඃභවති, උදයපර්වත වන්නේය; ඉහ, මේ ජම්බුද්වීපයෙහි; උජ්ජ්වලෙන්දුද්‍යුතිඃ, ප්‍රකට චන්ද්‍රාතපයෙන් යුක්තවූ; යායාමිනී, යම් රාත්‍රියෙක් ඇද්ද; අන්‍යත්‍ර, අපරද්වීපයෙහි; දීප්තාතපඃ, දීප්ත ආතපයෙන් යුක්තවූ; සඃ, ඒතෙම; දිවසඃ, දිවාභාගයවන්නේය; ඉති, මේ උක්තප්‍රකාරයෙන්; දෙශකාලෞ, දෙශකාල දෙදෙනා; නියමයතඃ, වශයෙහි පවත්වන්නාහුගේ; දෙශකාලෞ, දෙශකාල දෙදෙන; යවශ්‍යෞ, යම් සූර්‍ය්‍යයක්හු වසයෙහි පවත්නාහුද; අයන්තු, මේ සූර්‍ය්‍යවනාහි;

නොදෙශකාලෞ, දෙශකාල වශගනොවන්නේ ය හෙවත් දෙශවශ්‍යත්වයෙන් නිර්ජලස්ථානයෙහි හිංසාවට පැමිනෙන ලිහිණියාමෙන්ද කාලවශ්‍යත්වයෙන් දහවල් කවුඩුවාගෙන් පීඩාලබන උලූකයාමෙන්ද දෙශකාල වශගනොවී ඒ දෙශකාල යන් තමා වශගයෙහි පවත්වන්නේය—මෙසේ සව ප්‍රභුත්ව, දෙශකාලාදි අන්‍යාපෙක්‍ෂාරහිතවූ ස්වකීය වූ ප්‍රභුත්වයෙන්ම—ආහිත, කරණලද; භුවනහිතඃ ලොකහිතය ඇත්තාවූ; අහ්නාම්, දිනයන්ට; හෙතුඃ, කාරණවූ; සඃඉනඃ, ඒ සූර්‍ය්‍යභගවත්තෙම; වඃ, තොප; අව්‍යාත්, රක්‍ෂාකෙරේවා.

( 98 )

ව්‍යග්‍රෙරග්‍රග්‍රහෙන්දුග්‍රසනගුරුභරෙරර්නා
සමග්‍රෙරුදග්‍රෙඃ
ප්‍රත්‍යග්‍රෙරීෂදුග්‍රෙ රුදයගිරිගතො
ගොගණෛර්ගොධයන් ගාම්,
උද්ගාඪාර්චිර්විලීනා මමරනගනගග්‍රාවගර්භාම්
වාත්නා
මග්‍රෙ'ග්‍රෙ යොවිධතෙත ග්ලපයතු ගහනං ස
ග්‍රහග්‍රාමණීඃ.

යඃ, යම් සූර්‍ය්‍යයෙක්තෙම; අහ්නාං, දිනයන් ගේ; අග්‍රෙඅග්‍රෙ, ප්‍රාරම්භයක් ප්‍රාරම්භයක් පාසා; උදයගිරිගතඃ, උදයපර්වත මස්තකයට පැමිනියේ; අග්‍රග්‍රහෙන්දුග්‍රසනගුරුභරෛඃ—අග්‍රග්‍රහ, බුධාදිමුඛ්‍ය ග්‍රහයෝය; ඉන්දු, චන්ද්‍රය යන මොවුන්ගේ; ග්‍රසන, අභිභවයයි කියනලද; ගුරුභරෛඃ, ගුරුවූ කාර්‍ය්‍යභාරයෙන්; ව්‍යග්‍රෙඃ; කාර්‍ය්‍යපරවශවූ; නාසමග්‍රෙඃ, අසම්පූර්ණ නොවන්නාවූ හෙවත් සම්පූර්ණවූ; උදග්‍රෙඃ, උන්නතවූ; ඊෂත් උග්‍රෙඃ, මඳක් තීක්‍ෂණවූ; ප්‍රත්‍යග්‍රෙ; අභිනවවූ; ගොගණෛඃ, රශ්මිසමූහයෙන්; අමරනගනගග්‍රාවගර්භාං—අමරනග, දෙවාධිෂ්ඨානවූ මෙරුපර්වතය; නග, වෘක්‍ෂයෝය; ග්‍රාව, පාෂාණය යන මොවුන්; ගර්භාං, ගර්භකොටඇති; ගාම්, පොළොව; ගොධයන්, වෙෂ්ටනය කෙරෙමින්; උද්ගාඪාර්චිර්විලීනාම්ව, තීව්‍රරශ්මියෙන් ද්‍රවවූවාක්මෙන්; විධුතෙන, කෙරේද; සඃ ග්‍රහග්‍රාමණීඃ, ඒ ග්‍රහසමූහ නායකතෙම; වඃ, තොපගේ; ගහනං, මොහය; ග්ලපයතු, ක්‍ෂයකෙරේවා.

( 99 )

යොනිඃ සාම්නාං විධාතා මධුරිපුරජිතො
ධූර්ජටිඃ ශඞ්කරො'සෞ
මෘත්‍යුඃ කාලො'ලකායාඃ පතිරපි ධනදඃ
පාවකො ජාතවෙදාඃ,
ඉත්ථං සංඥා ඩවිත්ථාදිවදමෘතභුජාං යා යදෘ
ච්ඡාප්‍රවෘත්තාස්
තාසාමෙකො'භිධෙයඃ තදනුගුණගණෛර්යඃ
ස සූර්‍ය්‍යො වතාවඃ.

විධාතා, සම්නාං යොනිරුදිත්‍ය උච්‍යතෙ යනු හෙයින් සාමවෙදයට කාරණනොවන බ්‍රහ්මතෙම; සාම්නාං, සාමගීතීන්ට යොනිඃ, උත්පත්තිස්ථානයයි කියාද; මධුරිපුඃ; ජරාසන්ධප්‍රභෘතීන් විසින් අභිභූතවූ වාසුදෙවතෙම; අජිතඃ, කිසිවක් හු විසින් නොමඩනාලද කාරණයෙන් අජිතයයි කියාද; අසෞධූර්ජටිඃ, ප්‍රත්‍යක්‍ෂයෙන් කිසිවක් හට සැපයක් නුදුන් මේ ඊශ්වරතෙම; ශඞ්කරඃ; සෞඛ්‍යකාරක හෙයින් ශඞ්කරනමැයි කියාද; මෘත්‍යුඃ, සූර්‍ය්‍යමෙන් නිමෙෂාහොරාත්‍රාදි ලක්‍ෂණ කාලයට කාරණ නොවන්නාවූ අන්තකතෙම; කාලඃ, කාලනමැයි කියාද; අලකායාඃ පතිරපි, කවරක්හටත් කිසිවක් නොදෙන අලකාධිපතිවූ වෛශ්‍රවණද; ධනදඃ, ධනදාන නිමිත්තෙන් ධනද නමැයි කියාද; ජාතවෙදාඃ, කිසිවක් පවිත්‍ර නොකරණ වහ්නිතෙම; පාවකඃ, පවිත්‍රකරණාර්ථයෙන් පාවකනමැයි කියාද; ඉත්ථං, මේ උක්තප්‍රකාරයෙන්; අමෘතභුජාං, බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර යම වෛශ්‍රවණ වහ්නි යන දෙවියන්ට; ඩවිත්ථාදිවත්, ඩවිත්ථය ඩිත්ථය යනාදි ප්‍රවෘත්ති නිමිත්ත නිරපෙක්‍ෂවූ රූඪිසංඥාවන්මෙන්; යදෘච්ඡාප්‍රවෘත්තාඃ, කාමාචාරයෙන් ප්‍රවෘත්තවූ; යාඃසංඥාඃ, යම් සංඥාකෙනෙක් ඇද්ද; තාසාං, ඒ සංඥාවන්ට; එකඃ, කෙවලවූ; යඃ, යම් සූර්‍ය්‍යයෙක්; තදනුගුණගණෛඃ, ඒ සංඥානුරූප ගුණයන් හෙතුකොට ගෙණ හෙවත් අර්ථානුගත සංඥාවසයෙන්; අභිධෙයඃ, වාච්‍යවේද; සඃසූර්‍ය්‍යඃ, ඒ සූර්‍ය්‍යභගවත් තෙම; වඃ, තොප; අවතාත්, රක්‍ෂාකෙරේවා.

( 100 )

දෙවඃ කිං බාන්ධවඃ ස්‍යාත් ප්‍රියසුහෘදථවාචාර්‍ය්‍ය
ආහොස්විදාර්‍ය්‍යො
රක්‍ෂා චක්‍ෂුර්නු දීපො ගුරුරුත ජනකො
ජීවිතං බීජමොජඃ,
එවං නිර්ණියතෙ යඃ කඉති නජගතාං
සර්වථා සර්වදාසෞ
සර්වාකාරොපකාරී දිශතු දශශතාභී
ශුරභ්‍යර්චිතං වඃ.

**දෙවඃ කිම්, දෙවියෙක්දෝහෝ**; බාන්ධවඃස්‍යාත්, **බන්ධුකාර්‍ය්‍යකරණ හෙයින් ඥාතිකෙනෙක්දෝහෝ; අථවා, නොහොත්; ප්‍රියසුහෘද්, ඉෂ්ටමිත්‍රයෙක්දෝහෝ; ආහොස්විත්, නොහොත්**; ආචාර්‍ය්‍යඃ, **ලොවට ගුරුකෙනෙක්දෝහෝ**; **ආර්‍ය්‍යඃ, ස්වාමියෙක්දෝහෝ**; රක්ෂා, **ගුප්තියක්දෝහෝ; චක්ෂුඃ නු, ජගත්‍රයට නෙත්‍රයෙක්දෝහෝ; දීපඃ, ආලෝකයෙක්දෝහෝ**; උත, නැවත; ගුරුඃ උපාධ්‍යායයෙක්දෝහෝ; ජනකඃ, පිතෘභූතයෙක්දෝහෝ; ජීවිතං, ප්‍රාණයෙක්දෝහෝ; බීජං, ඵලහෙතුයෙක්දෝහෝ; ඕජඃ, ශක්තියෙක්දෝහෝ; කඃඉති, කවරෙක්දෝහෝයි; එවං, මෙපරිද්දෙන්; ජගතාං, ජගත්‍රයවාසීන් විසින්; යඃ, යමෙක්තෙම; නනිර්ණීයතෙ, නිශ්චයකටහැකිනොවේද; සර්‍වථා, සර්‍වප්‍රකාරයෙන්; සර්‍වදා, හැමකල්හි; සර්‍වාකාරොපකාරී, සර්‍වාකාරයෙන් ලොකොපකාර කරණ සුළුවූ; අෂ්ටාදශශතාභීෂුඃ, මේ සහස්‍රකිරණතෙම; වඃ, තොපට; අභ්‍යර්ථිතං, අභිමතාර්‍ථය; දිශතු, ප්‍රදානය කෙරේවා සූර්‍ය්‍යවර්ණනායි

**සූර්‍ය්‍යශතකම් සමාප්තම්**

---

**ඕංනමඃ ත්‍රිභුවනෛක චක්ෂුෂෙ සූර්‍ය්‍යාය.**

**ශ්ලොකාලොකස්‍ය භූත්‍යෛ ශතමිති රචිතාඃ**
**ශ්‍රීමයූරෙණ භක්ත්‍යා**
**නිත්‍යං යෙ චෛතාන් පඨෙද්ධඃ සකෘදපි පුරුෂඃ**
**සර්‍වපාපෛර්විමුක්තඃ,**
**ආරොග්‍යං සත්කවිත්වං මතිබලමතුලං කාන්ති**
**මායුඃප්‍රකර්ෂං**
**විද්‍යාමෛශ්වර්‍ය්‍යමර්ථං සුකෘතමපි සදෙයාත්**
**ස සූර්‍ය්‍යප්‍රසාදත්**

ඉති, මෙසේ; ශ්‍රීමයූරේණ, ශ්‍රීමත්වූ මයූරනම් මහකවිහු විසින්; ලොකස්‍ය, සර්‍වලොකයාහට; භූත්‍යෛ, ඓශ්වර්‍ය්‍ය පිණිස; ශතං, ශතසංඛ්‍යා පරිමිතවූ; ශ්ලොකාඃ, ශ්ලොකයෝ හෙවත් සියයක් පමණ ශ්ලොකයෝ; රචිතාඃ, රචනාකරණ ලද්දාහ; එතාන්, මේ ශ්ලොකයන්; යඃපුරුෂඃ, යම් පුරුෂයෙක්; සර්‍වපාපෛර්විමුක්තඃ, සකල දුශ්චරිත නිගමයෙන් නිර්මලවූයේ; නිත්‍යං, අනවරතයෙන් හෙවත් දවස්පතා; සකෘදපි, එකවරෙකවී නමුත්; භක්ත්‍යා, ආදරයෙන්; පඨෙත්, හදාරද හෙවත් උච්චාරණය කෙරේද; සඃ, එතෙම, සූර්‍ය්‍යප්‍රසාදත්, ස්තොත්‍රකරණලද සූර්‍ය්‍යභගවත්හුගේ ප්‍රසාදය හෙතුකොටගෙණ; සදා, හැමකල්ම; ආරොග්‍යං, නිරොගී බවටද; සත්කවිත්වං, ශොභනවූ කවිත්වයටද; අතුලං, අසදෘශවූ; මතිබලං, ප්‍රඥාශක්තියටද; කාන්තිං, ශරීරකාන්තියටද; ආයුඃප්‍රකර්ෂං, ආයුෂයාගේ උත්කර්ෂයටද; විද්‍යාං, ශාස්ත්‍රපරිඥානයටද; ඓශ්වර්‍ය්‍යං, සම්පත්තියටද; අර්ථං, ධනලාභයටද; සුකෘතමපි, කුශලවර්ධනයටද; ඊයාත්, පැමිනෙන්නේයි

චත්වාරිංශත් ප්‍රභායාස්ත්‍රිභිරධිකමථො වාජිනාං
ෂට්කමෙකං
පශ්චාන්නෙතුර්විෂට්කං දශසහිතමථස්‍යන්ද
නස්‍යෛකමුක්තං,
භූයො'ෂ්ටෞ මණ්ඩලස්‍ය ස්තුතිරපිච රවෙර්විංශතිඃ
ශ්‍රීමයූරෙ
ණොක්තං ශශ්වත් පඨෙද්‍යඃ ශතක මනුදිනං
සූර්‍ය්‍යසායුජ්‍යමෙති

ප්‍රභායාඃ, රශ්මිහුගේ; ස්තුතිඃ, ස්තොත්‍රපද්‍ය; ත්‍රිභිරධිකං, තුනකින් අධිකවූ; චත්වාරිංශත්, සතළිසෙක; අථො, නැවත; වාජිනාං, අශ්වයන්ගේ ස්තොත්‍රපද්‍ය; එකංෂට්කං, එක්ෂට්කයෙක; අථ, නැවත; පශ්චාත්, ඊට පසුව; නෙතුඃ, රථාචාර්‍ය්‍යයාගේ ස්තොත්‍රපද්‍ය; විෂට්කං, විෂට්කයෙක; අථ, නැවත; ස්‍යන්දනස්‍ය, රථයාගේ ස්තොත්‍රපද්‍ය; දශසහිතං, දශයකින් යුක්තවූ; එකං, එකෙක; භූයඃ, නැවත, මණ්ඩලස්‍ය, බිම්බයාගේ ස්තොත්‍රපද්‍ය; අෂ්ටෞ, අටෙක; අපිච, තවද; රවෙඃ, හිරුගේ; ස්තුතිඃ, ස්තොත්‍රපද්‍ය; විංශතිඃ, විස්සෙකැයි; ඉත්ථං, මෙසේ; ශ්‍රීමයූරෙණ, ශ්‍රීමත්වූ මයූරනම් මහකවිහු විසින්; උක්තං, විරචිතවූ; ශතකං, සොලෝ සියය හෙවත් මේ සූර්‍ය්‍යශතකය; යඃ, යමෙක්තෙම; අනුදිනං, දවසක් දවසක් පාසා; ශශ්වත්, එකාවන්ව; පඨෙත්, කියන්නේවීනම්; සඃ, ඒතෙම; සූර්‍ය්‍යසායුජ්‍යං, සූර්‍ය්‍යභගවත්හු සභාවයට; එති, පැමිනෙන්නේයි

ෂඩ් භාෂා පරමෙශ්වර ත්‍රිපිටකවාගීශ්වර ශ්‍රීරාජගුරු ගලතුරුමූල මහා ස්වාමිපාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍යවූ ශ්‍රීපරාක්‍රමබාහු විල්ගම්මූල මහාථෙර ස්වාමීන් විසින් පළමු මයූරනම් මහාකවිහු විසින් කළ සූර්‍ය්‍යස්තොත්‍ර ශතකයට අමුතුකල අර්ථ ව්‍යාඛ්‍යානයයි සිද්ධිරස්තු ශුභමස්තු ආරොග්‍යමස්තු